


# අන්තර්ජාතික මානුෂවාදී නීතිය

## ඔබේ පැනයන්ට විසඳුම්

ICRC

# අන්තර්ජාතික මානුෂවාදී නීතිය

**ඔබේ පැනයන්ට විසඳුම්**

1. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු කුමක්ද?....4
2. යුද වැදීමේ අයිතිය (jus ad bellum) සහ යුද නීතිය (jus in bello) යනු කුමක්ද?.... 8
3. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ප්‍රභවයන් මොනවාද? ....11
4. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සකස්වන්නේ කුමන ගිවිසුම් මත ද? චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය .... යනු කුමක්ද?....14
5. අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ වන්නේ කුමන අවස්ථාවේදීද?.... 18
6. ජිනීවා සම්මුතීන් සහ ඒවායේ අතිරේක සන්ධාන යනු මොනවාද?....22
7. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ආරක්ෂා කරන්නේ කාවද?.... 26
8. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් බැඳෙන්නේ කවුරුන්ද?....31
9. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය අතර වෙනස කුමක්ද? .... 35
10. නිදහස අහිමි කිරීම සම්බන්ධව අන්තර්ජාතික මානුෂවාදී නීතිය දරන අදහස කුමක්ද?.... 42
11. එදිරිවාදීකම් සඳහා බලපැවැත්වෙන ප්‍රධාන අන්තර්ජාතික මානුෂවාදී නීති මොනවාද?.... 46
12. යුද විධික්‍රම සහ ආකාර අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් නියාමනය කරනුයේ කෙසේද? .... 50
13. ලාංඡන භාවිතය සහ ඒවායේ ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විධිවිධාන .... මොනවාද? .... 55
14. අතුරුදහන් වූ පුද්ගලයින් සහ පවුල් සබඳතා යථාවත් කිරීම සම්බන්ධව අන්තර්ජාතික මානුෂවාදී නීතිය කියන්නේ .... කුමක්ද?.... 59
15. මානුෂවාදී ප්‍රවේශය සහ සහය සැපයීමට අදාළව අන්තර්ජාතික මානුෂවාදී නීතියේ දැක්වෙන්නේ මොනවාද?.... 64
16. අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් සරණාගතයින් සහ අභ්‍යන්තරව අවතැන්වූවන් ආරක්ෂා කරන්නේ.... කෙසේද?.... 68
17. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ කිනම් වස්තූන් විශේෂයෙන් ආරක්ෂිතද?....72
18. ත්‍රස්තවාදය සම්බන්ධයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය කුමක් කියන්නේද?.... 80
19. අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාවට නැංවෙන්නේ කෙසේද? .... 84
20. අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ගරුත්වය වර්ධනය කිරීම සහ සුරක්ෂිත කිරීමට අදාළව ජාත්‍යන්තර රතු .... කුරුස කමිටුවේ කාර්යභාර්ය කුමක්ද? .... 88
21. සැකකාර යුද අපරාධකරුවන්ට එරෙහිව ජාත්‍යන්තර නීතිය යටතේ නඩු පැවරීම සිදු වන්නේ කෙසේද?.... 93

“සටන් බිම තුළදී තුවාල ලත් යුද හටයින්ගේ තත්වය වැඩි දියුණු කිරීම සඳහා” වන මුල් ජිනීවා සම්මුතිය 1864 දී සම්මත කරන ලද අතර, එමඟින් නූතන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ආරම්භය සනිටුහන් විය. එයට පසුව තවත් බොහෝ ගිවිසුම් නිර්මාණය වූ අතර එකී සෑම ගිවිසුමක්ම ජීවිත සහ මානව ගරුත්වය ආරක්ෂා කිරීම පිණිස සියල්ලන් විසින් ගරු කළ යුතු යම් නිශ්චිත සීමාවන් තුළ යුද්ධය පැවතිය යුතුය යන ප්‍රධාන මූලධර්මය මත ගැබ්ව පවතී.

අවුරුදු 150 කට පෙර සිදු කළ මුල් ජිනීවා සම්මුතිය සම්මත කිරීමේ පටන් හඳුනාගත නොහැකි පරිද්දෙන් යුද කටයුතු වල ස්වභාවය වෙනස් වී තිබේ. දැන් වන විට බොහෝ තත්කාලීන සන්නද්ධ ගැටුම් රාජ්‍යයන් අතර නොව රාජ්‍යයන් තුළින් හටගනී. යුද විධික්‍රම සහ ආකාර අපගේ මුතුන්මිත්තන්ට යන්තමින් හෝ සිතා ගත නොහැකි පරිද්දෙන් අතිශය සංකීර්ණ වී ඇති අතර, ඩ්‍රෝන වැනි මිනිස් මැදිහත්වීම අනවශ්‍ය ආයුධ භාවිතය ඊට කදිම නිදසුනකි. මෙකී සියලු වෙනස්වීම් හමුවේ අන්තර්ජාතික මානුෂවාදී නීතිය යාවත්කාලීන වී ඇත්ද? යන්න ඇසිය යුතු සාධාරණ පැනයකි.

අපගේ පිළිතුර නම් එය යාවත්කාලීන වී ඇති බවයි. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ කේන්ද්‍රීය මූලධර්මයන්ගේ අදාළත්වය අදටත් බිඳකුදු නොනැසී පැවතෙමින්, සන්නද්ධ ගැටුම්වල සිදු වූ වර්ධනයන්ට ප්‍රතිචාර ලෙස අන්තර්ජාතික මානුෂවාදී නීතිය සැබවින්ම ක්‍රමිකව විකාශනය වී ඇති අතර, ඉදිරියටත් එලෙසින්ම වනු ඇත. අන්තර්ජාතික මානුෂවාදී නීතිය ශක්තිමත් කිරීමෙහිලා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව පසුගිය වසර 150 ක කාලය මුළුල්ලේ සක්‍රියව සම්බන්ධ වෙමින් එය යාවත්කාලීනව පවත්වා ගනියි.

කෙසේ නමුදු, සන්නද්ධ ගැටුම් විසින් සිවිල් වැසියන්ට දරුණු දුක් පීඩා ඉතිරි කරමින් නිරන්තරව කම්පාකරවන සුළු මානව පිරිවැයක් හිමි කරයි යන කරුණින් පලා යා නොහැක.

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සැබෑ පරීක්ෂාව වනුයේ සටන්කරුවන් සහ ඔවුනට අණ දෙන්නන් විසින් මානුෂවාදී නීති හා අනුගත වන්නේද යන්නයි. මහත් පරිශ්‍රමයකින් යුතුව ප්‍රයත්න දරමින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය උදෙසා වඩා උසස් ගරුත්වයක් අත්කර ගැනීමටත් එය ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මකව සහ බලාත්මකව ඇති බව තහවුරු කරගැනීමටත් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව කටයුතු කරන්නේ එනිසාවෙනි. අවසානයට අවශ්‍ය වනුයේ මානුෂීය හෝ නෛතික ක්‍රියාකාරීත්වයට එහා ගිය, සිවිල් ජනයා ආරක්ෂා කිරීමටත් අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීමටත් ඇති දේශපාලන අධිෂ්ඨානයයි.



පීටර් මෞර්

සභාපති, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව




# 1. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු කුමක්ද?

අන්තර්ජාතික මානුෂවාදී නීතිය (IHL) විසින් රාජ්‍යයන්, අන්තර්ජාතික සංවිධාන සහ අන්තර්ජාතික නීතියේ අනෙකුත් කාරකයින් අතර සබඳතා නියාමනය කරයි. එය, සන්නද්ධ ගැටුම් පවතින අවස්ථා වලදී මානුෂිය හේතූන් උදෙසා, ඍජුව සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් නොවදින පුද්ගලයින් ආරක්ෂා කිරීම සහ යුද විධික්‍රම සහ ආකාර සීමා කිරීම අරමුණු කොටගත් නීති වලින් සමන්විත පොදු අන්තර්ජාතික නීතියේ ශාඛාවකි. වෙනත් ලෙසකින් දක්වන්නේ නම්, අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමකින් ඍජුවම පැන නඟින මානුෂීය ගැටළු නිරාකරණය කිරීම සඳහා විශේෂයෙන් අදහස් කරන ලද අන්තර්ජාතික ගිවිසුමකින් හෝ චාරිත්‍රානුකූල රීතීන්ගෙන් (එනම්, රාජ්‍ය පරිචය තුළින් මතු වූ, බැඳීමක් ලෙසින් අනුගමනය කරන ලද නීතින්) අන්තර්ජාතික මානුෂවාදී නීතිය සමන්විත වේ.




ICRC

## පාරිභාෂික පද

'අන්තර්ජාතික මානුෂවාදී නීතිය', 'සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය' සහ 'යුද නීතිය' යන යෙදුම් සමානාර්ථ පද ලෙස සලකනු ලැබේ. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, අන්තර්ජාතික සංවිධාන, විශ්ව විද්‍යාල සහ රාජ්‍යයන් 'අන්තර්ජාතික මානුෂවාදී නීතිය' (හෝ 'මානුෂවාදී නීතිය') යන යෙදුමට වැඩි රුචිකත්වයක් දක්වයි.

## ජිනීවා සහ හේග්

ජාත්‍යන්තර මානුෂවාදී නීතියට ශාඛා දෙකක් තිබේ:

- තවදුරටත් සටන් වැදිය නොහැකි (hors de combat) යුද සෙබළුන් සහ එදිරිවාදිකම් සඳහා ඍජුව සහභාගි නොවන හෝ තවදුරටත් සහභාගි නොවන සිවිල් වැසියන් වැනි සන්නද්ධ ගැටුම් වල වින්දිතයින්ව ආරක්ෂා කරන ලබන නීති පද්ධතිය වන 'ජිනීවා නීතිය'
- යුදමය තත්වයකදී සතුරු පාර්ශවයන්ගේ අයිතීන් සහ බැඳීම් මෙන්ම යුද විධික්‍රම සහ ආකාර කුමක් මඟින් සීමා වන්නේද යන්න ස්ථාපනය කරනු ලබන 'හේග් නීතිය'

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ මෙම ශාඛාවන් සඳහා වන නාමයන් ලැබෙනුයේ ඒවා ආරම්භක වශයෙන් සංග්‍රහ ගත කිරීම සිදු කරනු ලැබූ නගර වලිනි. මෙකී ශාඛා දෙක ඒකාබද්ධ කරනු ලැබූ ජිනීවා සම්මුතියට අතිරේකව එකතු කළ 1977 ජුනි 8 සන්ධාන මඟින් එකී ශාඛා ද්විත්වයෙහි වෙනස ඓතිහාසික සහ ශාස්ත්‍රාලීය වටිනාමක් ඇති කරුණක් බවට පත් කෙරිණි.

## යුදමය අවශ්‍යතාව සහ මනුෂ්‍යත්වය

අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු මනුෂ්‍යත්වය සහ යුදමය අවශ්‍යතාව යන ප්‍රධාන මූලධර්මයන් දෙක අතර ඇති සම්මුතියයි. මෙම මූලධර්මයන් ද්විත්වය විසින් ඒවායේ නීති සියල්ලක්ම හැඩ ගස්වනු ලබයි.

යුදමය අවශ්‍යතාවය පිළිබඳ මූලධර්මය මඟින් ගැටුමක සුජාත අරමුණ අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය වන බලයේ ප්‍රමාණය සහ බලයේ වර්ගය සඳහා පමණක් ඉඩ ලබා දේ. එනම්, අවම ජීවිත සහ සම්පත් පිරිවැයක් සහිතව හැකි ඉක්මන්ම මොහොතේදී සතුරාව සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් යටත් කරගැනීමයි. කෙසේ නමුදු, එමඟින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය තහනම් කරනු ලබන පියවරයන් ගැනීම සඳහා ඉඩ නොතබයි. මනුෂ්‍යත්වය පිළිබඳ මූලධර්මය මඟින් ගැටුමක සුජාත අරමුණ අත්පත් කරගැනීමට අවශ්‍ය නොවන සියලු ආකාරයේ පීඩා, හානි සහ විනාශයන් යනාදී සියල්ල තහනම් කරයි.

*"යුද්ධය යනු කිසිසේත් මිනිසා සහ මිනිසා අතර සබඳතාවයක් නොවේ. එය, රාජ්‍යයන් අතර සබඳතාවයකි. එහිදී, පුද්ගලයින් සතුරන් බවට පත්වන්නේ අහම්භයකින් පමණි.  ඒ මිනිසුන් ලෙසින්, පුරවැසියන් ලෙසින් හෝ නොව යුද සෙබළුන් ලෙසිනි......*

*යුද්ධයක අරමුණ සතුරු රාජ්‍ය විනාශ කිරීම නිසාම, සතුරු රාජ්‍ය ආරක්ෂකයින් අවි දරාගෙන සිටින තාක් ඔවුන්ව ඝාතනය කිරීම සුජාත වේ;*

*නමුදු, ඔවුහු අවි බිම තබා යටත් වූ වහාම, ඔවුහු සතුරන් හෝ සතුරන්ගේ නියෝජිතයින් හෝ වීම අවසන් වී හුදු මිනිසුන් බවට පත්වෙති. එවිට තවදුරටත් ඔවුනගේ ජීවිත අහිමි කිරීම සුජාත නොවනු ඇත."*

ජොන්-ජාක් රූසෝ, 1762

## අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අතිශය වැදගත් රීතීන්

ගැටුමක පාර්ශවයන් විසින් සිවිල් ජනගහනය සහ සිවිල් වැසියන්ගේ දේපළ නිරුපද්‍රිතව තබා ගැනීම සඳහා සෑම කල්හිම සිවිල් වැසියන් සහ සටන්කරුවන් පැහැදිලිව වෙන් කොට හඳුනා ගත යුතුය. සිවිල් ජනගහනය සමස්තයක් වශයෙන් හෝ සිවිල් වැසියන් තනි පුද්ගලයින් ලෙස හෝ ප්‍රහාරයට ලක් නොවිය යුතු වේ. ප්‍රහාරයන් මුළුමනින්ම පාහේ යුද අරමුණු ඉලක්ක කර එල්ල කළ හැකිය. ගැටුමක පාර්ශවයන්හට යුද විධික්‍රම සහ ආකාර තෝරා ගැනීම සඳහා සීමාවිරහිත අයිතිවාසිකමක් නොපවතී. භාවිතය මඟින් අධිකතර හානි හෝ අනවශ්‍ය දුක්පීඩා සිදු වීමට වැඩි ඉඩක් ඇති අවිචාරවත් යුද විධික්‍රම හෝ ආයුධ භාවිතය තහනම්ය.

යටත් වන හෝ තවදුරටත් යුද වැදිය නොහැකි සතුරු යුද භටයෙකු තුවාල කිරීම හෝ ඝාතනය කිරීම තහනම්ය. සටන් නොවදින හෝ තවදුරටත් සටන් වැදිය නොහැකි පුද්ගලයින් ඔවුනගේ ජීවිත මෙන්ම ඔවුනගේ ශාරීරික සහ මානසික අඛණ්ඩතාවය වෙනුවෙන් ගරුත්වය සඳහා හිමිකම් කියයි. කිසිදු අගතිගාමී වෙනස් කොට සැලකීමක් හෝ එවැනි කිසිවකින් තොරව එකී මිනිසුන් සෑම අවස්ථානුගත අවස්ථාවකදීම ආරක්ෂා කළ යුතු සේම ඔවුනට මානුෂීයව සැලකිය යුතුය. ඉඩ ලද වහාම තුවාල වූවන් සහ රෝගී වූවන් සෙවීම,

එක්රැස් කරගැනීම සහ ඔවුන්ට රැකවරණය සැපයීම සිදු කළ යුතුය. වෛද්‍ය නිලධාරීන් සහ වෛද්‍ය ඒකකයන්, ප්‍රවාහනයන් සහ උපකරණ ඉලක්ක ගත නොකළ යුතුය. සුදු පැහැති පසුබිමක ඇති රතු කුරුසය, රතු අඩසඳ හෝ රතු පළිඟුව යනු එකී පුද්ගලයින් සහ වස්තූන් ආරක්ෂා කළ යුතු බව දක්වන සුවිශේෂී ලකුණයි.

සතුරු ග්‍රහණයට හසු වූ සටන්කරුවන්ගේ සහ සිවිල් වැසියන්ගේ ජීවිත, ඔවුනගේ පෞද්ගලික අයිතීන් මෙන්ම ඔවුනගේ දේශපාලනික, ආගමික සහ අනෙකුත් ඇදහීම් වලට ගරු කිරීමට වගකීමක් ඇත්තේය. සියලුම ප්‍රචණ්ඩ ක්‍රියා සහ පළිගැනීම් වලින් ඔවුන්ව ආරක්ෂා කළ යුතුය. සිය පවුලේ සාමාජිකයින් සමඟ තොරතුරු හුවමාරු කරගැනීමටත් ආධාර ලැබීමටත් ඔවුන් හිමිකම් කියයි. ඔවුනට එරෙහි ඕනෑම අපරාධ නඩු කටයුත්තක දී ඔවුනගේ මූලික අධිකරණමය සුරක්ෂාවන්ට ගරු කළ යුතුය.

ඉහතින් සාරාංශ ගත කරන ලද රීතින් මඟින් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සාරය විදහා දක්වයි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම පහසු කිරීම පිණිස මෙම ආකෘතිය යටතේ එකී රීතීන් හැඩගස්වයි. මෙම සංස්කරණයට නෛතික ලේඛනයක් සතු අධිකාරි බලයක් නොමැති අතර මෙමඟින් දැනට බලාත්මකව පවතින ගිවිසුම් කිසිදු අයුරකින් ප්‍රතිස්ථාපනය කිරීමට ප්‍රයත්න නොදරයි.

> ***"ස්ථාපිත චාරිත්‍ර තුළින්, මනුෂ්‍යත්වය පිළිබඳ මූලධර්ම තුළින් සහ මහජන හෘද සාක්ෂිය මත ගොඩ නැගුණු නියමයන් තුළින් පැන නැඟි ජාත්‍යන්තර නීතියේ මූලධර්මයන්ගේ ආරක්ෂාව සහ අධිකාරිය යටතේ සිවිල් වැසියන් සහ යුද භටයින් රඳා පවතියි."***
>
> **ෆියොදෝර් මාටින්ස්, 1899**
>
> මාටීනියානු නියමය ලෙස හඳුන්වන ඉහත ප්‍රකාශය, ගොඩබිම තුළ සිදු කෙරෙන යුද්ධයන්ට අදාළ නීති සහ චාරිත්‍ර පිළිබඳ 1899 (දෙවන) හේග් සම්මුතියෙහි පූර්විකාව තුළ පළමුව දක්නට ලැබිණි. එය පොළඹවනු ලැබුවේ සහ එයට එහි නාමය හිමිවූයේ 1899 හේග් සාම සමුළු සඳහා රුසියානු නියෝජිතයාවූ මහාචාර්ය ෆියොදෝර් ෆිදොරොවිච් මාටීන්ස්ගෙනි. මාටීනියානු නියමයෙහි නියම තේරුම ප්‍රශ්නසහගත වුවද සාමාන්‍යයෙන් එය අර්ථකථනය කර ඇත්තේ මෙලෙසය: 'ජාත්‍යන්තර මානුෂවාදී නීතිය මඟින් නිශ්චිත ලෙස තහනම් කර නොමැති කිසිවකට ඉබේ අවසර නොලැබේ'. යුද වැදෙන පාර්ශව සෑම විටම සිහි තබා ගත යුතු වන්නේ ඔවුනගේ ක්‍රියාවන් මනුෂ්‍යත්වය පිළිබඳ මූලධර්ම සහ මහජන හෘද සාක්ෂිය මත ගොඩ නැගුණු නියමයන්ට අනුකූලව පවත්වා ගත යුතු බවයි.



ICRC

## 2. යුද වැදීමේ අයිතිය (jus ad bellum) සහ යුද නීතිය (jus in bello) යනු කුමක්ද?

රාජ්‍යයන් විසින් කුමන කොන්දේසි යටතේ යුද්ධයට අවතීර්ණ වන්නේද හෝ සාමාන්‍ය ලෙස ගත් කල්හි සන්නද්ධ බලය කුමන කොන්දේසි යටතේ යොදාගන්නේද යන්න jus ad bellum මඟින් දක්වයි. 1945 එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය තුළ දක්වා ඇති, රාජ්‍යයන් අතර බලය යෙදවීමට එරෙහිව ඇති තහනම සහ ඊට ඇති ව්‍යතිරේකයන් (ආත්ම ආරක්ෂාව සහ බලය යෙදවීම සඳහා එක්සත් ජාතීන්ගේ අනුමැතිය) jus ad bellum හි ප්‍රධාන සංඝටකයන් වේ. ("යුද්ධයට එරෙහි තහනම සම්බන්ධයෙන්" මැයෙන් ඇති කොටුව බලන්න).

jus in bello මඟින් සන්නද්ධ ගැටුමකට සහභාගි වී ඇති පාර්ශවයන්ගේ ක්‍රියාකලාපය නියාමනය කරයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය, jus in bello හා සමාන අර්ථ දේ; එමඟින්, විශේෂයෙන්ම, හැකි උපරිම අයුරින් සන්නද්ධ ගැටුමෙහි සෑම වින්දිතයෙකුම ආරක්ෂා කරමින් සහ ඔවුනට සහය ලබා දෙමින් සන්නද්ධ ගැටුම් තුළ හටගන්නා පීඩාවන් අවම කිරීමට උත්සහ දරයි. ගැටුමට පාදක වූ හේතු හෝ සටන් වදින අභිප්‍රායන්හි සාධාරණත්වය

හෝ නොතකා අන්තර්ජාතික මානුෂවාදී නීතිය යුද්ධයට අවතීර්ණ වී සිටින පාර්ශවයන් කෙරෙහි බලපායි. මක්නිසාදයත්, එය එසේ නොවුවහොත්, සෑම පාර්ශවයක්ම එවිට තමන් ගැටුමෙහි වින්දිතයෙකි යන්න ප්‍රකාශ කළ හැකි හෙයින් නීතිය ක්‍රියාත්මක කිරීම සිදුකල නොහැකි දෙයක් වනු ඇත. තවද, අන්තර්ජාතික නීතිය වනාහි පාර්ශවයන්ගේ සම්බන්ධය නොතකා සන්නද්ධ ගැටුමෙහි වින්දිතයින් ආරක්ෂා කරගැනීමට අරමුණු කරගත්තකි. jus ad bellum ගෙන් jus in bello ස්වාධීනව පැවතිය යුත්තේ එබැවිනි.

## යුද්ධයට එරෙහි තහනම සම්බන්ධයෙන්

පළමු ලෝක යුද්ධයේ අවසානය තෙක්ම, සන්නද්ධ බලය යෙදවීමට යොමු වීම ගැටුම් නිරාකරණය කර ගැනීමේ පිළිගත් ක්‍රමවේදයක් ලෙස මිස අනීතික ක්‍රියාවක් ලෙස සලකා නැත.

1919 දී, ජාතීන්ගේ සම්මුතිය සහ 1928 දී පැරිස් සම්මුතිය (බ්‍රයින්-කැල්ලොග් ගිවිසුම) විසින් යුද්ධය අනීතික ලෙස නම් කෙරිණි. 1945 දි සම්මත කළ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මඟින් යුද්ධය නීතියෙන් බැහැර කිරීම අරමුණු කරන ලදි: "සංවිධානයේ සාමාජිකයින් විසින් සිය අන්තර්ජාතික සබඳතා වලදී තර්ජනය කිරීමෙන් හෝ බලය යෙදවීමෙන් වැළකී සිටිය යුතුය....." කෙසේ නමුදු, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මඟින් වෙනත් රාජ්‍යයක් (හෝ රාජ්‍යයන් සමූහයක්) විසින් සිදු කරනු ලබන ආක්‍රමණයට ප්‍රතිචාර ලෙස තනි හෝ සමූහික වශයෙන් ආත්ම ආරක්ෂාව සඳහා ඇති අයිතිය පිළිගනී. ප්‍රඥප්තියේ 7 වන පරිච්ඡේදය මත පදනම්ව ක්‍රියා කරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයට සාමය සඳහා වන තර්ජනයකට, සාමය උල්ලංඝනය කිරීමකට හෝ ආක්‍රමණකාරී ක්‍රියාවකට ප්‍රතිචාර ලෙස සාමූහික බලය යෙදවීමක් සිදු කළහැකිය.

## අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ "ආරක්ෂා කිරීමට ඇති වගකීම"

ආරක්ෂා කිරීමට ඇති වගකීම පිළිබඳ ගෝලීය කේන්ද්‍රය 2008 දී පිහිටුවන්නකි; 'ආරක්ෂා කිරීමට ඇති වගකීම' (R2P) යන සංකල්පය වර්ධනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අදාළව එය ප්‍රධාන භූමිකාවක් ඉටු කරන අතර එම සංකල්පය මෙසේ අර්ථකථනය කරයි:

"ආරක්ෂා කිරීමට ඇති වගකීම යනු ජනසංහාර සහ අනෙකුත් සාහසික මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ ආකාර වලදී ක්‍රියාත්මක වීමට ජාත්‍යන්තර ප්‍රජාව යළි කිසිදු දිනෙක අසමත් නොවන බව තහවුරු කිරීමට අරමුණු කරගත් මූලධර්මයකි. ආරක්ෂා කිරීමට ඇති වගකීම හෙවත් සාමාන්‍යයෙන් එය කෙටි කර දක්වන පරිදි 'R2P' රාජ්‍ය සහ ආණ්ඩු ප්‍රධානීන් විසින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ලෙස 2005 දී පැවති ලෝක සමුළුවේදී සම්මත කරන ලදි. රාජ්‍යයන්හට සිය පුරවැසියන් දැඩි කෲරත්වයන්ගෙන් ආරක්ෂා කරගැනීමට බැඳීමක් ඇති බව ප්‍රථමයෙන් දක්වන මෙම මූලධර්මය මඟින් දෙවනුව, එලෙස සිදු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව විසින් සහය ලබා දිය යුතු බවත් ප්‍රශ්නගත රාජ්‍ය නිසි පරිදි ක්‍රියා කිරීමට අපොහොසත් වන විටදී, එලෙස කිරීමේ වගකීම විශාල රාජ්‍ය ප්‍රජාව මත පැවරෙන බව තෙවනුව දක්වයි. සෑම රටකම නායකයින් විසින් දැඩි කෲරත්වයන්ගෙන් තර්ජනයට ලත් පිරිමින් සහ ගැහැණුන් වෙත ලබාදුන් උදාර පොරොන්දුවක් ලෙස R2P හඳුනා ගත යුතුය."

ජනසංහාර, යුද අපරාධ, වාර්ගික පවිත්‍රකරණය සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ යන නිශ්චිත අපරාධ හතරෙන් සිය ජනගහනය ආරක්ෂා කරගැනීමට තමන්ට පවතින බැඳීම හා අනුගත වීමට යම් රාජ්‍යයක් පැහැදිලිව අපොහොසත් වන්නේ නම්, වින්දිත ජනයාව ආරක්ෂා කරගැනීම සඳහා සාමූහික ක්‍රියාමාර්ග ගැනීමට අන්තර්ජාතික ප්‍රජාව සතුව වගකීමක් ඇති බව R2P සංකල්පය මඟින් දක්වයි. එම ක්‍රියාමාර්ග විවිධාකාර විය හැකිය; රාජ්‍යතාන්ත්‍රික ක්‍රියා, මානුෂීය පියවරයන් හෝ අනෙකුත් සාමකාමී ආකාර ඒ අතර වේ. එමෙන්ම ඊට අවසානාත්මක විසඳුම ලෙස එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අවසරය ලැබීමෙන් අනතුරුව පමණක් සිදු කළ හැකි බලය යෙදවීමද ඇතුළත් විය හැකිය. කෙසේ නමුදු, R2P “මතුවෙමින් පවතින නියමයක්” ලෙස හැඳින්වුවද එය අන්තර්ජාතික ප්‍රජාව මත නෛතික බැඳීමක් ඇති කරන්නක් නොවන අතර දේශපාලනික මෙවලමකි.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් ජාත්‍යන්තර සබඳතා තුළදී බලය යෙදීම නීත්‍යානුකූලභාවයට හෝ සුජාතකරණයට ලක් කිරීමෙහිලා පදනමක් නොසපයයි. එමෙන්ම එමඟින් මානුෂීය අරමුණු සඳහා රාජ්‍යයන් විසින් බලය යෙදීම සම්බන්ධව තහනමක් නොපනවයි. ජාත්‍යන්තර සබඳතා තුළදී සන්නද්ධ බලය යෙදවීමෙහි නීත්‍යානුකූලතාවය සම්පූර්ණයෙන්ම තීරණය වනුයේ jus ad bellum යටතේය. කෙසේ වුවද, සඳහන් කළ යුතු කරුණක් වනුයේ අන්තර්ජාතික මානුෂවාදී නීතිය කෙරෙහි ඇති ගරුත්වය තහවුරු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාව සතු වගකීම ඉස්මතු කිරීමෙහිලා මෙන්ම යුද අපරාධ සහ අනෙකුත් අන්තර්ජාතික අපරාධ ඇතුලු අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනය කිරීම් වැළැක්වීමෙහිලා දක්වනු ලබන සැලකිල්ලෙහි ප්‍රමාණය ගත් කළ අන්තර්ජාතික මානුෂවාදී නීතිය කෙරෙහි ඇති ගරුත්වය තහවුරු කිරීමට ඇති බැඳීම සහ R2Pහි ගැබ්ව ඇති තර්කණය එකිනෙකට සමාන වේ. “ජිනීවා සම්මුතීන්ට හෝ මෙම සන්ධානයට එරෙහිව උල්ලංඝනයන් සිදු කර ඇති අවස්ථා වලදී එක්සත් ජාතීන්ගේ සහයෝගය ඇතිව සහ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය හා අනුගත වෙමින් හවුලේ හෝ තනිව ක්‍රියාත්මක වීමට ගිවිසුම්කාර පාර්ශවයන් කටයුතු කරයි” යනුවෙන්, ජිනීවා සම්මුතීන්ට අතිරේක 1977 ජූනි 8 දරන සන්ධානයෙහි (පළමු අතිරේක සන්ධානය) 89 වන වගන්තිය තුළ පැහැදිලිව දක්වා ඇති එක්සත් ජාතීන් සමඟ සිදු කෙරෙන හවුල් ක්‍රියාමාර්ගවල එක් ආකාරයක් ලෙස ද R2P සන්දර්භය තුළ බලය යෙදවීම දැක්විය හැකිය.

මධ්‍යස්ථභාවයේ මූලික මූලධර්මය හා අනුකූල වන අන්තර්ජාතික රතු කුරුස කමිටුව R2Pහි හමුදා මැදිහත්වීම් පිළිබඳව සිය එකඟත්වය හෝ විරෝධතාවය හෝ ප්‍රකාශ නොකරයි. අන්තර්ජාතික රතු කුරුස කමිටුව විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය කෙරෙහි ගරුත්වය තහවුරු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාව විසින් ගෙන ඇති පියවර සම්බන්ධයෙන් කිසිදු අදහසක් ප්‍රකාශ නොකරයි. කෙසේ නමුදු එහි අතිශය වැදගත් කරුණක් ඉතිරිව තිබේ: R2P සඳහා සහ/හෝ අන්තර්ජාතික මානුෂවාදී නීතිය කෙරෙහි ගරුත්වය තහවුරු කිරීමට ඇති බැඳීම සඳහා පවතින පදනම් මත සිදු කෙරෙන ඕනෑම බලය යෙදීමක් අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය යටතේ ඇති අදාළ බැඳියාවන් හා අනුකූල විය යුතුය. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, R2P මෙහෙයුම් සන්දර්භයක් තුළ සන්නද්ධ ගැටුම් සඳහා සහභාගී වන රාජ්‍යයන් සහ අන්තර්ජාතික සංවිධානයන් විසින් සෑම කල්හිම අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කළ යුතුය.

# 3. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ප්‍රභවයන් මොනවාද?

යුද්ධයෙහි නරකම ප්‍රතිවිපාකයන්ගෙන් පුද්ගලයින් ආරක්ෂා කරගැනීමට ආදි කාලයේ පටන් ප්‍රයත්න දරා තිබේ (කොටුව බලන්න). කෙසේ නමුදු, සන්නද්ධ ගැටුම්හි වින්දිතයින් සඳහා ආරක්ෂාව සහ අයිතීන් ඇතුළත් යුධ කටයුතු නියාමනය කළ අන්තර්ජාතික ගිවිසුම් 19 වන ශත වර්ෂයේ දෙවන භාගය වන තෙක් මතු නොවුණි.

F. Boissonnas/ICRC



*ඩුෆෝර් (ඩුනන්ට් වෙත): "වද වේදනා සහ කඳුලු ඉතිරි කරන යුද බිමක කුමන උත්කර්ෂයක්ද යන්න ඔබ විසින් ඉතා පැහැදිලි ලෙස වාර්තා කර ඇති නිදසුන් ඔස්සේ අප විසින් දැකිය යුතුය."*

*ඩුනන්ට්: "යම් නිශ්චිත සුවිශේෂී අවස්ථාවන් වලදී, නිදසුනක් ලෙස, විවිධ ජාතීන්ට අයත් හමුදා කලාවන්හි කුමාරවරුන් එකිනෙකා හා මුණගැසුණු කළ, සම්මුතියක් මඟින් ක්‍රියාත්මක වන සහ අනුල්ලංඝනීය ස්වභාවයක් සහිත මෙන්ම එකඟ වීම හා අපරානුමත කිරීම සිදු කිරීමෙන්, විවිධ යුරෝපීය රටවල සිටින තුවාලවූවන් වෙනුවෙන් සහන සපයන සංගමයන් සඳහා පදනම ගොඩ නඟන යම් අන්තර්ජාතික මූලධර්මයක් නිර්මාණය කිරීමට මෙවැනි හමුවක වාසිය ගැනීම සුදුසු නොවන්නේද?"*

## සමකාලීන අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි ආදීකතෘන් කවුරුන්ද?

සමකාලීන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ මතුවීම තුළ ඉතා වැදගත් භූමිකාවක් මිනිසුන් දෙදෙනෙකු විසින් දරන ලදි: ස්විස්ටර්ලන්ත ජාතික ව්‍යාපාරිකයෙකු වන හෙන්රි ඩුනන්ට් සහ ස්විස්ටර්ලන්ත ජාතික හමුදා නිලධාරියෙකු වන ගිලෝම්-හෙන්රි ඩුෆෝර්. 1859 දී ඉතාලිය තුළ සංචාරය කරමින් සිටි ඩුනන්ට්, සොල්ෆෙරිනො යුද්ධයෙහි බිහිසුණු ප්‍රතිවිපාකයන් ඇස දුටුවේය. ජිනීවා වෙත නැවත පැමිණීමෙන් පසු සොල්ෆරිනෝ හි මතකය (A Memory of Solferino) මැයෙන් 1862 දී ප්‍රකාශිත ග්‍රන්ථය තුළින් සිය අත්දැකීම් හෙතෙම විස්තර කළේය. තම අත්දැකීම් මඟින්ම යුද්ධය ගැන මනාව දැන සිටි ජෙනරාල් ඩුෆෝර්, කල් නොයවාම සිය සක්‍රිය සදාචාර දායකත්වය ඩුනන්ට්ගේ අදහස් වෙත පිරි නැමූ අතර, හෙතෙම විශේෂයෙන්ම මුල් ජිනීවා සම්මුතිය සම්මත කිරීම සිදු වූ 1864 තානාපති සම්මේලනයේ මුලසුන ද දැරුවේය.

1863 දී, ඩුනන්ට් සහ ඩුෆෝර් විසින් ගුස්ටෝව් මොයිනිව්, ලුයිස් ඇපියා සහ තියඩෝර් මොනෝර් හා එක්ව යුද්ධයක් අතරතුරදී තුවාල වූවන්හට සහන සැපයීම සඳහා "පස් දෙනාගේ කමිටුව" නමින් ජාත්‍යන්තර කමිටුවක් පිහිටුවන ලදි. මෙය 1876 දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව බවට පත් විණි.

## සමකාලීන අන්තර්ජාතික මානුෂවාදී නීතිය පැවැත්මක් බවට පත්වූයේ කෙලෙසද?

අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ ආරම්භක සාමාජිකයින් පස් දෙනාගේ පෙළඹවීම මත ස්විස්ටර්ලන්ත රජය විසින් 1864 වර්ෂයේ දී රාජ්‍යතාන්ත්‍රික සම්මේලනයක් කැඳවන ලදි. ඊට රාජ්‍යයන් 16 ක් සහභාගී වූ අතර ඔවුන් විසින් යුදබිම තුළදී තුවාල වූ සන්නද්ධ බලකා සාමාජිකයින්ගේ තත්වය වැඩි දියුණු කිරීම පිළිබඳ සම්මුතිය සම්මත කරන ලදි. මෙය සමකාලීන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ උපතයි.

## 1864 සම්මුතිය මඟින් ගෙනා නව්‍යතා මොනවාද?

මෙම බහුපාර්ශ්වික සම්මුතිය මඟින් තුවාල වූ සහ රෝගී වූ සටන්කරුවන් ආරක්ෂා කිරීමට මෙන්ම ඔවුන්ව ආරක්ෂා කරන තැනැත්තන්ව ආරක්ෂා කිරීමට පැවති පුරාතන, අසම්පූර්ණ සහ විසිරී තිබූ යුද නීති හා චාරිත්‍ර සංග්‍රහගත කරමින් වඩා ශක්තිමත් කරන ලදි. එය ප්‍රධාන වශයෙන් පහත ලක්ෂණයන් විදහා දක්වයි:

- තුවාල වූ සහ රෝගී වූ සටන්කරුවන් ආරක්ෂා කිරීමට ඇති විශ්වීය අභිප්‍රාය දක්වන ස්ථාවර ලිඛිත නීති
- එහි බහුපාර්ශ්වික ස්වභාවය, සියලු රාජ්‍යයන්ට විවෘත වීම
- වෙනස් කොට සැලකීමකින් තොරව තුවාල වූ සහ රෝගී වූ යුද භටයින්හට රැකවරණය සැපයීමට ඇති බැඳියාව (එනම්, මිත්‍ර සහ සතුරු ලෙස කිසිදු වෙනස් කොට සැලකීමකින් තොරව)
- ලාංඡනයක් යොදා ගනිමින් වෛද්‍ය කාර්යමණ්ඩල, ප්‍රවාහන සහ උපකරණ හඳුනා ගැනීම පිණිස ලකුණු කිරීම සහ ඒවාට ගරු කිරීම ( සුදු පැහැති පසුබිමක් තුළ රතු කුරුසය).

## සංග්‍රහගත කිරීමට පෙර අන්තර්ජාතික මානුෂවාදී නීතිය

අද අප දන්නා පරිදි, අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි සමාරම්භක ලක්ෂය ලෙස, 1863 දී රතු කුරුස කමිටුව ආරම්භ කිරීම හෝ 1864 දී සිදු කළ මුල් ජිනීවා සම්මුතිය සම්මත කිරීම සිතන්නේ නම් එය අත්වැරැද්දක් වනු ඇත. තමන්ටම ආවේණිකවූ නීති නොමැති කිසිදු ආකාරයක සමාජයක් නොමැත්තා සේ, සතුරු කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වය, ඔවුනගේ පැතිරීම සහ ඔවුනගේ අවසානය ආවරණය කරමින් අපැහැදිලි හෝ නිශ්චිත රීතින් හෝ නොමැති කිසිදු යුද්ධයක්ද පැවති නැත.

*“සමස්තයක් ලෙස ගත් කල, ප්‍රාථමික මිනිසුන්ගේ යුද පරිචයන් මඟින් වර්තමානයේ දන්නා විවිධාකාරයේ අන්තර්ජාතික යුද නීතින් විදහා දක්වයි: සතුරු කොටස් වෙන් කොට දක්වන නීති; යුද්ධයේ ආරම්භය සහ අවසානය දක්වන තත්වයන්, උපචාරයන් සහ අධිකාරිය නිර්ණය කරන නීති; පුද්ගලයින්, කාලය සහ ස්ථානය මත ඇති සීමා මෙන්ම ඒවායේ ක්‍රියාකලාපයට අනුකූල විධික්‍රම විස්තර කරන නීති; එමෙන්ම යුද්ධය නීතිවිරෝධී බව ද දක්වන නීති.”*

**ක්වින්සි රයිට්**

**ප්‍රථම යුද නීති අපගේ කාලයට සහස්‍ර ගණනාවකට පෙර ප්‍රකාශ කොට ඇත:**

***"ශක්තිවන්තයා විසින් දුර්වලයා පීඩාවට පත් කිරීම වැළැක්වීම සඳහා මම මෙම නීති පනවමි."***

**හමුරාබි, බැබිලෝනියාවේ රජු**

මහා භාරතය, බයිබලය සහ කුරානය වැනි බොහෝ පුරාතන ග්‍රන්ථයන් තුළ සතුරා වෙත ගරුත්වය පෑම නියෝජනය කරමින් නීති ඇතුළත්ව පවතී. නිදසුනක් ලෙස, 13 වන ශත වර්ෂය අග භාගයේ දී, අරාබි ජාතිකයින් විසින් ස්පාඤ්ඤය පාලනය කළ උච්චතම කාල වකවානුවේදී ලියවුණු විකායට් (the Viqayet) තුළ යුද කටයුතු වලට අදාළව සැබෑ ලෙසම නීති සංග්‍රහයක් ඇතුළත්ව තිබේ.

එලෙසම, මධ්‍යකාලීන යුරෝපය තුළද, දුබලයින්හට සහ තමාව ආරක්ෂා කරගත නොහැකි තැනැත්තන්හට ගරු කිරීම තහවුරු කිරීම පිණිස පැවති උදාරභාවයේ නීති සංග්‍රහයක් වන වීරත්වයේ නීතින් පිළිපැදීම නයිට්වරුන්ට අනිවාර්ය කොට තිබිණි. මෙකී නිදසුන් මගින් අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි විශ්වීයත්වය පිළිබිඹු කරයි.

## ලීබර් සංග්‍රහය

යුද කටයුතුවල ආරම්භයේ සිට සමකාලීන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ පැමිණීම දක්වා, එදිරිවාදී ක්‍රියා නියාමනය කිරීම සඳහා නිර්මිත කාටල ගිවිසුම්, කාර්ය සංග්‍රහයන්, සම්මුතීන් සහ අනෙකුත් ලේඛන 500 කට අධික ප්‍රමාණයක් වාර්තා ගත කොට තිබේ. ඒ අතරට 1863 වර්ෂයේදී බලාත්මක වූ ලීබර් සංග්‍රහය ඇතුළත්ය. මෙම සංග්‍රහය වැදගත් වනුයේ පැවති යුද නීති සහ චාරිත්‍ර සංග්‍රහගත කිරීමට දැරූ ප්‍රථම ප්‍රයත්නය එය වන බැවිනි. කෙසේ වුවද, මුල් ජිනීවා සම්මුතිය (මෙයට වසරකට පසු සම්මත කළ) මෙන් ගිවිසුමක තත්වය මෙම සංග්‍රහයට හිමි වීමක් සිදු නොවූයේ එය සම්පූර්ණ ලෙසම ඇමෙරිකානු සිවිල් යුද්ධය තුළ යූනියන් හමුදා කඳවුර වෙනුවෙන් සටන් වැදී සෙබලුන් අරඹයා පමණක් වූ බැවිනි.

# 4. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සකස්වන්නේ කුමන ගිවිසුම් මත ද? චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු කුමක්ද?

නූතන අන්තර්ජාතික මානුෂවාදී නීතිය, 1864 මුල් ජිනීවා සම්මුතිය සමග උපත ලබන ලදි. සන්නද්ධ ගැටුමෙහි ස්වභාවයේ වෙනස්කම් සහ ආයුධ තාක්ෂණයේ ප්‍රගමනයන් හමුවේ හට ගත් නිරන්තරයෙන් වර්ධනය වන මානුෂීය ආධාරයන්හි අවශ්‍යතාවය තෘප්ත කිරීම සඳහා එය විවිධ අදියර වලදී විකාශනය වී ඇත; අවාසනාවන්ත ලෙස, මෙම නෛතික වර්ධනයන් සිදුව ඇත්තේ එකී වර්ධනය අවශ්‍ය වූ තත්වයන් අවසාන වූ පසුවය. සම්මත කර ගත් කාලානුක්‍රමිකව පහතින් දක්වා ඇත්තේ අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ප්‍රධාන ගිවිසුම් වේ.

| | |
|---|---|
| 1864 | යුද බිමේ දී තුවාල වූ සන්නද්ධ බලකා සාමාජිකයින්ගේ තත්වය වැඩි දියුණු කිරීම පිළිබඳ ජිනීවා සම්මුතිය |
| 1868 | ශාන්ත පීටර්ස්බර්ග් ප්‍රකාශනය (යුද තත්වයන් අතරතුරදී යම් නිශ්චිත ප්‍රක්ෂිප්තයන්ගේ භාවිතය තහනම් කිරීම සඳහා) |
| 1899 | ගොඩබිම තුළ සිදු කරන යුද්ධයට අදාළ යුද නීති සහ චාරිත්‍රයන්ට ගරු කරන හේග් සම්මුතීන් සහ 1864 ජිනීවා සම්මුතියේ ඇතුළත් නාවික යුද මූලධර්ම සඳහා අනුගත වීම |
| 1906 | 1864 ජිනීවා සම්මුතියේ විචාරය සහ වර්ධනය |
| 1907 | 1899 හේග් සම්මුතීන් විවරණය සහ නව සම්මුති සම්මත කිරීම |
| 1925 | යුද කටයුතු වලදී ශ්වාසනිරෝධන, විෂ හෝ අනෙකුත් වායුන් සහ බැක්ටීරියා විද්‍යාත්මක යුද විධික්‍රම භාවිතය තහනම් කිරීම පිළිබඳ ජිනීවා සන්ධානය |
| 1929 | ජිනීවා සම්මුති දෙක:<br>• 1906 ජිනීවා සම්මුතිය විවරණය සහ වර්ධනය<br>• යුද සිරකරුවන්ට සැලකීමට අදාළ ජිනීවා සම්මුතිය |
| 1949 | ජිනීවා සම්මුති හතර:<br>I. යුද බිමේදී තුවාල සහ රෝගීවූ සන්නද්ධ බලකා සාමාජිකයින්ගේ තත්වය වැඩි දියුණු කිරීම<br>II. මුහුදේ දී තුවාලවූ, රෝගීවූ සහ නැව් මුහුදුබත්වූ සන්නද්ධ බලකා සාමාජිකයින්ගේ තත්වය වැඩි දියුණු කිරීම<br>III. යුද සිරකරුවන්ට සැලකීම<br>IV. යුද සමයේ දී සිවිල් පුද්ගලයින්ව ආරක්ෂා කිරීම |
| 1954 | සන්නද්ධ ගැටුම් තත්වයකදී සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම පිළිබඳ හේග් සම්මුතිය |
| 1972 | බැක්ටීරියා විද්‍යාත්මක (ජීව විද්‍යාත්මක) සහ විෂ අවි වර්ධනය, නිෂ්පාදනය සහ ගබඩාකරණය තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය |

| | |
|---|---|
| 1976 | හමුදා හෝ වෙනත් එදිරිවාදී පාරිසරික විකරණ තාක්ෂණික ක්‍රම භාවිතය තහනම් කිරීම පිළිබඳ සම්මුතිය |
| 1977 | 1949 ජිනීවා සම්මුතීන් හතර සඳහා වන අතිරේක සන්ධාන දෙක,<br>අන්තර්ජාතික (පළමු අතිරේක සන්ධානය) සහ අන්තර්ජාතික නොවන (දෙවන අතිරේක සන්ධානය) සන්නද්ධ ගැටුම් වල වින්දිතයින්හට ආරක්ෂාව ශක්තිමත් කිරීම |
| 1980 | වෙන් කිරීමකින් තොරව ප්‍රතිවිපාක ඇති කරන හෝ අධිකතර ලෙස හානි පමුණුවිය හැකි යම් නිශ්චිත සාම්ප්‍රදායික අවි CCW භාවිතය සීමා කිරීම හෝ තහනම් කිරීම පිළිබඳ සම්මුතිය. CCW යන්නට පහත දෑ ඇතුළත් වේ:<br>• අනාවරණය කර ගත නොහැකි කැබලි පිළිබඳ (පළමු) සන්ධානය<br>• බිම් බෝම්බ, උගුල් සහ අනෙකුත් උපකරණ භාවිතය සීමා කිරීම හෝ තහනම් කිරීම පිළිබඳ (දෙවන) සන්ධානය<br>• ගිනි අවුලුවන අවි භාවිතය සීමා කිරීම හෝ තහනම් කිරීම පිළිබඳ (තෙවන) සන්ධානය |
| 1989 | ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (38 වගන්තිය) |
| 1993 | රසායනික අවි වර්ධනය, නිෂ්පාදනය සහ ගබඩාකරණය තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය |
| 1995 | අන්ධභාවයට පමුණුවන ලේසර් කිරණ අවි පිළිබඳ (සිව්වන) සන්ධානය (1980 CCW සඳහා ඇතුළත් කරන ලදි) |
| 1996 | බිම් බෝම්බ, මර උගුල් සහ අනෙකුත් උපකරණ භාවිතය සීමා කිරීම හෝ තහනම් කිරීම පිළිබඳ සංස්කරණය කරන ලද සන්ධානය (1980 CCW සඳහා [සංස්කරණය කරන ලද] දෙවන සන්ධානය) |
| 1997 | පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය, ගබඩාකරණය, නිෂ්පාදනය සහ විකිණීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය |
| 1998 | අන්තර්ජාතික අපරාධ අධිකරණය පිළිබඳ රෝම ව්‍යවස්ථාව |
| 1999 | සන්නද්ධ ගැටුම් තත්වයකදී සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම පිළිබඳ 1954 හේග් සම්මුතිය සඳහා වන දෙවන සන්ධානය |
| 2000 | සන්නද්ධ ගැටුමක ළමුන්ගේ සහභාගීත්වය සම්බන්ධ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා වන වෛකල්පික සන්ධානය |
| 2001 | 1980 CCW හි 1 වන ව්‍යවස්ථාව සඳහා වන සංශෝධනය |
| 2003 | යුද්ධයේ පිපිරෙන ඉතිරි කැබලි පිළිබඳ (පස් වන) සන්ධානය (1980 CCW සඳහා එකතු කරන ලදි) |
| 2005 | විශේෂිත ලාංඡනය සම්මත කිරීමට අදාළ ජිනීවා සම්මුතීන් සඳහා අතිරේක සන්ධානය (තෙවන අතිරේක සන්ධානය) |
| 2006 | බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය |
| 2008 | පොකුරු බෝම්බ පිළිබඳ සම්මුතිය |
| 2013 | ආයුධ වෙළඳාම පිළිබඳ ගිවිසුම |

ඇතැම් සන්නද්ධ ගැටුම් මඟින් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ වර්ධනය උදෙසා ආසන්නතම බලපෑමක් ඇති කර ඇති බව මෙම ලැයිස්තුව පෙන්වා දෙයි:

පළමු ලෝක යුද්ධය අතරතුරදී (1914-1918) සම්පූර්ණයෙන්ම අලුත් නොවූ උපක්‍රම ද ඇතුළුව යුද විධික්‍රම පෙර නොවූ විරූ ප්‍රමාණයකින් භාවිතා කරන ලදි. මේ අතරට විෂ වායු භාවිතය, අහසේ සිට බෝම්බ හෙළීම සහ යුද සිරකරුවන් සිය දහස් ගණනින් අල්ලා ගැනීම ඇතුළත් වේ. 1925 සහ 1929 ගිවිසුම් එකී වර්ධනයන් සඳහා වූ ප්‍රතිචාරයකි.


Article 9.
Les hautes Puissances contractantes sont convenues de communiquer la présente Convention aux Gouvernements qui n'ont pu envoyer des Plénipotentiaires à la Conférence Internationale de Genève, en les invitant à y accéder; le protocole est à cet effet laissé ouvert.
Article 10.
La présente Convention sera ratifiée, et les ratifications en seront échangées à Berne, dans l'espace de quatre mois, ou plus tôt si faire se peut.
En foi de quoi les Plénipotentiaires respectifs l'ont signée et y ont apposé le cachet de leurs armes.
Fait à Genève, le vingt-deuxième jour du mois d'Août de l'an mil huit cent soixante-quatre.
Genl G.H. Dufour
G. Moynier
Dr. Robert Volz
Visschers

ICRC

පළමු ලෝක යුද්ධය තුළදී සිවිල් වැසියන් සහ මිලිටරි භටයින් ඝාතනය වූ 1:10 අනුපාතය මෙන් නොව දෙවන ලෝක යුද්ධයේදී (1939-1945) සිවිල් වැසියන් සහ මිලිටරි භටයින් සමාන ප්‍රමාණයන්ගෙන් ඝාතනය වන ලදි. 1949 දී, මෙකී බිහිසුණු ඝාතන අනුපාතයන්ට සහ ප්‍රධාන වශයෙන් යුද්ධය මගින් සිවිල් ජනයා මත ඇති කරන භයානක ප්‍රතිවිපාකයන්ට ප්‍රතිචාර දක්වමින් ජාත්‍යන්තර ප්‍රජාව මගින් එවකට බලාත්මකව පැවති සම්මුතීන් සංස්කරණය කරමින් නව නෛතික ලේඛනයක් සම්මත කරන ලදි: සිවිල් වැසියන් ආරක්ෂා කිරීම පිළිබඳ හතර වන ජිනීවා සම්මුතිය.

1977 අතිරේක සන්ධාන යනු 1949 ජිනීවා සම්මුතීන් මගින් එකී සම්මුති හතර සඳහාම පොදු වූ 3 වන වගන්තිය (පොදු 3 වන වගන්තිය) ඔස්සේ අර්ධ වශයෙන් ආවරණය කළ, ජාතික විමුක්තිය උදෙසා වන යුද්ධවල ප්‍රතිවිපාකයන්ගේ බලපෑමට ප්‍රතිචාරයක් ලෙස නිර්මාණය වූවකි.

1949 ජිනීවා සම්මුතීන් සහ 1977 අතිරේක සන්ධාන තුළ වගන්ති 600 කට ආසන්න ප්‍රමාණයක් ඇතුළත් අතර, ඒවා අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ප්‍රධාන නෛතික ලේඛනයන් වේ. (6වන ප්‍රශ්නය බලන්න)

## චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය

ප්‍රධාන වශයෙන් ගිවිසුම් සම්මත කිරීම සහ චාරිත්‍රානුකූල නීතිය සංස්ථාපනය කිරීම මගින් රාජ්‍යයන් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය වර්ධනය කරන ලදි. චාරිත්‍රානුකූල නීතිය සංස්ථාපනය වනුයේ රාජ්‍ය පරිචය ප්‍රමාණවත් පරිදි තීව්‍ර වන විට (පුළුල්ව පැතිරීම, නියෝජනාත්මක වීම, නිතර යෙදීම සහ ඒකීය වීම) සහ නිශ්චිත ආකාර යටතේ ක්‍රියා කිරීමට හෝ පනවා ඇති තහනම් මත ක්‍රියා නොකිරීමට තමන්හට නෛතික බැඳියාවක් ඇති බවට රාජ්‍යයන්හට ඇති විශ්වාසයක් මගින් එකී රාජ්‍ය පරිචය අනුගාමී වන විටය. චාරිත්‍රයක ආරම්භයේ සිටම පරිචයට හෝ ප්‍රශ්නගත නීතියට දිගින් දිගටම විරුද්ධත්වය දක්වා ඇති රාජ්‍යයන් හැරුණු කොට චාරිත්‍ර මගින් සියලු රාජ්‍යයන් බැඳේ.

1995 වර්ෂයේදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල නීති පිළිබඳව සවිස්තරාත්මක අධ්‍යයනයක් ආරම්භ කරන ලදි. ඒ සඳහා ආසන්න වශයෙන් වසර දහයක කාලයක් ගත වූ අතර එය 2005 දී කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය මගින් ප්‍රකාශනය කරන ලදි. එම අධ්‍යයනය වෙත https://www.icrc.org/customary-ihl ඔස්සේ අන්තර්ජාලය මගින් ප්‍රවේශ විය හැකිය. මෙම දත්ත ගබඩාව මගින් අධ්‍යයනය පිළිබඳ යාවත්කාලීන කළ සංස්කරණයක් සපයන අතර එය කොටස් දෙකකට කණ්ඩනය කොට ඇත.

- **රීති** : මෙමගින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතියේ පවතින රීති පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කරයි. කෙසේ නමුදු, අතිශය විස්තරාත්මක වුවද මෙම අධ්‍යයනය මෙකී නීති ක්ෂේත්‍රය තුළ පවතින සියලු රීති ආවරණය කරන සම්පූර්ණ ඇගයුමක් ලෙස නොගැනේ. අධ්‍යයනයේ මෙම කොටස අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ භාෂා වලින් පවතී. අධ්‍යයනයේ සාරාංශගත කිරීමක් සහ රීති ලැයිස්තුවක් වෙනත් බොහෝ භාෂාවන්ගෙන් ද පවතී.
- **පරිචය** : පළමු කොටස මගින් විග්‍රහ කරන ලද රීතිවලට පාදක වී ඇති පරිචය මෙහි ඇතුළත් වේ. බ්‍රිතාන්‍ය රතු කුරුසයේ සහයෝගීතාවය ඇතිව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් එය නිරන්තරයෙන් යාවත්කාලීන කරයි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත ජාලය සහ ලෝකය පුරා සිටින ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සමාජ මගින් මූලාශ්‍ර තොරතුරු එකතු කළ අතර ඒවා සංස්ථාපනය කරනු ලැබුවේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර නීතිය පිළිබඳ ලෝටර්පැක්ට් කේන්ද්‍රය පදනම් කරගත් පර්යේෂණ කණ්ඩායමක් විසිනි.




# 5. අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ වන්නේ කුමන අවස්ථාවේදීද?

සන්නද්ධ ගැටුම් පවතින අවස්ථාවන්හිදී පමණක් අන්තර්ජාතික මානුෂවාදී නීතිය බලපවතියි. එමඟින් දෙයාකාරයක ආරක්ෂණයන් සපයයි: එක් ආරක්ෂණයක් අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා වන අතර අනෙක් ආරක්ෂණය අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා වේ. එබැවින් යම් සුවිශේෂී අවස්ථාවක් සඳහා අදාළ වන නීතින් කවරේද යන්න සන්නද්ධ ගැටුම් වර්ගීකරණය මත වෙනස් වේ.

## අ) අන්තර්ජාතික සන්නද්ධ ගැටුම (IAC)

එකක් හෝ එකකට වඩා වැඩි රාජ්‍යයන් ප්‍රමාණයක් තවත් රාජ්‍යයකට එරෙහිව සන්නද්ධ බලය භාවිතය සඳහා යොමු වීම මඟින් අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් හට ගනියි. රාජ්‍යයක් සහ අන්තර්ජාතික සංවිධානයක් අතර ඇති වන සන්නද්ධ ගැටුම ද අන්තර්ජාතික සන්නද්ධ ගැටුමක් ලෙස වර්ග කරයි.

යටත්විජිත ආධිපත්‍යයට සහ විජාතික අත්පත් කරගැනීමට සහ සිය ස්වයං නිර්ණ අයිතිය ජාතිවාදී රෙජීමයන්ට එරෙහිව ක්‍රියාවේ යොදවන මිනිසුන් විසින් සිදු කරන ජාතික විමුක්ති අරගලය සඳහා වන යුද්ධ ද යම් නිශ්චිත කොන්දේසි යටතේ අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් ලෙස වර්ග කර තිබේ. (පළමු අතිරේක සන්ධානයේ 1 වන වගන්තිය, 4 වන ඡේදය සහ 96 වන වගන්තියේ 3 වන ඡේදය බලන්න). (තව ද 8 වන ප්‍රශ්නය බලන්න.)




## ආ) අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම (NIAC)

අද හටගන්නා බොහෝ සන්නද්ධ ගැටුම් ස්වභාවයෙන් අන්තර්ජාතික නොවන ගැටුම් වේ. අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක් යනු එදිරිවාදීකම් රාජ්‍යයක සන්නද්ධ බලකා සහ රාජ්‍ය නොවන සංවිධානාත්මක සන්නද්ධ කණ්ඩායම් අතර හෝ, එවැනි කණ්ඩායම් අතර හටගනු ලබන සන්නද්ධ ගැටුමකි. එදිරිවාදීකම් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක් ලෙස හැඳින්වීමට නම්, ඒවා යම් නිශ්චිත තීව්‍රතා මට්ටමකට ළඟා විය යුතු මෙන්ම ගැටුමට සහභාගී වන කණ්ඩායම් ප්‍රමාණාත්මක ලෙස සංවිධානය වී තිබිය යුතුය.

පොදු 3 වන වගන්තියේ අර්ථය මගින් දක්වන අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සහ දෙවන අතිරේක සන්ධානයේ 1 වන වගන්තියේ අර්ථය තුළින් දක්වන අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් අතර පැහැදිලි වෙනසක් අන්තර්ජාතික මානුෂවාදී ගිවිසුම් නීතිය ස්ථාපනය කරයි.

- **පොදු 3 වන වගන්තිය** "අන්තර්ජාතික ස්වරූපයක් නොගන්නා ගිවිසුම්කාර පාර්ශවයක දේශ සීමාව තුළ හටගනු ලබන සන්නද්ධ ගැටුම්" සඳහා අදාළ වේ. එකක් හෝ එකකට වඩා වැඩි රාජ්‍ය නොවන සංවිධානාත්මක සන්නද්ධ කණ්ඩායම් සහභාගී වන සන්නද්ධ ගැටුම් මීට ඇතුළත් වේ. රාජ්‍යයේ සන්නද්ධ බලකා සහ රාජ්‍ය නොවන සංවිධානාත්මක සන්නද්ධ කණ්ඩායම් අතර හෝ, එවැනි කණ්ඩායම් අතර පමණක් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් හටගනු ලබයි.

- **දෙවන අතිරේක සන්ධානය** අදාළ වනුයේ "ගිවිසුම්කාර පාර්ශවයක භූමි ප්‍රදේශය තුළ එහි සන්නද්ධ බලකා සහ විරුද්ධවාදී සන්නද්ධ බලකා හෝ අනෙකුත් සංවිධානාත්මක සන්නද්ධ කණ්ඩායම් එනම්, ස්ථිර සහ සම්මත යුද මෙහෙයුම් ක්‍රියාත්මක කළ හැකි අයුරින් සහ මෙම සන්ධානය ක්‍රියාවට නැංවිය හැකි පරිද්දෙන් භූමි ප්‍රදේශය තුළ යම් කොටසක පාලනය ගෙන යනු ලබන, වගකිව යුතු අණ දීමක් සහිතව ක්‍රියාත්මක වන කණ්ඩායම් අතර හට ගනු ලබන" සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙනි. (දෙවන අතිරේක සන්ධානයේ 1 ඡේදයේ 1 වගන්තිය බලන්න). අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් දෙවන අතිරේක සන්ධානයේ දක්වා ඇති නිර්වචනය පොදු 3 වන වගන්තියේ එන අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් පිළිබඳ සංකල්පය හා ගත් කළ ආකාර දෙකකින් සීමා සහිත වේ.

    1) "ස්ථිර සහ සම්මත යුද මෙහෙයුම් ක්‍රියාත්මක කළ හැකි අයුරින් සහ මෙම සන්ධානය ක්‍රියාවට නැංවිය හැකි පරිද්දෙන්" එකී සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සතුව භූමි ප්‍රදේශයක් පාලනය කිරීමකට අදාළව අනිවාර්ය භෞමික පාලනයක අවශ්‍යතාවය හඳුන්වා දෙනු ලබයි.

    2) දෙවන අතිරේක සන්ධානය පැහැදිලිවම රාජ්‍යයේ සන්නද්ධ බලකා සහ විරුද්ධවාදී සන්නද්ධ බලකා හෝ අනෙකුත් සංවිධානාත්මක සන්නද්ධ කණ්ඩායම් අතර ඇති වන සන්නද්ධ ගැටුම් සඳහා පමණක් අදාළ වේ. පොදු 3 වන වගන්තිය මෙන්, දෙවන සන්ධානය සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් අතර හට ගනු ලබන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ නොවේ.

මෙකී සන්දර්භය තුළ සිහි තබා ගත යුතු කරුණක් වනුයේ දෙවන අතිරේක සන්ධානය විසින් පොදු 3 වන වගන්තිය "එහි භාවිතයට අදාළව පවතින කොන්දේසීන් වෙනස් කිරීමකින් තොරව" "වැඩි දියුණු කිරීමත් ඌන පූරණ සැපයීමත්" සිදු කරන බවයි. (දෙවන අතිරේක සන්ධානයේ 1 ඡේදයේ 1 වගන්තිය බලන්න). මෙමගින් අදහස් වනුයේ මෙම සීමා සහිත නිර්වචනය හුදෙක් දෙවන අතිරේක සන්ධානයේ භාවිතය සඳහා පමණක් අදාළ වන බවයි; එය සාමාන්‍ය අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් නීතිය තෙක් විස්තීරණය වීමක් සිදු නොවේ.

## අන්තර්ජාතික සන්නද්ධ ගැටුමේ සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමේ සමගාමී පැවැත්ම

සමහර අවස්ථාවලදී, එකම කාලයක් තුළ සහ එකම භූමි ප්‍රදේශය තුළ සන්නද්ධ ගැටුම් කිහිපයක් හට ගත හැකිය. එවැනි අවස්ථාවලදී, සන්නද්ධ ගැටුම පිළිබඳ වර්ගීකරණය මෙන්ම ඊට අදාළ වන නීතිය සතුරු පාර්ශව අතර ඇති සබඳතා මත තීරණය වේ.

මෙම උපකල්පිත නිදර්ශනය සලකා බලන්න. A නම් රාජ්‍යය, සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමක් සමඟ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක නියැලී සිටී. B රාජ්‍යය විසින් ඍජුවම සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමේ පාර්ශවය තුළින් මැදිහත් වේ. එවිට A රාජ්‍යය සහ B රාජ්‍යය විසින් අන්තර්ජාතික සන්නද්ධ ගැටුමකට පාර්ශවයන් විය හැකි නමුදු, A රාජ්‍යය සහ සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම අතර පැවති සන්නද්ධ ගැටුම අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක ස්වභාවයම ගනී. B රාජ්‍යය විසින් A රාජ්‍යය පාර්ශවය තුළින් ගැටුමට මැදිහත් වූයේ නම්, A රාජ්‍යය සහ සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමත්, B රාජ්‍යය සහ සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමත් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක සහභාගිවන්නන් වේ.

## අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා බලපාන ප්‍රධාන නීති

| අන්තර්ජාතික සන්නද්ධ ගැටුම (IAC) | අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම (NIAC) |
|---|---|
| ජිනීවා සම්මුති හතර | පොදු 3 වන වගන්තිය |
| පළමු අතිරේක සන්ධානය | දෙවන අතිරේක සන්ධානය |
| IAC සඳහා චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය | NIAC සඳහා චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය |

අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා බලපාන නීති වල විස්තරාත්මකභාවය අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා බලපාන නීති වල විස්තරාත්මකභාවය හා ගත් කළ අඩුය. නිදසුනක් ලෙස, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා බලපාන නීති තුළ සටන්කරුවා හෝ යුද සිරකරුවා යන තත්වයන් දැක ගත නොහැකිය. ("සටන්කරුවා"සහ "යුද සිරකරුවා" යන්නෙහි නිර්වචන සඳහා 7 වන ප්‍රශ්නය බලන්න.) ඊට හේතුව වනුයේ රාජ්‍යයන් විසින් සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සාමාජිකයින්හට යුද වැදීම පිළිබඳ දේශීය නීතිය මඟින් චෝදනා ඉදිරිපත් කොට නඩු කටයුතු පවරා පවත්වාගෙන යාමට අදාළ මුක්තිය ලබා දීමට දිගින් දිගටම අකැමති වීමයි. රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය පිළිබඳ මූලධර්මය සහ අභ්‍යන්තරික කාරණා ජාත්‍යන්තර සංග්‍රහගත කිරීමට අදාළ කරගැනීමට ඇති රාජ්‍යයේ අකැමැත්තත් මඟින් තහවුරු කර ඇත්තේ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා බලපවතින ආරක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම ඉතා අපහසු බවයි. කෙසේ වුවද, සඳහන් කළ යුතු කරුණක් වනුයේ අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා අදාළ ගිවිසුම් නීතිය සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ ගිවිසුම් නීතිය අතර පවතින තීරණාත්මක හිඩැස බොහෝ විට දී සෑම වර්ගයකම සන්නද්ධ ගැටුම් සඳහා සමාන වන චාරිත්‍රානුකූල නීතිය මඟින් ක්‍රමිකව පූර්ණය කරන බවයි.

## අභ්‍යන්තර කලහකාරී තත්ව සහ කැළඹීම් සඳහා අදාළ වන නීති කවරේද?

සන්නද්ධ ගැටුමක් යටතේලා නොගැනෙන මහජන සාමය බිඳ දමන ආකාරයේ ක්‍රියා මඟින් අභ්‍යන්තර කලහකාරී තත්ව සහ කැළඹීම් (කැරළි කෝලාහල, තනි හා කඩින් කඩ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා වැනි) විදහාපායි; මේවා සන්නද්ධ ගැටුම් ලෙස නොගනුයේ ප්‍රචණ්ඩත්වයේ තීව්‍රතාවය ප්‍රමාණවත් පරිද්දෙන් ඉහළ මට්ටමක නොපැවතීම හෝ ප්‍රචණ්ඩ ක්‍රියාව සඳහා යොමු වන තැනැත්තන් සන්නද්ධ කණ්ඩායමක් ලෙස සංවිධානාත්මක නොමැති බැවිනි.

සන්නද්ධ ගැටුමක් යටතේලා නොගැනෙන ප්‍රචණ්ඩකාරී තත්වයන් සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ නොවේ. මෙවැනි වර්ගයේ තත්වයන් පාලනය වනුයේ මානව අයිතිවාසිකම් නීතියේ විධිවිධාන (9 වන ප්‍රශ්නය බලන්න) සහ දේශීය නීති මඟිනි.



# 6. ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන යනු මොනවාද?

## 1949 ජිනීවා සම්මුතීන් වල මූලාරම්භයන්

සටන්බිමේ දී තුවාල වූ සන්නද්ධ බලකා සාමාජිකයින්ගේ තත්වය වැඩි දියුණු කිරීම පිළිබඳ ජිනීවා සම්මුතිය 1864 දී සම්මත කරන ලදි. එය 1906 දී සහ 1929 දී සංස්කරණය සහ වර්ධනය කරන ලදි. යුද සිරකරුවන්ට සැලකීමට අදාළව තවත් ගිවිසුමක් 1929 දී සම්මත කරන ලදි. අන්තර්ජාතික රතු කුරුස කමිටුව විසින් කෙටුම්පත් කරන ලද යුදමය පාර්ශවයකට අයිති හෝ එකී පාර්ශවය විසින් අත්පත් කරගන්නා ලද භූමි ප්‍රදේශයක සිටින සතුරු පාර්ශවයක සිවිල් වැසියන්ගේ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිමය ලේඛනයක් 1934 වර්ෂයේ දී, ටෝකියෝවේ පැවති 15 වන ජාත්‍යන්තර සමුළුව විසින් අනුමත කරන ලදි.



c. Martin-Chico/ICRC

එම ලේඛනය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් අතර, එය සම්මත කරගැනීමට අදාළව තීරණ ගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික සමුළුවක් කැඳවීම රාජ්‍යයන් විසින් ප්‍රතික්ෂේප කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස, ටෝකියෝ කෙටුම්පත තුළ අන්තර්ගත විධිවිධානයන් දෙවන ලෝක යුද්ධය අතරතුරදී අදාළ වූයේ නැත. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ පදනම ලෙස පවතින, ජිනීවා සම්මුතීන් හතර රාජ්‍යයන් විසින් සම්මත කරනුයේ දෙවන ලෝක යුද්ධය අවසාන වීමෙනුත් පසු 1949 දීය. 1949 පළමු ජිනීවා සම්මුතීන් ත්‍රිත්වය වනාහි සමාන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව එවකට පැවති ගිවිසුම් තුළින් පැන නැඟි ගිවිසුම් වූ අතර සිව්වන ජිනීවා සම්මුතිය සම්පූර්ණයෙන්ම අලුත් නිමැවුමක් වූවා පමණක් නොව, සන්නද්ධ ගැටුමක් අතරතුරදී සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සම්බන්ධව විශේෂයෙන්ම ගනුදෙනු කළ පළමු අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුමද විය. දෙවන ලෝක යුද්ධය හමුවේ ඝාතනය කළ, සිවිල් මරණ සංඛ්‍යාව මෙවැනි සම්මුතියක් වර්ධනය කිරීමටත් සම්මත කරගැනීමටත් පාදක වූ හේතු අතරින් එකකි.

## 1977 අතිරේක සන්ධානයන්ගේ මූලාරම්භය

1949 ජිනීවා සම්මුතීන් වනාහි අන්තර්ජාතික මානුෂවාදී නීතිය වර්ධනයෙහිලා වූ එක් ප්‍රධාන ප්‍රගමනයකි. යටත්විජිතහරණයෙන් පසු, කෙසේ වුවද, සීතල යුද්ධ සමය තුළදී සංඛ්‍යාත්මක වශයෙන් වැඩි දියුණු වූ සිවිල් යුද්ධ සඳහාත් ජාතික විමුක්ති අරගලය සඳහා සිදු කළ යුද්ධ සඳහාත් බලපවත්වන නීති සඳහා අවශ්‍යතාවක් පැන නැඟිණි. අනෙක් අතට, 1907 හේග් රෙගුලාසි සිට ඒ වනතෙක් සතුරු ක්‍රියාකලාපයට අදාළ ගිවිසුම් නීතිය වැඩි දියුණු වීමක් ද සිදු නොවුණි. ජිනීවා සම්මුතීන් සංස්කරණය කිරීම, 1949 දී සිදු කළ යම් යම් ප්‍රගමනයන් උවදුරෙහි හෙළීමක් විය හැකි බැවින්, ජිනීවා සම්මුතීන් සඳහා අතිරේක සන්ධාන ආකෘතියෙන් නව ලේඛනයන් සම්මත කරගැනීමට තීරණය වූ අතර එය 1977 ජූනි මස දී සිදු කරන ලදි.

2005 වර්ෂයේදී ජිනීවා සම්මුති සඳහා තෙවන අතිරේක සන්ධානයක් සම්මත කරගන්නා ලදි. සුදු පැහැති පසුබිමක් තුළ කෙළවරයන් හතරැස් හැඩයක් ගත් රතු පැහැති රාමුවකින් සමන්විත, අතිරේක ලාංඡනයක් මෙම නෛතික ලේඛනය මඟින් හඳුන්වා දුන් අතර එය “රතු පළිගුව” යනුවෙන් පසුව ප්‍රසිද්ධ විණි. මෙම අතිරේක ලාංඡනය, රතු කුරුසය සහ රතු අඩසඳ ප්‍රතිස්ථාපනය කිරීම අරමුණු කරගත්තක් නොව, වැඩිදුර විකල්පයක් සැපයීම දක්වන්නකි. මෙම අතිරේක ලාංඡනයේ හැඩය සහ නාමය, දිගුකාලීන තේරීම් ක්‍රියාවලියකින් පසුව තීරණය කරගත්තක් වූ අතර, ඉලක්කය වූයේ කිසිදු දේශාලනික, ආගමික හෝ වෙනත් ඇඟවීම් වලින් නිදහස් වූ සහ ලෝකය පුරා භාවිතා කළ හැකි ලාංඡනයක් නිර්මාණය කිරීමයි. (13 වන ප්‍රශ්නය බලන්න.)

## ජිනීවා සම්මුති සහ අතිරේක සන්ධාන වල අන්තර්ගතය

එදිරිවාදීකම් සඳහා සහභාගී නොවන හෝ තවදුරටත් සක්‍රීයව සහභාගී නොවන සෑම පුද්ගලයෙකුම හෝ පුද්ගල කණ්ඩායමක්ම **ජිනීවා සම්මුති** මඟින් ආරක්ෂා කරයි:

- පළමු ජිනීවා සම්මුතිය: ගොඩබිමේදී තුවාලවූ හෝ රෝගීවූ යුද භටයින්, සන්නද්ධ බලකා සහ වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින්
- දෙවන ජිනීවා සම්මුතිය: මුහුදේදී තුවාලවූ, රෝගීවූ හෝ නැව් මුහුදුබත්වූ යුද භටයින්, නාවික බලකා සහ වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින්
- තෙවන ජිනීවා සම්මුතිය: යුද සිරකරුවන්
- සිව්වන ජිනීවා සම්මුතිය: සිවිල් වැසියන් :
  - සරණාගතයින්ද ඇතුළුව, ගැටුමට අදාළ පාර්ශවයන්ගේ භූමි ප්‍රදේශය තුළ සිටින විදෙස් ජාතික සිවිල් වැසියන්
  - ග්‍රහණයට නතු කරගත් භූමි ප්‍රදේශ තුළ සිටින සිවිල් වැසියන්
  - සිවිල් රැඳවියන් සහ පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීමට භාජනය වූවන්
  - ආගමික සහ වෛද්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් හෝ සිවිල් ආරක්ෂක ඒකක.

පොදු 3 වන වගන්තිය මඟින් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අවම ආරක්ෂණය සපයයි. ඉතා කුඩා ස්වරූපයේ සම්මුතියක් ලෙස මෙය සලකන අතර, එමඟින් ගැටුමක පාර්ශවයන් විසින් කිසිදු ලෙසකින් හෝ නික්ම නොවිය යුතු අවම මිනුමක් ඉදිරිපත් කරයි. පොදු 3 වන වගන්තිය තුළ අන්තර්ගත නීතින් චාරිත්‍රානුකූල නීති ලෙස හඳුන්වනු ලබයි. (කොටුව බලන්න.)

අන්තර්ජාතික සන්නද්ධ ගැටුමට අදාළව ජිනීවා සම්මුති හතර මඟින් සලසා දෙන ලද ආරක්ෂණය, පළමු අතිරේක සන්ධානය මඟින් පරිපූරණය කරයි. නිදසුනක් ලෙස, එමඟින් තුවාලවූ, රෝගීවූ සහ නැව් මුහුදුබත්වූ සිවිල් සහ සිවිල් වෛද්‍ය නිලධාරීන්හට ආරක්ෂණය සපයයි. අතුරුදහන්වූවන් සෙවීමට සහ සිවිල් ජනගහනය සඳහා මානුෂීය ආධාර සැපයීමට ඇති බැඳීමට අදාළවද එහි නීති අන්තර්ගත වේ. සියලුම පුද්ගලයින් සඳහා ඔවුනගේ තරාතිරම නොබලා මූලික ආරක්ෂණයන් මෙමඟින් සපයයි. මීට අමතරව, එදිරිවාදී ක්‍රියාකාරකම් මඟින් සිවිල් ජනගහනය මත ඇති වන ප්‍රතිවිපාක වලට එරෙහි ආරක්ෂණයට අදාළ නීති කිහිපයක්ම පළමු අතිරේක සන්ධානය මඟින් සංග්‍රහගත කර තිබේ.

දෙවන අතිරේක සන්ධානය මඟින් පොදු 3 වන වගන්තිය වැඩි දියුණු කිරීම සහ පරිපූරණය කිරීම සිදු කරන අතර, රාජ්‍යයක සන්නද්ධ බලකා සහ "විරුද්ධවාදී සන්නද්ධ බලකා හෝ අනෙකුත් සංවිධානාත්මක සන්නද්ධ කණ්ඩායම් එනම්, ස්ථිර සහ සහසිත යුද මෙහෙයුම් ක්‍රියාත්මක කළ හැකි අයුරින් සහ මෙම සන්ධානය ක්‍රියාවට නැංවිය හැකි පරිද්දෙන් භූමි ප්‍රදේශය තුළ යම් කොටසක පාලනය ගෙන යනු ලබන, වගකිව යුතු අණ දීමක් සහිතව ක්‍රියාත්මක වන කණ්ඩායම්" අතර හට ගනු ලබන අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ වේ. (දෙවන අතිරේක සන්ධානය අදාළ කරගැනීම පිළිබඳ කොන්දේසි සම්බන්ධව, 5 වන ප්‍රශ්නය බලන්න.) සිවිල් වැසියන් ඉලක්ක කරමින් ඍජුවම ප්‍රහාර එල්ල කිරීම, සාමූහික දඬුවම් නියම කිරීම, ත්‍රස්තවාදී ක්‍රියා, ස්ත්‍රී දූෂණය, බලහත්කාරයෙන් ගණිකා වෘත්තියේ යෙදවීම සහ අසභ්‍ය අඩත්තේට්ටම්, වහල් සේවය සහ කොල්ලකෑම් යනාදී බොහෝ දෑ තහනම් කරමින් පොදු 3 වන වගන්තිය තුළ වන අවම ආරක්ෂණයන් අභිබවා යමින් ආරක්ෂාව වඩා ශක්තිමත් කිරීම දෙවන අතිරේක සන්ධානය මඟින් සිදු කරයි. තවද, එමඟින් නිදහස අහිමි කරන ලද පුද්ගලයින්ගේ සැලකීමට අදාළව නීති සපයයි.

## පොදු 3 වන වගන්තිය

යම් ගිවිසුම්කාර පාර්ශවයක භූමි ප්‍රදේශය තුළ හටගනු ලබන අන්තර්ජාතික ස්වරූපයේ නොවන සන්නද්ධ ගැටුම් වලදී, ගැටුමට අදාළ සෑම පාර්ශවයක් විසින් ම අවම වශයෙන් පහත සඳහන් විධිවිධානයන් අදාළ කරගැනීමට බැඳේ;

1) අවි බිම තබා ඇති සන්නද්ධ බලකා සාමාජිකයින් සහ රෝග, තුවාල, රඳවා තබා ගැනීම්, හෝ වෙනත් හේතුවක් මත hors de combat තත්වයට පත් තැනැත්තන් ද ඇතුළුව, එදිරිවාදී ක්‍රියා සඳහා සක්‍රීය දායකත්වය නොදක්වන සියලුම පුද්ගලයින්හට ජාතිය, සමේ පැහැය, ආගම හෝ ඇදහීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, උපත හෝ ධනය, හෝ එවැනි වෙනත් කිසිදු නිර්ණායකයක් මත සිදු කරන එදිරිවාදී වෙනස් කොට සැලකීමකින් තොරව සෑම අවස්ථාවකදීම මානුෂීයව සැලකිය යුතුය.

එකී අරමුණ යථාවත් කරගැනීම උදෙසා, ඉහත සඳහන් පුද්ගලයින්ට ගරු කිරීම පිණිස පහත දැක්වෙන ක්‍රියා අනිවාර්යයෙන්ම සෑම කලකම, ඕනෑම ස්ථානයකදී තහනම්ව පැවතිය යුතුය:

(අ) ජීවිතයට හා පුද්ගලයාට එරෙහි ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන්ම සෑම ආකාරයකම මිනීමැරීම, අංග ඡේදනය, කෲර ලෙස සැලකීම සහ දරුණු වධ හිංසා පමුණුවීම;

(ආ) ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගැනීම;

(ඇ) පුද්ගල ගරුත්වයට බලපාන අයුරින් සාහසිකව ක්‍රියා කිරීම, විශේෂයෙන්ම නින්දා පමුණුවන සහ අවමන් සහගත සැලකීම;

(ඈ) ක්‍රමවත්ව ස්ථාපනය කරන ලද අධිකරණයකින් ලබා දුන් පූර්ව නඩු තීන්දුවක් නොමැතිව, ශිෂ්ට සම්පන්න පුද්ගලයින් විසින් අත්හළ නොහැකි ලෙස හඳුනාගන්නා සියලු අධිකරණ සුරක්ෂණයන් උවදුරෙහි හෙළමින් දඬුවම් නියම කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2) තුවාල වූවන් සහ රෝගී වූවන් එක්රැස් කරගත යුතු අතර ඔවුනට රැකවරණය සැපයිය යුතුය

- අන්තර්ජාතික රතු කුරුස කමිටුව වැනි අපක්ෂපාතී මානුෂීය සංවිධානයක් විසින් ගැටුමට පාර්ශව වන පාර්ශවකරුවන්ට සිය සේවා ලබා දිය හැකිය.
- විශේෂ ගිවිසුම් ආකාරයෙන් පවතින සම්මුතියෙහි සියලුම විධිවිධාන හෝ ඉන් කොටසක් බලාත්මක කරගැනීම සඳහා ගැටුමට සම්බන්ධ සෑම පාර්ශවයක්ම වැඩිදුර ප්‍රයත්න දැරිය යුතුය.
- පූර්වගාමී විධිවිධානයන්ගේ භාවිතය මඟින් ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ගේ නෛතික තත්වය සඳහා බලපෑම් නොකළ යුතුය.




# 7. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ආරක්ෂා කරන්නේ කාවද?

සිවිල් වැසියන් සහ තම අවි බිම තබා ඇති යුද හටයින්ද ඇතුළුව, සන්නද්ධ ගැටුම් වල සියලුම වින්දිතයින්ව අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ආරක්ෂා කරයි. ආරක්ෂණයේ ස්වභාවය විවිධාකාර වන අතර, එය තීරණය වනුයේ ප්‍රශ්නගත පුද්ගලයා යුද හටයෙක්ද සිවිල් වැසියෙක්ද යන්න මතයි.

## අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්

### සිවිල් වැසියන්

සිවිල් වැසියන් විසින් ආරක්ෂාව සඳහා එකිනෙකට වෙනස් අවස්ථා දෙකකදී හිමිකම් ලබයි. පළමුව, ඔවුන් විසින් එදිරිවාදීකම් හමුවේ හටගනු ලබන තර්ජනයන්ට එරෙහි පොදු ආරක්ෂණය භුක්ති විඳියි. (11 වන ප්‍රශ්නය බලන්න.) යුද හටයින් නොවන සියලුම පුද්ගලයින් සිවිල් වැසියන් ලෙස නිර්වචනය කරන අතර, (පහත දැක්වෙන “යුද හටයින්” සඳහා ඇති නිර්වචනය බලන්න) ඔවුන් ප්‍රහාර සඳහා ඉලක්ක නොවිය යුතුය. මේ නීතිය සඳහා ඇති එකම ව්‍යතිරේකය වනුයේ එදිරිවාදීකම් සඳහා ඍජුව සහභාගී වන සිවිල් වැසියන්, නිදසුනක් ලෙස, සතුරාට එරෙහිව ආයුධ අතට ගන්නා සිවිල් වැසියන් වේ. මෙවැනි අවස්ථාවලදී, ප්‍රහාර සඳහා ඔවුන් ඉලක්ක විය හැකි නමුදු, එම තත්වය ඔවුන් විසින් ඍජුව එදිරිවාදීකම් සඳහා සහභාගී වනතාක් පමණක් විය යුතුය. (11 වන ප්‍රශ්නය බලන්න.)

දෙවනුව, ගැටුමට සම්බන්ධ පාර්ශවයකගේ ග්‍රහණයේ සිටින සිවිල් වැසියන් මින්මතු දැක්වෙන පුද්ගල කාණ්ඩවලට අයත්වන්නේ නම්, අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ "ආරක්ෂිත පුද්ගලයින්" වේ:

- ඔවුන් එම සතුරු රාජ්‍යයේ ජාතිකයින් නොවන විට
- ඔවුන් එම සතුරු රාජ්‍යයේ මිත්‍ර පාර්ශවයක ජාතිකයින් නොවන විට (මෙම රාජ්‍යයන් දෙක විසින් සාමාන්‍ය රාජ්‍යතාන්ත්‍රික සබඳතා භුක්ති නොවිඳින්නේ නම් මිස)
- ඔවුන් මධ්‍යස්ථ රාජ්‍යයක ජාතිකයින් නොවන විට, එනම්, යුද්ධයක යෙදී සිටින රාජ්‍යයක් නොවන විට (මෙම රාජ්‍යයන් දෙක විසින් සාමාන්‍ය රාජ්‍යතාන්ත්‍රික සබඳතා භුක්ති නොවිඳින්නේ නම් මිස). කෙසේ වුවද, අල්ලා ගත් භූමි ප්‍රදේශයක සිටින, මධ්‍යස්ථ රාජ්‍යයක ජාතිකයින් සෑම විටම ආරක්ෂිත පුද්ගලයින් වේ.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් මෙම සිවිල් වැසියන් ආරක්ෂා කළ යුතු ලෙස දැක්වීමේ තර්කණය වනුයේ ඔවුන් තවදුරටත් තම රාජ්‍යයෙහි ආරක්ෂාව භුක්ති නොවිඳීමයි - මීට හේතුව එක්කෝ එම රාජ්‍යය සිවිල් වැසියන් ග්‍රහණයට නතු කරගත් රාජ්‍යය හා යුද වැදී සිටින බැවිනි, නොඑසේ නම්, ඊට එම රාජ්‍යය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා නොපවතින බැවිනි. එදිරිවාදී පාර්ශවයකගේ සතුරා වෙත සිවිල් වැසියන්ගේ පැවතිය හැකි පක්ෂපාතීත්වය මත එදිරිවාදී පාර්ශවය විසින් සිදු කළ හැකි අත්තනෝමතික ක්‍රියා වලින් සිවිල් වැසියන් ආරක්ෂා කරගැනීමට ද අරමුණු කර ගනී.

සිය ජීවිත, සිය ගරුත්වය, සිය පුද්ගලික අයිතිවාසිකම් සහ ඔවුනගේ දේශපාලනික, ආගමික සහ අනෙකුත් විශ්වාසයන් කෙරෙහි ගරුත්වය සඳහා ආරක්ෂිත පුද්ගලයින් විසින් හිමිකම් ලබයි. වධ හිංසා පමුණුවීම්, කෲර හෝ පුද්ගලික ගෞරවයට සාහසික ලෙස නිගරු පමුණුවන සැලකීම් හෝ ශාරීරික දඬුවම් සඳහා ඔවුන් ලක් නොවිය යුතු අතර සියලුම ආකාරයේ ප්‍රචණ්ඩකාරී සහ පළිගැනීමේ ක්‍රියාවන්ට එරෙහිව ආරක්ෂා කළ යුතුය.

සිවිල් වැසියන් සතුරු හමුදාවක් විසින් අත්පත් කරගත් භූමි ප්‍රදේශයක සිටින විටෙක හෝ සිවිල් වැසියන්ව සන්නද්ධ ගැටුමකට අදාළ හේතුන් මත රඳවා තබා සිටින විටෙක ඔවුන් සිටිනුයේ අවදානමක බව කිව යුතු නොවේ. අත්පත් කරගත් භූමි ප්‍රදේශයක දී, ආරක්ෂිත පුද්ගලයින්හට ආහාර සහ වෛද්‍ය සැපයුම් ලබා දීමට එකී ග්‍රාහක බලය දරන පාර්ශවය වෙත විශේෂ බැඳීමක් පවතී. නෙරපීම් සහ බලහත්කාරයෙන් සිදු කරන මාරු කිරීම් තහනම්ය. දේපළ අහිමි කිරීම සහ අත්පත් කරගැනීම සම්බන්ධව ද නීති පවතී. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් නිදහස අහිමි කිරීමට ලක් වූ සිවිල් වැසියන් පිළිබඳව, විශේෂයෙන්ම, ඔවුන්ව රඳවා තබා ගැනීමට අදාළ තත්වයන්, ඔවුන් විසින් හිමිකම් කියන අධිකරණමය සහ ක්‍රියාපටිපාටිමය ආරක්ෂණයන්, සහ ඔවුන්ව නිදහස් කිරීමට අදාළව විස්තරාත්මක නීති සපයයි. (10 වන ප්‍රශ්නය බලන්න.)

## සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් නොවදින (hors de combat) යුද භටයින්

සීමාව ඉක්මවා යමින් සිදු කරන දැඩි විනාශකාරී තුවාල කිරීම් හෝ අනවශ්‍ය පීඩාවන්ට එරෙහිව යුද භටයින් විසින් ආරක්ෂණයක් භුක්ති වින්ද ද, එදිරිවාදී ක්‍රියාකාරකම් වල ප්‍රතිවිපාකයන්ට එරෙහිව ආරක්ෂණයක් ඔවුන්ට හිමි නොවේ. (12 වන ප්‍රශ්නය බලන්න.) එසේම, ඔවුහු hors de combat නොවන විට ඔවුනට එරෙහිව ප්‍රහාර එල්ල කළ හැකිය.

ගැටුමට සම්බන්ධ පාර්ශවයක සියලු සන්නද්ධ බලකා සාමාජිකයින් (ආගමික සහ වෛද්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් හැරුණු කොට) " සටන්කරුවන් " ලෙස නිර්වචනය කෙරේ.

සිය යටත් නිලධාරීන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් අදාළ පාර්ශවය වෙත වගකියනු ලබන අණ දීමක් යටතේ සිටින සියලුම සංවිධානාත්මක සන්නද්ධ බලකා, කණ්ඩායම් සහ ඒකකවලින් ගැටුමට සම්බන්ධ පාර්ශවයක සන්නද්ධ බලකා සමන්විත වේ. (පළමු අතිරේක සන්ධානයේ, ඡේද 1 සහ 2, 43 වන වගන්තිය බලන්න. චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳව ICRC මඟින් සිදු කළ අධ්‍යයනයේ 3 සහ 4 නීති තවදුරටත් බලන්න.) පෙනෙන පරිදි, මීට සාමාන්‍ය සන්නද්ධ බලකා සාමාජිකයින් ද ඇතුළත් වේ. එමෙන්ම, යුද පුහුණුව ලැබූ මහජන හමුදාවේ හෝ ස්වෙච්ඡා බල ඇණි වල සාමාජිකයින් (ඊනියා "අවිධිමත්" සන්නද්ධ බලකා) සහ සංවිධානාත්මක කැරලි ව්‍යාපාරයන්හි සාමාජිකයින් ද ඇතුළත් වේ. තෙවන ජිනීවා සම්මුතිය, පළමු අතිරේක සන්ධානයට වඩා දැඩි අතර එමඟින් අවිධිමත් සන්නද්ධ බලකා සාමාජිකයින් සහ සංවිධානාත්මක කැරලි ව්‍යාපාරයන්හි සාමාජිකයින් යුද සිරකරුවන් ලෙස සැලකිය යුතු බව දක්වමින් සුවිශේෂී අතිරේක කොන්දේසි සපයයි.

සතුරු පාර්ශවයක ග්‍රහණයේ සිටින යුද භටයින් විසින් යටත් වීම සඳහා වන සිය චේතනාව පැහැදිලිව පළ කරන විට, හෝ තමාව ආරක්ෂා කරගත නොහැකි අයුරින් තුවාල හෝ රෝගී තත්වයේ පසුවන විට දී යුද භටයින් hors de combat ලෙස සලකයි. මෙම සෑම අවස්ථාවකදී ම, කිසිදු එදිරිවාදී ක්‍රියාවක නියැලීමෙන් වැළකී සිටින විට සහ පලා යාම සඳහා තැත් නොකරන විට යුද භටයින් hors de combat වේ. යුද භටයෙකු විසින් hors de combat තත්වයට පත් වූ වහාම, ඔහුට නිසි සැලකීම ලබා දීමත් ඔහුව ආරක්ෂා කිරීමත් සිදු කළ යුතුමය.

තවදුරටත් පවසන්නේ නම්, අල්ලා ගැනීම, යටත් වීම, කොන්දේසි විරහිත සාමූහික යටත් වීම හෝ යම් වෙනත් හේතුවක් මත සතුරාගේ ග්‍රහණයට නතු වන විට දී යුද භටයින් "යුද සිරකරුවන්" යන තත්වය භුක්ති විඳියි. ඒ නිසාම, ඍජුවම එදිරිවාදී ක්‍රියාවන්හි නිරතවීම සම්බන්ධව ඔවුනට විරුද්ධව නඩු පැවරීමට හෝ දඬුවම් කිරීමට නොහැකිය. සත්‍ය ලෙසම, ඍජුවම එදිරිවාදී ක්‍රියාවන්හි නිරතවීම සඳහා අයිතියත් ඔවුනගේ සටන්කාමී ක්‍රියා වලට එරෙහිව නඩු පැවරීමෙන් මුක්තියත් යුද භටයින් භුක්ති විඳියි. කෙසේ නමුදු, ඔවුන් විසින් යුද අපරාධ සිදු කරන්නේ නම්, අනිවාර්යයෙන්ම ඒ සඳහා ඔවුන් වගකිව යුතු වන්නේය. (19 වන ප්‍රශ්නය බලන්න.)

මානුෂීය සැලකීම මෙන්ම තම ජීවිත, තම ගරුත්වය, සිය පුද්ගලික අයිතිවාසිකම් සහ ඔවුනගේ දේශපාලනික, ආගමික සහ අනෙකුත් විශ්වාසයන් කෙරෙහි ගරුත්වය සඳහාත් යුද සිරකරුවන් හිමිකම් ලබයි. ඔවුන් කිසිදු විටෙක වධ හිංසා පමුණුවීම්, කෲර හෝ පුද්ගලික ගෞරවයට සාහසික ලෙස නිගරු පමුණුවන සැලකීම් හෝ ශාරීරික දඬුවම් සඳහා ලක් නොවිය යුතු අතර සියලුම ආකාරයේ ප්‍රචණ්ඩකාරී සහ පළිගැනීමේ ක්‍රියාවන්ට එරෙහිව ආරක්ෂා කළ යුතුය. අන්තර්ජාතික මානුෂවාදී නීතිය තුළ යුද සිරකරුවන් ආරක්ෂා කිරීමට අදාළව සවිස්තරාත්මක නීති පවතින අතර විශේෂයෙන්ම, ඔවුන්ව රඳවා තබා ගැනීමට අදාළ තත්වයන්, ඔවුන් විසින් හිමිකම් කියන අධිකරණමය සහ ක්‍රියාපටිපාටිමය ආරක්ෂණයන්, සහ ඔවුන්ව නිදහස් කිරීම සහ නැවත සිය මව්රට වෙත යැවීම ඒ අතර වේ. (10 වන ප්‍රශ්නය බලන්න.)

## අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්

අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් කිසිදු සුවිශේෂී පුද්ගල කාණ්ඩයක් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ හඳුනා නොගනී. එකී තත්වය නිර්මාණය වී ඇත්තේ, ඍජුවම එදිරිවාදී ක්‍රියාවන්හි නිරතවීම සඳහා අයිතිය හිමි කර දෙන " සටන්කරුවන් " නම් තත්වය සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම්හි සාමාජිකයින් සඳහා ලබා දීමට රාජ්‍යයන්ට අවශ්‍ය නොවන බැවිනි. එම නිසා, පොදු 3 වන වගන්තිය සහ දෙවන අතිරේක සන්ධානය සරලව දක්වනුයේ එදිරිවාදීකම් සඳහා සක්‍රීයව සම්බන්ධ නොවන හෝ තවදුරටත් සහභාගී නොවන සියලුම තැනැත්තන් ආරක්ෂණය සඳහා හිමිකම් කියන බවයි. මෙමගින් සිවිල් වැසියන් සහ එදිරිවාදීකම් සඳහා තවදුරටත් ඍජුව සහභාගී නොවන පුද්ගලයින් ආරක්ෂා කිරීමට අන්තර්ජාතික මානුෂවාදී නීතියට අවකාශ සලසයි. මක්නිසාද යත්, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ " සටන්කරුවා " යන තත්වය හෝ යුද සිරකරුවා යන තත්වය නොමැති බැවිනි. මෙමගින් අදහස් වනුයේ එවැනි ගැටුමක දී අවි අතට ගෙන යුද වැදීම හේතුවෙන් සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් වල සාමාජිකයින්ට විරුද්ධව එසේ යුද වැදීම සම්බන්ධව දේශීය නීතිය යටතේ නඩු පැවරිය හැකි බවයි.

## තුවාල වූ, රෝගී වූ සහ නැව් මුහුදුබත් වූවන් සහ වෛද්‍ය සේවා සඳහා වන ආරක්ෂණය

තුවාල වූවන්, රෝගී වූවන් සහ මුහුදුබත් වූවන් විසින් ඔවුනගේ තත්වය නොතකා ආරක්ෂණය සඳහා හිමිකම් ලබයි. මෙම පුද්ගලයින්ව සෙවීමත්, එකතු කරගැනීමත්, ඔවුනට රැකවරණය සැපයීමත් ඔවුන්ව සිය ග්‍රහණයට නතු කරගත් ගැටුමට සම්බන්ධ පාර්ශවය විසින් කළ යුතුය. සෑම අවස්ථානුගත තත්වයකදීම, වෛද්‍ය නිලධාරීන් සහ වෛද්‍ය ඒකක, ප්‍රවාහන සහ උපකරණ ආරක්ෂා කිරීම කළ යුතු අතර ඔවුනට ගරු කළ යුතුය. සුදු පැහැති පසුබිමක දැක්වෙන රතු කුරුසය, රතු අඩසඳ හෝ රතු පළිඟුව වනාහි එවැනි පුද්ගලයින් සහ වස්තූන් ආරක්ෂා කළ යුතු බව ප්‍රදර්ශනය කරන සුවිශේෂී ලාංඡන වේ. (13 වන ප්‍රශ්නය බලන්න)

## විශේෂිත ආරක්ෂණය : කාන්තාවන් සහ ළමයින්

කාන්තාවන් සහ ළමුන් වැනි නිශ්චිත පුද්ගල කාණ්ඩහට සන්නද්ධ ගැටුම් තුළ සුවිශේෂී අවශ්‍යතා පවතින අතර ඔවුනට අදාළ ගරුත්වය සහ ආරක්ෂණය සැපයිය යුත්තේය.

ළමුන්හට ඔවුනට අවශ්‍ය රැකවරණය සහ ආධාර ලැබිය යුතුය. අවුරුදු 15 ට අඩු ළමුන් එදිරිවාදී ක්‍රියා සඳහා ඍජුව සහභාගී වීම වැළැක්වීම සඳහාත්, සන්නද්ධ ගැටුමක ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අනාථභාවයට පත්ව ඇත්නම් හෝ සිය පවුල කෙරෙන් දුරස්ථව ඇත්නම්, පාලනයකින් හෝ අධීක්ෂණයකින් තොර අනාරක්ෂිත තත්වයකට ළමුන් පත්ව නොමැති බව තහවුරු කිරීම සඳහාත් ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතුය. සෑම අවස්ථානුගත තත්වයකදී ම, ඔවුනගේ නඩත්තුව, ඔවුනට ආගම ඇදහීමට අවකාශය සහ ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා පහසුකම් සපයා දිය යුතුය. පවුල් ඒකක ලෙස පවුල්වලට නවාතැන් සපයා ඇති තත්වයන්හි දී හැර, නිදහස අහිමි කරන ලද ළමුන්ව, එබඳුම වැඩිහිටියන්ගෙන් වෙන්වූ වාසස්ථානවල නතර කර තැබිය යුතුය. ප්‍රශ්නගත අපරාධය අවුරුදු 18 ට අඩු තැනැත්තන් විසින් සිදු කර ඇති අවස්ථාවක දී ඔවුනට එරෙහි දඬුවම ලෙස මරණ දණ්ඩනය ක්‍රියාත්මක නොකළ යුතුය.

සන්නද්ධ ගැටුමක බලපෑම ලත් කාන්තාවන්ගේ විශේෂිත ආරක්ෂණය, සෞඛ්‍ය සහ සහය අවශ්‍යතා පිළිබඳව සලකා බැලිය යුතුය. ගැබිණි කාන්තාවන් සහ තරුණ මව්වරුන්හට නිසි රැකවරණය දෙමින් සැලකීම සිදු කළ යුතුය. ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහි තහනම පුරුෂ සහ ස්ත්‍රී පාර්ශවය සඳහා එක සමාන ලෙසින් අදාළ නමුදු, සන්නද්ධ ගැටුම් තුළදී සිදු වන ලිංගික ප්‍රචණ්ඩත්වයේ ප්‍රබලතම පීඩාව බොහෝ විට විඳිනුයේ කාන්තාවන් විසිනි. එනිසාම, සියලු ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වයන්ගෙන් ආරක්ෂා වීම සඳහා කාන්තාවන්ට සුවිශේෂී අවශ්‍යතාවක් පැන නගින අතර, එය ඉටු කළ හැකි ආකාරයන්ට නිදසුනක් ලෙස, ඔවුන්ගේ නිදහස අහිමි කර ඇති විට දී, පවුල් ඒකක ලෙස පවුල්වලට නවාතැන් සපයා ඇති තත්වයන්හි දී හැර, කාන්තාවන්ව පිරිමින්ගෙන් වෙන් කොට තැබීම දැක්විය හැකිය. එමෙන්ම, කාන්තාවන්, ඍජු කාන්තා අධීක්ෂණයක් යටතේ මිස පුරුෂ අධීක්ෂණයක් යටතේ නොතැබිය යුතුය.

## තත්වය නොතකමින් පිරිනමන මූලික ආරක්ෂණයන්

ඉහත විස්තර කළ ආරක්ෂණයන්ට අමතරව, අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් සියලුම hors de combat පුද්ගලයින් සඳහා ඔවුනගේ තත්වය නොතකමින් නිශ්චිත මූලික ආරක්ෂණයන් සපයයි. (පළමු අතිරේක සන්ධානයේ 75 වන වගන්තිය; දෙවන අතිරේක සන්ධානයේ 4 වන වගන්තිය).

සියලුම පුද්ගලයින්ගේ පුද්ගල ගරුත්වය, විශ්වාසයන් සහ ආගමික ඇදහීම් සඳහා ගරු කළ යුතුය. පහත දැක්වෙන ක්‍රියා විශේෂයෙන්ම, කිසිදු අවස්ථානුගත අවස්ථාවකදී ම, සිවිල් හෝ හමුදා කිසිදු නියෝජිතයෙකු විසින් සිදු කිරීම තහනම්ය:

අ) පුද්ගලයින්ගේ ජීවිතය, සෞඛ්‍ය සහ කායික හෝ මානසික යහපැවැත්මට එරෙහි ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන්ම:

- මිනී මැරීම
- කායික හෝ මානසික වධ හිංසා පමුණුවීම
- ශාරීරික දණ්ඩනය
- අංග ඡේදනය

ආ) පුද්ගලික ගෞරවයට සිදු කරන සාහසික ක්‍රියා, විශේෂයෙන්ම අවමන් කිරීම් සහ නිගරු පමුණුවන සැලකීම්, ස්ත්‍රී දූෂණය, බලහත්කාරයෙන් ගණිකා වෘත්තියේ යෙදවීම සහ ඕනෑම ආකාරයක අසභ්‍ය අඩත්තේට්ටම්

ඇ) ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගැනීම

ඈ) සාමූහික දඬුවම්

ඉ) ඉහත සඳහන් ක්‍රියා සිදු කිරීමට කරන තර්ජනයන්

අවසානාත්මක වශයෙන් දක්වන්නේ නම්, සන්නද්ධ ගැටුමෙහි බලපෑම ලත් පුද්ගලයින්ට ප්‍රදානය කර ඇති මූලික ආරක්ෂණයන්ට යම් නිශ්චිත ක්‍රියාපටිපාටිමය සහ අධිකරණමය සුරක්ෂාවන් ද ඇතුළත් වේ. (පළමු අතිරේක සන්ධානයේ 75 වන වගන්තිය; දෙවන අතිරේක සන්ධානයේ 6 වන වගන්තිය).




# 8. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් බැඳෙන්නේ කවුද?

සන්නද්ධ ගැටුමකට සම්බන්ධ සෑම පාර්ශවයක්ම, රාජ්‍යයක් හෝ සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමක් ද යන්න නොතකා, ගිවිසුම් මඟින් සහ අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතීන් මඟින් බැඳේ. අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම් මත පාර්ශවයන්ගේ අපරානුමත කිරීම නොතකා, සියලුම පාර්ශව සඳහා සෑම අවස්ථාවකදී ම අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීති බලපවත්වයි.

## රාජ්‍ය සහ රාජ්‍ය සතු බැඳීම්

ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන වැනි ජාත්‍යන්තර ගිවිසුම් සඳහා පාර්ශව වනුයේ රාජ්‍යයන් පමණි. 2013 වර්ෂයේ නොවැම්බර් මස වන විට ජිනීවා සම්මුති සඳහා රාජ්‍යයන් 195 ක් පාර්ශව වී තිබුණි. විශාල රාජ්‍යයන් ප්‍රමාණයක් අපරානුමත කිරීම හේතුවෙන් විශ්වීය වශයෙන් සම්මුති සඳහා හිමිව ඇති වටිනාකම ඉන් තහවුරු කරයි. 2014 වර්ෂයේ මාර්තු මස වන විට, රාජ්‍යයන් 173 ක් පළමු අතිරේක සන්ධානය සඳහා ද, රාජ්‍යයන් 167 ක් දෙවන අතිරේක සන්ධානය සඳහා සහ රාජ්‍යයන් 66 ක් තෙවන අතිරේක සන්ධානය සඳහා පාර්ශවකරුවන් විණි.

## සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සහ ඔවුන් සතු බැඳීම්

සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් අයිති රාජ්‍යය ප්‍රශ්නගත ගිවිසුම් සඳහා පාර්ශවයක් වන්නේ නම්, සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක පාර්ශව ලෙස පොදු 3 වන වගන්තිය සහ දෙවන

අතිරේක සන්ධානය මගින් බැඳේ. (එහි භාවිතය සඳහා ඉඩ ප්‍රස්ථාව විවරව ඇත්නම් - 5 වන ප්‍රශ්නය බලන්න.) ඕනෑම අවස්ථාවකදී, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමට අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතීන් මගින් ද ඔවුන් බැඳේ.

## ජාතික විමුක්ති ව්‍යාපාර

යටත්විජිත ආධිපත්‍යයට, විජාතික අධිවාසයට සහ තමන් නියෝජනය කරන ජනතාවගේ ස්වයං නිර්ණ අයිතිය මත සිටිමින් ජාතිවාදී රෙජිමයන්ට එරෙහිව සටන් වදින ජාතික විමුක්ති ව්‍යාපාර ජිනීවා සම්මුති සහ පළමු අතිරේක සන්ධානය (එනම්, අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීතිය) අනුකූල කරගැනීමට සන්ධාපනලාභියාව එනම්, ස්විස්ටර්ලන්ත ෆෙඩරල් කවුන්සිලය ආමන්ත්‍රණය කරමින්, ඒකපාර්ශවීය ප්‍රකාශනයක ආකාරයෙන් එකඟ විය හැකිය. (පළමු අතිරේක සන්ධානයේ 1 වන වගන්තිය, 4 වන ඡේදය, සහ 3 වන ඡේදය, 96 වන වගන්තිය බලන්න.)

## එක්සත් ජාතීන් විසින් හෝ එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ ගෙන යනු ලබන සාම මෙහෙයුම් සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ වන්නේද?

සාම මෙහෙයුම් වල පවතින බහු ආංශික ස්වරූපයත් එකී මෙහෙයුම් ක්‍රියාත්මක කෙරෙන ඉතා දුෂ්කර සහ ප්‍රචණ්ඩකාරී පරිසරයත් හේතුවෙන් අනුමාන කළ හැකි කරුණක් වනුයේ එම මෙහෙයුම් පවත්වාගෙන යනු ලබන බහුජාතික හමුදාවන් බලය යෙදවීම කෙරෙහි යොමු වීමට හැකි බවයි. එවැනි අවස්ථාවල දී, අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළත්වය පිළිබඳ ප්‍රශ්නය ඉතා වැදගත්කමක් දරයි.

බහුජාතික හමුදා සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළත්වය පිළිබඳ ප්‍රශ්නය බොහෝ කාලයක සිට නොසලකා හරින ලද්දකි. එක්සත් ජාතීන්ගේ හමුදා සන්නද්ධ ගැටුමක පාර්ශවයක් විය නොහැකි බවට බොහෝ අවස්ථා වලදී තරයේ ප්‍රකාශ කරන ලද අතර එනිසාම අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් බැඳ තැබිය නොහැකි වේ. තවදුරටත් තහවුරු කරන ලද කරුණක් වනුයේ ජාත්‍යන්තර සුජාතභාවයේ මුද්‍රාව ලෙස දක්වන බහුජාතික හමුදාවන්හි ඕනෑම සන්නද්ධ ගැටුමක් තුළ ඔවුනගේ එකම අභිප්‍රාය ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව යථාවත් කිරීම සහ සංරක්ෂණය කිරීම වන බැවින් ඔවුන්ව අපක්ෂපාතී, විෂය මූලික සහ මධ්‍යස්ථ හමුදාවන් ලෙස හැඳින්විය යුතු බවයි.

අදාළ කරුණ සම්බන්ධ මෙම මතය, කෙසේ වුවද, jus ad bellum සහ jus in bello අතර පවතින විරාගත වෙනසත් සමඟ මඟ හැරී යයි. අන් අයට මෙන්ම, බහුජාතික හමුදා සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළත්වය තීරණය කළ යුත්තේ ආරක්ෂක කවුන්සලය විසින් බහුජාතික හමුදා වෙත පවරා දී ඇති ජාත්‍යන්තර වරය සහ පාර්ශවයන්ට දී ඇති තනතුර සලකමින් නොව සම්පූර්ණයෙන්ම කරුණු වල පදනම සලකා බැලීමෙනි.

අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක, පාර්ශවයක් බවට බහුජාතික හමුදා පත් වූ විට ඔවුනට අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ වේ. බහුජාතික හමුදා රාජ්‍යයක සන්නද්ධ බලකා වලට එරෙහිව සටන් වදින විට දී අනුකූල නෛතික රාමුව වනුයේ අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීතියයි. එකක් හෝ එකකට වඩා වැඩි සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් ඔවුනට විරුද්ධව සටන් වදින විට අනුකූල නෛතික රාමුව වනුයේ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීතියයි.

## සාම සාධක සහ සාමය බලගැන්වීමේ මෙහෙයුම්

සාම මෙහෙයුම් බොහෝ විට කාණ්ඩ දෙකකට බෙදා වෙන් කරයි: සාම සාධක මෙහෙයුම් සහ සාමය බලගැන්වීමේ මෙහෙයුම්.

**සාම සාධක** මෙහෙයුම්හි අරමුණ වනුයේ සටන් විරාම සහ සීමා නිර්ණය සඳහා ගරුත්වය තහවුරු කිරීමත් හට පිරිස් නැවත මව්රට වෙත කැඳවීමේ ගිවිසුම් අවසන් කිරීමත් වේ. පසුගිය වසර කිහිපය තුළ, මැතිවරණ අධීක්ෂණය, මානුෂීය සහන ප්‍රදානය, සහ ජාතික සංහිඳියා ක්‍රියාවලිය සඳහා සහය සැපයීම වැනි අනෙකුත් කාර්යයන් ආවරණය කිරීම සඳහා සාම සාධක මෙහෙයුම්හි විෂයපථය පුළුල් වී තිබේ. සාම සාධක හමුදා සාමාජිකයින්හට බලය යෙදවීම සඳහා බලය පවරා ඇත්තේ ආත්ම ආරක්ෂාවට අදාළ අරමුණු සඳහා පමණි. මෙම මෙහෙයුම් ක්‍රියාත්මක වනුයේ ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ගේ අනුමතිය මතය.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි 7 වන පරිච්ඡේදය යටතේ දැක්වෙන **සාමය බලගැන්වීමේ** මෙහෙයුම්, අදාළ රාජ්‍යයේ ආරාධනය මත හෝ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයේ අවසරය මත එක්සත් ජාතීන්ගේ හමුදා හෝ රාජ්‍යයන්, රාජ්‍යයන් කිහිපයක කණ්ඩායමක් හෝ ප්‍රාදේශීය සංවිධාන විසින් පවත්වා ගෙන යනු ලබයි. මෙම බලකාහට ලැබෙනුයේ සටන් ක්‍රියාන්විතයක් වන අතර, තමන් ලද වරය ක්‍රියාත්මක කොට පවත්වා ගෙන යාම සඳහා බලහත්කාරී ක්‍රියාමාර්ග භාවිතා කිරීම සඳහා ඔවුනට බලය ලබා දී තිබේ. මෙම මෙහෙයුම් සඳහා පාර්ශවයන්ගේ අනුමතිය අවශ්‍ය නොවේ.

සාම මෙහෙයුම් මඟින් බොහෝ විට සාම සාධක සහ සාමය බලගැන්වීමේ මෙහෙයුම් යන ද්විත්වය සඳහාම සංකේතාත්මක වන කාර්යයන් සිදු කරන බැවින් මෙම මෙහෙයුම් වර්ග දෙක අතර වෙනස මෑතකාලීන වසර කිහිපය තුළදී, අපැහැදිලි ස්වරූපයක් ගන්නා ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස, සාම ආධාර මෙහෙයුම් සහ සාම මෙහෙයුම් යන වඩා පොදු යෙදුම් වර්තමානය වන විට දී වැඩි වශයෙන් භාවිතා වේ.

සාම මෙහෙයුම් වරයේ ස්වභාවය සහ එහි නිල නාමයේ - සාම සාධක හෝ සාමය බලගැන්වීමේ - බලපෑමක් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළතාවය කෙරෙහි නොමැති අතර එය තීරණය වනුයේ කරුණු සහ අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීති විධිවිධාන, විශේෂයෙන්ම, පොදු 2 සහ 3 වගන්ති මඟින් දක්වා ඇති සන්නද්ධ ගැටුම් සඳහා වන නිර්ණායක පූරණය කර තිබීම මතයි.

## අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීමට සහ ගරු කිරීම තහවුරු කිරීම සඳහා වන බැඳීම

අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ බැඳීම් ඇත්තේ ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ට පමණක් නොවේ. සියලුම රාජ්‍ය සහ සමස්තයක් ලෙස, ජාත්‍යන්තර ප්‍රජාව අන්තර්ජාතික මානුෂවාදී නීතියට "ගරු කිරීම සහ ගරු කිරීම තහවුරු කිරීම" කළ යුතුය.

මෙම ප්‍රකාශය පොදු පළමු වගන්තිය තුළ දැකිය හැක. එහි මෙලෙස දැක්වේ: "සෑම අවස්ථානුගත තත්වයකදීම ගිවිසුම්කාර පාර්ශවයන් විසින් පවතින සම්මුතියට ගරු කිරීමටත් සහ ගරු කිරීම තහවුරු කිරීමටත් බැඳේ. (පළමු අතිරේක සන්ධානයේ 1 ඡේදය, 1 වගන්තිය බලන්න.)

ගැටුමට සම්බන්ධ පාර්ශවයන් විසින් ගරු කිරීමටත් සහ ගරු කිරීම තහවුරු කිරීමටත් ඇති බැඳීම චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය තුළ ද දක්නට ලැබේ. (චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ICRC අධ්‍යයනයේ 139 වන රීතිය බලන්න.)

- "ගරු කිරීම" යන්නෙන් අදහස් වනුයේ අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම් වල පාර්ශවයන් විසින් මෙම ගිවිසුම් සද්භාවයෙන් යුතුව අදාළ කරගැනීමයි.
- "ගරු කිරීම තහවුරු කිරීම" යන්නට වඩා පුළුල් අර්ථයක් තිබේ: සියලු දෙනා විසින්, විශේෂයෙන්ම ගැටුමකට සම්බන්ධ පාර්ශවයන් විසින් සහ ගැටුමකට සම්බන්ධ හෝ සම්බන්ධ නැති, අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම්හි පාර්ශවයන්, සහ සමස්තයක් ලෙස, ජාත්‍යන්තර ප්‍රජාව විසින් නීතින් සඳහා ගරුත්වය තහවුරු කිරීමට ගත හැකි සෑම පියවරක්ම ගත යුතුය.

## ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධානයන් පිළිබඳව දැනුවත් කිරීම කාගේ වගකීමක්ද?

සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධානයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා රාජ්‍යයන්හට නෛතික බැඳීමක් පවතී:

"යුද කාලය තුළදී මෙන්ම සාම කාලය තුළදී ද, පවතින සම්මුතිය පිළිබඳව හැකි උපරිම අයුරින් සිය රාජ්‍යයන් දැනුවත් කිරීම සඳහා ගිවිසුම්කාර පාර්ශවයන් බැඳෙන අතර, විශේෂයෙන්ම, සිය හමුදා වැඩසටහන් තුළ සහ හැකියාවක් ඇත්නම්, සිවිල් පුහුණුව තුළ අධ්‍යයනය ඇතුළත් කිරීම මගින් එහි අන්තර්ගත මූලධර්ම පිළිබඳව සමස්ත ජනගහනයටම විශේෂයෙන්ම, සන්නද්ධ සටන් බලකා, වෛද්‍ය නිලධාරීන් සහ ආගමික පූජකයින්ට දැන ගත හැකි වේ." (පිළිවෙලින් පළමු සහ දෙවන ජිනීවා සම්මුතිවල 47 සහ 48 වගන්ති. වැඩිදුරටත් පිළිවෙලින් තෙවන සහ සිව්වන ජිනීවා සම්මුතිවල 127 සහ 144 වගන්ති බලන්න.)

"යුද කාලය තුළදී මෙන්ම සාම කාලය තුළදී ද, සම්මුති සහ මෙම සන්ධානය පිළිබඳව හැකි උපරිම අයුරින් සිය රාජ්‍යයන් දැනුවත් කිරීම සඳහා ගිවිසුම්කාර පාර්ශවයන් බැඳෙන අතර, විශේෂයෙන්ම, සිය හමුදා පුහුණු වැඩසටහන් තුළ අධ්‍යයනය ඇතුළත් කිරීම සහ සිවිල් ප්‍රජාව අතර අධ්‍යයනය දිරිමත් කිරීමත් එමගින් එම නෛතික ලේඛන පිළිබඳව සන්නද්ධ බලකා මෙන්ම සිවිල් ජනයා ද දැනුවත් විය හැකිය." (පළමු අතිරේක සන්ධානයේ 83 වන වගන්තිය බලන්න.)

"මෙම සන්ධානය හැකි උපරිම අයුරින් ප්‍රචාරණය කළ යුතුය." (දෙවන අතිරේක සන්ධානයේ 19 වන වගන්තිය බලන්න.)

# 9. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය අතර වෙනස කුමක්ද?

## අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යනු කුමක්ද?

මානව අයිතිවාසිකම් නීතිය යනු සිය රාජ්‍යයන් විසින් ගරු කළ යුතු සහ ආරක්ෂා කළ යුතු වන, එක් එක් පුද්ගලයින් සහ පුද්ගල කණ්ඩායම් විසින් බලාපොරොත්තු විය හැකි සහ/හෝ හිමිකම් කිව හැකි නිශ්චිත අයිතීන් මත පදනම්ව ගිවිසුම් හෝ චාරිත්‍ර මඟින් ස්ථාපනය වූ ජාත්‍යන්තර නීති සමුදායකි. අන්තර්ජාතික මානුෂවාදී නීති මීනුම් පද්ධතිය ද ගිවිසුම් මත පදනම් නොවූ නොයෙක් මූලධර්ම සහ මාර්ගෝපදේශ ('මෘදු නීතිය') වලින් සමන්විත වේ.

මානව අයිතිවාසිකම් නීතියේ ප්‍රධාන ගිවිසුම් පහත දැක්වේ:

අ) විශ්වීය නෛතික ලේඛන

- ජනසංහාර අපරාධ වැළැක්වීමේ සහ දඬුවම් කිරීමේ සම්මුතිය (1948)
- සියලු ආකාරයේ වාර්ගික වෙනස්කොට සැලකීම් මුළුමනින්ම තුරන් කිරීමේ සම්මුතිය (1965)
- සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
- ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
- ස්ත්‍රීන්ට එරෙහිව කෙරෙන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් මුළුමනින්ම තුරන් කිරීමේ සම්මුතිය (1979)
- වධහිංසා සහ වෙනත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් වලට එරෙහි සම්මුතිය (1984)
- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989)
- සියලුම සංක්‍රමණික සේවකයින් සහ ඔවුනගේ පවුල් වල සාමාජිකයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය (1999)
- බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලුම පුද්ගලයින් ආරක්ෂා කිරීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (2006)
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (2006)

ආ) කලාපීය නෛතික ලේඛන

- මානව හිමිකම් පිළිබඳ යුරෝපා සම්මුතිය (1950)
- මානව හිමිකම් පිළිබඳ ඇමෙරිකානු සම්මුතිය (1969)
- මානව සහ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය (1981)

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සඳහා වන මානව හිමිකම් කමිටුව සහ මානව හිමිකම් පිළිබඳ යුරෝපා සම්මුතිය සඳහා වන යුරෝපා අධිකරණය වැනි මානව හිමිකම් ආයතන මඟින් මෙම සම්මුතීන් අධීක්ෂණය කෙරේ.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය එකිනෙකට වෙනස් මාර්ග ඔස්සේ වර්ධනය වුවද, අන්තර්ජාතික මානුෂවාදී නීතියේ එන විධිවිධානයන් සමහර මානව අයිතිවාසිකම් ගිවිසුම් තුළ ඇතුළත් වේ: නිදසුනක් ලෙස, සන්නද්ධ ගැටුම් තුළ ළමුන්ගේ මැදිහත්වීම දක්වන ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ එහි වෛකල්පික සන්ධානය, මෙන්ම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ සම්මුතිය දැක්විය හැකිය.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යනු යම් සමාන අරමුණු ප්‍රමාණයක් හුවමාරු කරගන්නා අන්තර්ජාතික නීතිය සඳහා ඌනපූරණ සපයන නීති පද්ධති වේ. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යන නීති ද්විත්වයම එකිනෙකට වෙනස් පැතිකඩ ඔස්සේ ජීවිත, සෞඛ්‍ය සහ පුද්ගල ගරුත්වය ආරක්ෂා කිරීමට දැඩිව ප්‍රයත්න දරයි - සැකැස්මෙන් ඉතා වෙනස් වුවද, සමහර නීති වල හරය සමාන වනුයේ එබැවිනි. නිදසුනක් ලෙස, වධහිංසා හෝ කෲර ලෙස සැලකීම වැළැක්වීම, අපරාධ ක්‍රියාවලියට ලක් වූ පුද්ගලයින් සඳහා මූලික අයිතීන් නිර්දේශ කිරීම, වෙනස්කොට සැලකීම වැළැක්වීම, කාන්තාවන් සහ ළමුන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන ඇතුළත් කිරීම, සහ ආහාර සහ සෞඛ්‍ය සඳහා ඇති අයිතියට අදාළ අංග නියාමනය කිරීම වැනි කාර්යයන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යන නීතින් දෙකම විසින් සිදු කරයි. කෙසේ නමුදු, මෙම නීති ද්විත්වය අතර වැදගත් වෙනස්කම් පවතී: ඒවායේ මූලාරම්භයන්, ඒවා භාවිතා වන විෂය ක්ෂේත්‍රය, ඒවා බලාත්මක කරන ආයතන සහ මෙවැනි තවත් දෑ එවැනි වැදගත් වෙනස්කම්ය.

## මූලාරම්භයන්

ඉපැරණි ප්‍රභවයක් සහිත අන්තර්ජාතික මානුෂවාදී නීතිය 19 වන ශත වර්ෂයේ දෙවන භාගයේ දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ආරම්භක පියා වන හෙන්රි ඩූනන්ට්ගේ ආභාෂය යටතේ සංග්‍රහගත කර තිබේ. (6 වන ප්‍රශ්නය බලන්න.) මානව අයිතිවාසිකම් නීතිය මෑත කාලය තුළ ගොඩ නැගුණු නීති පද්ධතියකි: ප්‍රබුද්ධත්වය පිළිබඳ අදහස් වලින් බලපෑම්ලත් යම් නිශ්චිත මානව අයිතිවාසිකම් ප්‍රකාශනයන් තුළ එහි මූලාරම්භයන් ගැබ්ව තිබුණි (1776 එක්සත් ජනපද නිදහස් ප්‍රකාශනය සහ 1789 මිනිසාගේ සහ පුරවැසියාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය). මානව අයිතිවාසිකම් නීතිය ඉස්මතුවීමට පටන් ගත්තේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව, එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ ජාත්‍යන්තර නීතියේ ශාඛාවක් ලෙසිනි. නොබැඳි මහ සභා රැස්වීම් යෝජනා සම්මතයකින් ජාත්‍යන්තර මට්ටමෙන් 1948 මානව අයිතීන් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මඟින් ප්‍රථම වරට මානව අයිතිවාසිකම් නීතිය නිර්වචනය කරන ලදි. නමුදු මෙම ප්‍රකාශනය විශ්වීය මානව අයිතිවාසිකම් ගිවිසුම් බවට පරිවර්තනය වනුයේ 1966 දීය: 1966 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සහ 1966 ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය. (කොටුව බලන්න.)

## භාවිතයේ කාලීන ස්වභාවය

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සන්නද්ධ ගැටුම් සඳහා පමණක් අදාළ වුවද (5 වන ප්‍රශ්නය බලන්න), මානව අයිතිවාසිකම් නීතිය මූලධර්මයානුකූලව ගත් කළ සෑම කල්හිම අදාළ වේ. එනම්, සාම කාලයේ දී මෙන්ම සන්නද්ධ ගැටුම් අතරතුරේදී. කෙසේ වුවද, අන්තර්ජාතික මානුෂවාදී

නීතිය මෙන් නොව සමහර මානව අයිතිවාසිකම් ගිවිසුම් මගින් ජන ජීවිතයට තර්ජනයක් එල්ල වන මහජන හදිසි අවස්ථා වලදී යම් බැඳීම් කෙරෙන් විතැන්වීමට ආණ්ඩු වෙත අවසර ලබා දේ. මෙම විතැන් වීම, කෙසේ නමුත්, අර්බුදයට සාපේක්ෂව සමානුපාතික සහ අවශ්‍ය විය යුතු අතර, වෙනස් කොට සැලකීමේ පදනමක් මත හඳුන්වා නොදිය යුතු වනවා මෙන්ම අන්තර්ජාතික මානුෂවාදී නීතිය ද ඇතුළුව, අන්තර්ජාතික නීතියේ අනෙක් නීතීන් හා පරස්පර නොවිය යුතුය. සමහර මානව අයිතිවාසිකම් තුළින් කිසිදු ලෙසකින් විතැන් වීමක් සිදු කළ හැකි නොවේ: ඒ අතර, ජීවත්වීමට ඇති අයිතිය, වධහිංසා හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් වලට එරෙහි තහනම, වහල්කම සහ දාසකමට එරෙහි තහනම සහ අතීතයට බලපාන අපරාධ නීති පැනවීමට එරෙහි තහනම වේ.

## භාවිතයේ භූගෝලීය විෂය පථය

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය අතර පවතින තවත් එක් ප්‍රධාන වෙනසක් වනුයේ ඒවායේ දේශසීමා අභිබවූ ප්‍රවේශයයි. අනෙකෙකුගේ භූමි ප්‍රදේශය තුළ සන්නද්ධ ගැටුමකට සහභාගි වී සිටින එක් රාජ්‍යයක හෝ රාජ්‍ය කිහිපයක ක්‍රියාකලාපය නියාමනය කිරීම අරමුණු කරගැනීම මත, අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා අදාළ වන අන්තර්ජාතික මානුෂවාදී නීතිය දේශසීමා අභිබවා බලපවත්වන බවට විවාදයක් නැත. දේශසීමා අභිබවා යාමේ ලක්ෂණය සහිත අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා ද එම තර්කණයම අදාළ වේ: එවැනි ගැටුමක පාර්ශවයන්හට ගැටුම එක් රාජ්‍යයක භූමි ප්‍රදේශය අතික්‍රමණය කරන විට, සිය අන්තර්ජාතික මානුෂවාදී නීති බැඳීම් වලින් නිදහස් වීමට හැකියාවක් නැත. වැදගත් ප්‍රතිපක්ෂ අදහස් දරන්නන් සුළු පිරිසකගේ අදහස් හැරුණු කොට, සාමාන්‍ය පිළිගැනීම වනුයේ මානව අයිතිවාසිකම් නීතිය, අනෙකුත් කරුණු අතර, කලාපීය සහ අන්තර්ජාතික අධිකරණ විසින් ලබා දුන් තීරණ මත පදනම්ව දේශසීමා අභිබවා අදාළ වන බවයි. එම භාවිතයේ පැහැදිලි වපසරිය, කෙසේ නමුදු, තවමත් නිර්ණය කරගැනීමට තිබෙන්නකි. යම් රාජ්‍යයක් විසින් සිය පාලනය භූමි ප්‍රදේශයක් (නිද. අල්ලා ගැනීම) හෝ පුද්ගලයෙකු (නිද. රඳවා තබා ගැනීම) වටා යොදන විට දී, මානව අයිතිවාසිකම් නීතියේ දේශසීමා අභිබවූ භාවිතය පිළිබඳව මානව අයිතිවාසිකම් ආයතන සාමාන්‍යයෙන් පිළිගනී. කෙසේ වුවද, බලය යෙදීම පාලනය වන මානව අයිතිවාසිකම් ප්‍රතිමානයන්ගේ දේශසීමා අභිබවූ භාවිතය පිළිබඳ මානව අයිතිවාසිකම් නඩු නීතිය නිශ්චිත නැත.

## එක් එක් පුද්ගලයා කෙරෙහි අදාළ භාවිතයේ ස්වභාවය

අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් එදිරිවාදීකම් සඳහා ඍජුව සහභාගී නොවන සහ තවදුරටත් සටන් නොවදින පුද්ගලයින් ආරක්ෂා කිරීමට ප්‍රයත්න දරයි. එමගින් සිවිල් වැසියන් සහ තුවාල වූ, රෝගී වූ සහ නැව් මුහුදුබත් වූ හෝ යුද සිරකරුවන් වන hors de combat යුද භටයින් ආරක්ෂා කරයි. (7 වන ප්‍රශ්නය බලන්න.) සාම කාලය සඳහා මූලිකවම වර්ධනය වූ මානව අයිතිවාසිකම් නීතිය රාජ්‍යයක අධිකරණ බලය තුළ සිටින සෑම පුද්ගලයෙකුටම අදාළ වේ. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මෙන් යුද භටයින් සහ සිවිල් වැසියන් අතර වෙනසක් හෝ 'ආරක්ෂිත පුද්ගලයින්' යනුවෙන් වර්ගීකරණ සැපයීමක් හෝ ඉන් සිදු නොකරයි.




## අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය මඟින් බැඳෙන පාර්ශවයන්

ගැටුමට සම්බන්ධ සෑම පාර්ශවයක්ම අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් බැඳ තබන අතර, රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ ක්‍රියාකලාපය මඟින් බලපෑමට ලක් විය හැකි සියලු දෙනාගේම අභිවෘද්ධිය පිණිස එමඟින්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවයන් අතර අයිතීන් සහ බැඳීම් වල සමානාත්මතාවයක් ස්ථාපනය කරයි (අවශ්‍යයෙන්ම ‘තිරස්’ සබඳතාවක්). (8 වන ප්‍රශ්නය බලන්න). ඉතා පුළුල් වපසරියක විහිදුණු ක්‍රියාකලාපයක් වටා පුද්ගලයින්ට අදාළව රාජ්‍යයකට ඇති බැඳීම් දක්වන මානව අයිතිවාසිකම් නීතිය, රාජ්‍යයක් සහ එම රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ සිටින සහ/හෝ එහි අධිකරණ බලය යටතේලා ගැනෙන පුද්ගලයින් අතර (අවශ්‍යයෙන්ම ‘සිරස්’ සබඳතාවක්) පවතින සම්බන්ධතාවය පැහැදිලිවම පාලනය කරයි. එසේම, මානව අයිතිවාසිකම් ගිවිසුම් හෝ වෙනත් මානව අයිතිවාසිකම් ප්‍රමිති මූලාශ්‍රයන් මඟින් රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සඳහා නෛතික බැඳීම් නිර්මාණය නොකරයි, මානව අයිතිවාසිකම් නීතිය මඟින් රාජ්‍යයන් පමණක් බැඳ තබයි. මීට හේතුව වනුයේ, මෙවැනි බොහෝ කණ්ඩායම්හට මානව අයිතිවාසිකම් නීතිය යටතේ දක්වා ඇති සෑම පරාසයකම බැඳීම් හා අනුගත වීමට නොහැකි බැවිනි, මක්නිසාදයත්, ආණ්ඩු මෙන් ඔවුනට මානව අයිතිවාසිකම් ධර්මතාවන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කාර්යයන් සිදු කළ නොහැකි බැවිනි. මෙම සාමාන්‍යකරණය සඳහා සැලකිය යුතු ව්‍යතිරේකයක් රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධව පවතී: එනම්, කණ්ඩායමක් සතුව අදාළ භූමි ප්‍රදේශය තුළ පවතින සිය ස්ථාවර පාලනය ප්‍රකාරව රාජ්‍ය අධිකාරියක් මෙන් ක්‍රියා කිරීමට ඇති හැකියාව මත එය සතු මානව අයිතිවාසිකම් වගකීම් තත්වාකාරයෙන් පිළිගැනීමක් සිදු කරයි.


J. Fontana/ICRC

## භාවිතයේ හරයාත්මක පැතිකඩ

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය පොදු හරයාත්මක නීතීන් (වධ හිංසා පමුණුවීමට එරෙහි තහනම වැනි) හුවමාරු කරගන්නා නමුදු, ඒවා තුළ එකිනෙකට බොහෝ වෙනස් විධිවිධාන අන්තර්ගත වේ. ‘ සටන්කරුවන් ’ සහ ‘යුද සිරකරුවන්ගේ ’ තත්වය, රතු කුරුස හා රතු අඩසඳ ලාංඡන ආරක්ෂණය සහ විශේෂිත ආයුධ වර්ගවල නෛතික වලංගුභාවය වැනි මානව අයිතිවාසිකම් නීතියේ විෂය සීමාවෙන් පරිබාහිර බොහෝ ගැටලු සම්බන්ධව අන්තර්ජාතික මානුෂවාදී නීතිය ගනුදෙනු කරයි. එලෙසින්ම, ප්‍රකාශනයට ඇති නිදහස, එක්රැස්වීමට ඇති අයිතිය, ඡන්දය දීමට, වර්ජනය කිරීමට සහ තවත් බොහෝ දෑ සඳහා ඇති අයිතිය යනාදී අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් නියාමනය නොකරන ජීවිතය හා බැඳි අංග සම්බන්ධව මානව අයිතිවාසිකම් නීතිය ගනුදෙනු කරයි. තවදුරටත් පවසන්නේ නම්, එකිනෙකට වෙනස් ඇතම් විටදී පරස්පර ආකාර ඔස්සේ අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය යන නීති ද්විත්වය මඟින්ම පාලනය වන ක්ෂේත්‍ර තිබේ. විශේෂයෙන්ම, බලය පාවිච්චිකිරීම සහ රඳවා තබා ගැනීම යන ක්ෂේත්‍ර මෙහිලා දැක්විය හැකිය.

- බලය පාවිච්චිකිරීම හා ගත් කළ, එදිරිවාදි ක්‍රියාකලාපයට අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීතීන් විසින් විනාශකාරී බලය යෙදීම යුද වැදීමේ නෛසර්ගික ලක්ෂණයක් ලෙස හඳුනාගනියි. මක්නිසාදයත්, හමුදා මෙහෙයුම් වල අවසානාත්මක අරමුණ වනුයේ සතුරාගේ සන්නද්ධ බලකා පරදා ජයග්‍රහණය කිරීමයි. එනිසා සතුරු භටයින්ද ඇතුළුව එකිනෙකාගේ හමුදා අරමුණු ඉලක්ක කරමින් ප්‍රහාර එල්ල කිරීමට

සන්නද්ධ ගැටුමකට සම්බන්ධ පාර්ශවයන්ට අවකාශ ඇති අතර, හෝ අවම වශයෙන් එසේ කිරීමෙන් වළක්වාලමින් නෛතිකව අවහිර පනවා නැත. එකී ඉලක්ක වෙත ප්‍රචණ්ඩත්වය මෙහෙයවීම සන්නද්ධ ගැටුමකට සම්බන්ධ රාජ්‍යයක් හෝ රාජ්‍ය නොවන පාර්ශවයක් විසින් ඇති කළේද යන්න නොතකමින් එකී ඉලක්ක වෙත ප්‍රචණ්ඩත්වය මෙහෙයවීම අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් තහනම් කර නැත. සිවිල් වැසියන් සහ සිවිල් වස්තූන් වලට එරෙහිව සිදු කරන ප්‍රචණ්ඩ ක්‍රියා මෙන්ම, වෙන්කොට දැක්වීමක් නොකරන ප්‍රහාර ද නීති විරෝධී වනුයේ එදිරිවාදී ප්‍රතිවිපාකයන්ගෙන් සිවිල් ජනයාව හා සිවිල් වස්තූන් ආරක්ෂා කිරීම අන්තර්ජාතික මානුෂවාදී නීතියේ එක් ප්‍රධාන පරමාර්ථයක් වන බැවිනි; තවද, සිවිල් හානි අවම කරගැනීම සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය. (11 වන ප්‍රශ්නය බලන්න.) රාජ්‍ය විසින් සිදු කරන අපචාරයන්ගෙන් පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා මානව අයිතිවාසිකම් නීතිය නිර්මාණය වේ; එමඟින් ගැටුමක පාර්ශව අතර එදිරිවාදී ක්‍රියාකලාපය නොව, නීතිය බලාත්මක කිරීමේදී බලය පාවිච්චි කළහැකි හැකි ආකාරය නියාමනය කරයි. නීතිය බලාත්මක කිරීම, 'ඝාතනය නොව අල්ලාගැනීම (capture – rather – than – kill) යන ප්‍රවේශය මත පදනම් වේ: අනෙකුත් ආකාර කිසිවක් ජීවිත ආරක්ෂා කිරීමට නිරර්ථක වන විටදී සහ එමඟින් අපේක්ෂිත ප්‍රතිඵලය අත්පත් කරගැනීමෙහිලා අපොහොසත් වන බව පෙනෙන විටදී, බලය පාවිච්චිකිරීම ජීවිතය ආරක්ෂා කිරීම සඳහා කරන අවසාන විසඳුම විය යුතු වන අතර, අත්පත් කරගැනීමෙහිලා අපේක්ෂිත සුජාත අරමුණට දැඩිව සාමානුපාතික විය යුතුය. (නිද. අපරාධ වැළැක්වීම, අපරාධකරුවන් හෝ සැකකාර අපරාධකරුවන් නීත්‍යානුකූල ලෙස අත්අඩංගුවට ගැනීම සඳහා බලපෑම් කිරීම හෝ සහය වීම, සහ මහජන සාමය සහ ආරක්ෂාව පවත්වා ගැනීම)

- රඳවා තබා ගැනීම ගත් කළ, රැඳවියන්හට මානුෂීයව සැලකීම, රඳවා තබා ගැනීමේ තත්වයන් සහ සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතිය වැනි කාරණා වෙනුවෙන් නීති සැපයීම අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය යන නීති ද්විත්වයම සිදු කළද, වෙනස්කම් දක්නට ලැබෙනුයේ පරිපාලනමය වශයෙන් නිදහස අහිමි කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටිමය සුරක්ෂාවන් වලට පැමිණි තැනය, එනම්, රඳවා තබා ගන්නා අධිකාරියේ ආරක්ෂාව කෙරෙහි ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාකාරකම මඟින් එල්ල වන තර්ජනයේ බරපතලකම මත කරන අපරාධමය නොවන පුද්ගල රඳවා තබා ගැනීමයි. සන්නද්ධ ගැටුමක දී පරිපාලනමය වශයෙන් නිදහස අහිමි කිරීම තහනම් කර නැති අතර, සාමාන්‍යයෙන්, අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ රඳවා තබා ගැනීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ අධිකරණ විමර්ශනයක් අවශ්‍ය නොවේ. (10 වන ප්‍රශ්නය බලන්න.) සන්නද්ධ ගැටුමකින් පිටතදී සිදු වන අපරාධමය නොවන (එනම්, පරිපාලනමය) රඳවා තබා ගැනීම් නිතර දක්නට ලැබෙන්නක් නොවේ. බොහෝ අවස්ථා වල, පුද්ගලයින්ට සිය නිදහස අහිමි කර ඇත්තේ අපරාධමය වැරැද්දක් සිදු කර ඇති බවට ඔවුන් සැකකරුවන් වන බැවිනි. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය මඟින් පුද්ගල නිදහස සඳහා වන අයිතිය සුරක්ෂා කරන අතර කුමන හෝ හේතුවකට රඳවා තබා සිටින සෑම පුද්ගලයෙකුහටම ඔහුගේ හෝ ඇයගේ රඳවා තබා ගැනීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ අධිකරණ විමර්ශනයක් සඳහා අයිතිය ඇති බව දක්වයි. අධිකරණයන් ක්‍රියාත්මක බව, ප්‍රමාණය නොතකා, දෙන ලද ඕනෑම අවස්ථාවකදී අත්අඩංගුවට ගන්නා ලද සියලු පුද්ගලයින් අන්තර්ග්‍රහණය කරගැනීමට අධිකරණ පද්ධතියට හැකි බව, නීති උපදේශකයා සිටින බව, නීතිය බලාත්මක කරන නිලධාරීන්ට ඔවුනගේ කාර්යයන් කිරීමට හැකියාව ඇති බව යනාදී උපකල්පනය මත මානව අයිතිවාසිකම් නීතියේ මෙම කොටස පදනම්ව

ඇත. සන්නද්ධ ගැටුමකදී තත්වයන් ඉතා වෙනස් අතර, එය අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විධිවිධාන මඟින් නිරූපනය වේ.

බලය පාවිච්චිකිරීම සහ පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීමට අදාළ ක්‍රියාපටිපාටිමය සුරක්ෂාවන් සඳහා බලපවතින අනතර්ජාතික මානුෂවාදී නීතියේ සහ මානව අයිතිවාසිකම් නීතියේ අන්තර් ක්‍රියාකාරිත්වය, අවම ලෙස අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලදී හෝ මෙම ක්ෂේත්‍ර දෙක සඳහාම විශේෂයෙන් නිර්මිත අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විධිවිධාන ඔස්සේ යමින් එනම්, lex specialis මූලධර්මය අනුව විසඳිය යුතුය. (කොටුව බලන්න.)

## අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සහ මානව අයිතිවාසිකම් නීතියේ අන්තර් ක්‍රියාකාරිත්වය

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සහ මානව අයිතිවාසිකම් නීතියේ අන්තර් ක්‍රියාකාරිත්වය, විශේෂයෙන්ම හමුදා මෙහෙයුම් ක්‍රියාකලාපයට ඉන් සිදු කරන ප්‍රතිවිපාක මත, නෛතික අවධානය දිනාගත් විෂය ක්ෂේත්‍රයක් ලෙස පවතී.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය මඟින් දක්වන ආරක්ෂණය යුද කාලය තුළදී අවසන් නොවන බවත්, මූලධර්මයානුකූලව ගත් කළ, යමෙකුගේ නිදහස අත්තනෝමතිකව අහිමි කිරීමට එරෙහි අයිතිය එදිරිවාදීකම් තුළද බලපවතින බව අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් 1996 න්‍යෂ්ටික අවි තර්ජනය හෝ භාවිතයට අදාළ නීත්‍යානුකූලභාවය පිළිබඳ උපදේශාත්මක මතයේ දී සන්නද්ධ ගැටුම් තත්වයක් තුළදී මානව අයිතිවාසිකම් භාවිතය පිළිබඳ සිය පළමු ප්‍රකාශය මඟින් සඳහන් කරන ලදි. නිදහස අත්තනෝමතිකව අහිමි කිරීම කෙලෙසක වූයේද යන්න නිර්ණය කිරීම අදාළ lex specialis ඔස්සේ, එනම්, එදිරිවාදී ක්‍රියාකලාපය නියාමනය කිරීම සඳහා නිර්මිත, සන්නද්ධ ගැටුම් සඳහා අදාළ නීතිය මඟින් කළ යුතු බව අධිකරණය වැඩිදුරටත් එහිදී දක්වන ලදි.

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සහ මානව අයිතිවාසිකම් නීතියේ අන්තර් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පැවති ගැටලුව මෙම ප්‍රකාශය මඟින් නිරවුල් කළ බව සාමාන්‍ය මතය වන අතර එමඟින් ගම්‍ය වන පරිදි සෑම කාලයකට ම අදාළ වන මානව අයිතිවාසිකම් නීතිය මඟින් les generali ගොඩනැගෙන බවත්, සන්නද්ධ ගැටුමක හට ගැනීම මත භාවිතා වන අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් lex specialis ගොඩනැගෙන බවත් පැහැදිලිය. වෙනත් ලෙසකින් දක්වන්නේ නම්, මානව අයිතිවාසිකම් නීතිය හා අන්තර්ජාතික මානුෂවාදී නීතිය අතර යම් අනුකූලතාවයක් පවතින විට, සන්නද්ධ ගැටුම් සඳහාම විශේෂයෙන් නිර්මිත අන්තර්ජාතික මානුෂවාදී නීතිය බලපැවැත්වෙන බව දැක්විය හැක.

lex specialis මූලධර්මයේ අර්ථය සහ උපයෝගීතාවය ප්‍රශ්නගත වුවද, අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සහ මානව අයිතිවාසිකම් නීතියේ අන්තර් ක්‍රියාකාරිත්වය නිර්ණය කිරීම සඳහා එහි ඇති අත්හළ නොහැකි ස්වභාවය සම්බන්ධව පොදු පිළිගැනීමක් පවතී. සාමාන්‍යයෙන් ගත් කළ, අන්තර්ජාතික නීතියේ මෙම ශාඛා දෙක එකිනෙකට අනුපූරක සපයන නමුදු, එම අනුපූරකත්වයට අන්තර් ක්‍රියාකාරිත්වය හේතුවෙන් හටගන්නා සමහර සංකීර්ණ නෛතික ගැටලු නිරාකරණය කිරීමට නොහැකිය. සමහර අවස්ථා වලදී, අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය එකම අවස්ථාවට අදාළ කරගන්නා විට ගැටුම්කාරී ප්‍රතිඵලයන් උද්ගත විය හැකි වනුයේ එම නීති ප්‍රාථමිකව ගොඩ නගන ලද විවිධ වාතාවරණයන් එම නීති මඟින් පිළිබිඹු විය හැකි බැවිනි.



# 10. නිදහස අහිමි කිරීම සම්බන්ධව අන්තර්ජාතික මානුෂවාදී නීතිය දරන අදහස කුමක්ද?

අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් එදිරිවාදීකම් සඳහා ඍජුව සහභාගී නොවන සහ තවදුරටත් සටන් නොවදින පුද්ගලයින් ආරක්ෂා කරයි (11 වන ප්‍රශ්නය බලන්න). hors de combat පුද්ගලයින්හට ලබා දෙන පොදු ආරක්ෂණයට අමතරව, අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් තම නිදහස අහිමි වූ පුද්ගලයින්හට විශේෂ ආරක්ෂණයක් සපයයි. ප්‍රශ්නගත සන්නද්ධ ගැටුම් වර්ගය සහ රඳවා තබා ගත් පුද්ගලයාගේ තත්වය මත මෙම විධිවිධානයන් වෙනස් වේ.



C. Toggenburg/ICRC

## අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වල යුද සිරකරුවන්

යුද සිරකරුවන් යනු සතුරා විසින් අල්ලා ගන්නා ලද සටන්කරුවන් වේ (7 වන ප්‍රශ්නය බලන්න). පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීම දඬුවම් ආකෘතියක් නොවන අතර, එය ගැටුම තුළ ඔවුනගේ වැඩිදුර සහභාගීත්වය වැළැක්වීමට යොදාගන්නා ආකාරයකි. සක්‍රිය එදිරිවාදී ක්‍රියා අවසාන වූ වහාම ප්‍රමාදයකින් තොරව ඔවුන්ව නිදහස් කිරීමත් පෙරලා ඔවුනගේ මව්රට වෙත යැවීමත් සිදු කළ යුතුය. රඳවා තබා ගන්නා පාර්ශවය විසින් යුද සිරකරුවන් විසින් සිදු කර ඇති යුද අපරාධ හෝ අනෙකුත් අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන්ට එරෙහිව නඩු පැවරීමටත් ඔවුන්ව තවදුරටත් රඳවා තබා ගැනීමත් කළ හැකි නමුදු එදිරිවාදිකම් සඳහා ඍජුව සහභාගී වීම නම් හුදු කරුණ පමණක් ඊට ප්‍රමාණවත් නොවේ (පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීම සහ රඳවා තබා ගැනීම අතර වෙනස සඳහා කොටුව බලන්න.)

යුද සිරකරුවන්හට සෑම අවස්ථාවකදී ම මානුෂියව සැලකිය යුතුය. අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් සියලු ප්‍රචණ්ඩ ක්‍රියා සහ බිය ගැන්වීම්, අපහාස කිරීම් හා මහජන කුතුහලයට පාත්‍ර කිරීමට එරෙහිව ඔවුන්ව ආරක්ෂා කරයි. ඔවුනගේ ජීවිත, ඔවුනගේ ගරුත්වය, ඔවුනගේ පුද්ගලික අයිතිවාසිකම් සහ ඔවුනගේ දේශපාලන, ආගමික සහ අනෙකුත් විශ්වාසයන් සඳහා ගරුත්වයට ඔවුන් හිමිකම් ලබයි. එමෙන්ම නවාතැන් පහසුකම්, ආහාර, ඇඳුම්, සනීපාරක්ෂාව සහ වෛද්‍ය රැකවරණය යනාදී රඳවා තබා ගැනීමට අදාළ ගැටලු ආවරණය කරමින් රඳවා තබා ගැනීම සඳහා අදාළ අවම කොන්දේසි පිළිබඳ සවිස්තරාත්මකව දැක්වීමක් අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් සිදු කරයි. මීට අමතරව, සිය පවුල් සමඟ තොරතුරු හුවමාරු කරගැනීමට යුද සිරකරුවන් හිමිකම් ලබයි.

## අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වල පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීමට ලක් වූ සිවිල් වැසියන්

ආරක්ෂාවට සම්බන්ධ අත්‍යවශ්‍ය හේතු මඟින් සාධාරණීකරනය කරන්නේ නම්, ගැටුමට සම්බන්ධ පාර්ශවයකට සිවිල් වැසියන්ගේ නිදහස පරිපාලනමය ලෙස අහිමි කිරීමට හැකි වේ. පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීම යනු ආරක්ෂක ක්‍රියාමාර්ගයක් වන අතර එය දඬුවම් ආකාරයක් ලෙස භාවිතා නොකළ යුතුය. මෙමඟින් අදහස් වනුයේ ඔහුගේ හෝ ඇයගේ පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීමට ඉඩ පහසුකම් සැලසූ හේතූන් අවසන් වූ වහාම ඔවුන්ව නිදහස් කළ යුතු බවයි.

ක්‍රියාපටිපාටිමය සුරක්ෂාවන් සම්බන්ධව ගත් කළ, පරිපාලනමය ලෙස තම නිදහස අහිමි කිරීමට අදාළ හේතු පිළිබඳව සිවිල් රැඳවියාව දැනුවත් කළ යුතු අතර නිසි අධිකරණයක් හෝ පරිපාලන මණ්ඩලයක් මඟින් හැකි ඉක්මනින් තීරණය නැවත සලකා බැලීම සඳහා යොමු කළ යුතු මෙන්ම, එකී සලකා බැලීමෙන් තීරණයට වෙනසක් නොවන විටදී අවම වශයෙන් වසරකට දෙවතාවක් බැගින්වත් කාලානුරූපීව අදාළ තීරණය විමර්ශනය කළ යුතුය.

සිවිල් රැඳවියන්ට අදාළ රඳවා තබා ගැනීමේ කොන්දේසි සහ සැලකීම, යුද සිරකරුවන්ට ලබා දෙන කොන්දේසි සහ සැලකීම් වලට සමාන වේ (ඉහළ බලන්න). සිවිල් රැඳවියන්ට සෑම අවස්ථාවකදී ම මානුෂීයව සැලකිය යුතුය. අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් සියලු ප්‍රචණ්ඩ ක්‍රියා සහ බිය ගැන්වීම්, අපහාස කිරීම් හා මහජන කුතුහලයට පාත්‍ර කිරීමට එරෙහිව ඔවුන්ව ආරක්ෂා කරයි. ඔවුනගේ ජීවිත, ඔවුනගේ ගරුත්වය, ඔවුනගේ පුද්ගලික අයිතිවාසිකම් සහ ඔවුනගේ දේශපාලන, ආගමික සහ අනෙකුත් විශ්වාසයන් සඳහා ගරුත්වයට ඔවුන් හිමිකම් ලබයි. එමෙන්ම නවාතැන් පහසුකම්, ආහාර, ඇඳුම්, සනීපාරක්ෂාව සහ වෛද්‍ය රැකවරණය යනාදී රඳවා තබා ගැනීමට අදාළ ගැටලු ආවරණය කරමින් රඳවා තබා ගැනීම සඳහා අදාළ අවම කොන්දේසි පිළිබඳ සවිස්තරාත්මකව දැක්වීමක් අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් සිදු කරයි. මීට අමතරව, සිය පවුල සමඟ තොරතුරු හුවමාරු කරගැනීමට සිවිල් රැඳවියන් හිමිකම් ලබයි.

## අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ සිය නිදහස අහිමි කරන ලද පුද්ගලයින්

අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සන්දර්භය තුළ රඳවා තබා ගන්නා ලද පුද්ගලයින්හට සෑම අවස්ථානුගත අවස්ථාවකදී ම, කිසිදු ආකාරයක වෙනස්කොට සැලකීමකින් තොරව, මානුෂීයව සැලකිය යුතු බව පොදු 3 වන වගන්තිය දක්වයි. සියලු අත්‍යවශ්‍ය අධිකරණමය සුරක්ෂාවන් සහිත සාධාරණ නඩු විභාග ලබා දිය යුතු බවද එමඟින් දක්වයි. දෙවන අතිරේක සන්ධානයේ 4, 5 සහ 6 වගන්ති මඟින් පොදු 3 වන වගන්තියට ඌනපූරණ සපයයි. මෙම විධිවිධාන තුළ 1) මූලික ආරක්ෂණයන් (නිද. පුද්ගලයින්ගේ ජීවිතය, සෞඛ්‍ය සහ ශාරීරික හෝ මානසික යහපැවැත්මට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහි තහනම); 2) සන්නද්ධ ගැටුමට අදාළ හේතු මත රඳවා තබා ගැනීම හෝ පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීම මඟින් සිය නිදහස සීමා කිරීමකට ලක් වූ පුද්ගලයින් සඳහා විශේෂිත ආරක්ෂණය (නිද. පිරිමින්ගේ වාසස්ථාන වලින් වෙන් වූ වාසස්ථාන වල කාන්තාවන් තැබිය යුතු මෙන්ම, කාන්තාවන්, ඍජු කාන්තා අධීක්ෂණයක් යටතේ මිස පුරුෂ අධීක්ෂණයක් යටතේ නොතැබිය යුතුය); 3) සන්නද්ධ ගැටුමට සම්බන්ධ අපරාධ වරදවල් සඳහා නඩු කටයුතු හෝ දඬුවම් සඳහා මුහුණපෑමට ලක්ව ඇති පුද්ගලයින් සඳහා ආරක්ෂණය ලබා දීම වැනි විධිවිධාන අන්තර්ගත වේ.

පොදු 3 වන වගන්තිය මෙන්ම මෙම විධිවිධානයන් ද රාජ්‍යයන් සහ සංවිධානාත්මක රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් සඳහා ද සමානව බලපවතින බව සිහි කළ යුතු කරුණකි. එමෙන්ම, පොදු 3 වන වගන්තිය මෙන්ම දෙවන අතිරේක සන්ධානය ද සතුරු ග්‍රහණයට නතු වූ සන්නද්ධ බලකා හෝ සන්නද්ධ කණ්ඩායම් වල සාමාජිකයින් සඳහා විශේෂ තත්වයක් ලබා නොදේ. අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ යුද සිරකාර තත්වයක් නැත.

(7 වන ප්‍රශ්නය බලන්න.) සිය නිදහස අහිමි වූ පුද්ගලයින් සඳහා පවතින අවම ආරක්ෂණයන් තහවුරු කරන විධිවිධානයන් අතිශය වැදගත් වන්නේ එබැවිනි.

අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් හා ගත් කළ, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ සිය නිදහස අහිමි කරන ලද පුද්ගලයින් සඳහා සපයා ඇති ආරක්ෂණය විස්තරාත්මක බවින් සහ පැහැදිලි බවින් අඩුය; මේ සම්බන්ධයෙන් අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලට අදාළව පවතින අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විධිවිධාන ද බහුල වේ. නිදසුනක් ලෙස, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ රඳවා ගැනීමට අදාළ භෞතික තත්වයන් පිළිබඳ රීති විස්තරාත්මක නොවේ; එමෙන්ම පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීමට ලක් පුද්ගලයින්ට අදාළව ක්‍රියාපටිපාටිමය සුරක්ෂාවන් ද හිඟය. මෙම හේතූන් මත, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ නිදහස අහිමි කරන ලද පුද්ගලයින්ට අදාළ ආරක්ෂණය, නීතිය තුළ ශක්තිමත් විය යුතු ක්ෂේත්‍රයක් ලෙස ICRC විසින් හඳුනාගනී. (20 වන ප්‍රශ්නය බලන්න.)

සන්නද්ධ ගැටුම් තුළ සිදු කෙරෙන දීර්ඝ කාලීන රඳවා තබා ගැනීම් ප්‍රධාන ආකාර දෙකකි; පරිපාලනමය වශයෙන් නිදහස අහිමි කිරීම, එනම්, ආරක්ෂක හේතු මත සිදු කරන පරිපාලනමය රඳවා තබා ගැනීම් සහ අපරාධ නඩු කටයුතු සම්බන්ධ අරමුණු වෙනුවෙන් සිදු කරන රඳවා තබා ගැනීම් ය.

- පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීම යන යෙදුම අන්තර්ජාතික මානුෂවාදී නීතිය තුළ භාවිත වනුයේ රඳවා තබා ගන්නා අධිකාරියේ ආරක්ෂාවට බරපතළ තර්ජනයක් මතු කරයි යැයි විශ්වාස කරන යම් පුද්ගලයෙකුව ඔහුට එරෙහිව අපරාධ චෝදනා ගොනු කිරීම සඳහා අපේක්ෂාවක් නොමැතිව, සිදු කරන රඳවා තබා ගැනීම දැක්වීමටයි.

- අපරාධ නඩු කටයුතු සම්බන්ධ අරමුණු වෙනුවෙන් සිදු කරන රඳවා තබා ගැනීම් යනු අවසාන දණ්ඩනය නියම කිරීම හෝ නිදහස් කිරීම සිදු කරන තෙක් අපරාධ සැකකරුවෙකු යටත් විය හැකි, නිදහස අහිමි කිරීමට ලක් කිරීමයි.

## ප්‍රාණ ඇපකරුවන් තබා ගැනීම

ප්‍රාණ ඇපකරුවන් නිදහස් කිරීමට අදාළ ප්‍රකාශිත හෝ ව්‍යංග කොන්දේසියක් ලෙස තෙවන පාර්ශවයකට යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට බලපෑම් කරමින් ප්‍රාණ ඇපකරුව මැරීමට, ඔහුට තුවාල සිදු කිරීමට හෝ ඔහුව තවදුරටත් රඳවා තබා ගැනීම සම්බන්ධ තර්ජන කරමින් යම් පුද්ගලයෙකුව අල්ලා ගැනීම හෝ රඳවා තබා ගැනීම (ප්‍රාණ ඇපකරුවකු ලෙස තබා ගැනීම) තහනම් වේ.



# 11. එදිරිවාදිකම් සඳහා බලපැවැත්වෙන ප්‍රධාන අන්තර්ජාතික මානුෂවාදී නීති මොනවාද?

සන්නද්ධ ගැටුමක පාර්ශවයක් විසින් සිය හමුදා මෙහෙයුම්, එනම්, එදිරිවාදී ක්‍රියාකලාපය පවත්වාගෙන යනු ලබන ආකාරය නියාමනය කරන මූලික නීති 3 ක් පවතී. වෙන් කොට හඳුනාගැනීම, සමානුපාතික මූලධර්මය සහ පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳ නීති එම මූලික නීති වේ. එදිරිවාදිකම්වල බලපෑමට එරෙහිව සිවිල් වැසියන් ආරක්ෂා කරගැනීමට මෙම නීති මඟින් ප්‍රයත්න දරයි. මෙම නීතිවලට අතිරේකව, යුද හටයින් සහ අනෙකුත් සුජාත ප්‍රහාරක අරමුණු ආරක්ෂා කරන, අත්‍යධික හානි හෝ අනවශ්‍ය දුක්පීඩා පමුණුවීමට එරෙහි තහනම ද වේ. පළමු අතිරේක සන්ධානය තුළ මෙම නීති විශිෂ්ට ලෙස සංග්‍රහගත කොට තිබේ. මෙම නීති අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය තුළ ඇතුළත් වේ.


T. Oeten/ICRC

## වෙන්කොට හඳුනා ගැනීම

ගැටුමට පාර්ශවකරුවන් සියලු ම අවස්ථාවන්වලදී සිවිල් වැසියන් සහ සිවිල් වස්තූන් යුද හටයින් සහ යුදමය ඉලක්ක වෙන් වෙන්ව හඳුනා ගත යුතු බවට වෙන්කොට හඳුනා ගැනීම පිළිබඳ මූලික නීතිය මඟින් දක්වයි. ගැටුමට සම්බන්ධ පාර්ශවයකට යුද හටයින් හෝ යුදමය ඉලක්ක අරමුණු කරගෙන පමණක් ප්‍රහාරයක් එල්ල කළ හැක. එදිරිවාදිකම් සඳහා ඍජුව සහභාගි වන්නේ නම් මිස, සිවිල් ජනගහනය හෝ තනි සිවිල් වැසියන් ඉලක්ක කරමින් ප්‍රහාර එල්ල කළ නොහැක (කොටුව බලන්න). යුදමය අරමුණුවලට පමණක් ප්‍රහාර දැඩිව සීමා විය යුතු අතර සිවිල් වස්තූන් වලට එරෙහිව ප්‍රහාර එල්ල නොකළ යුතුය. ඉලක්ක සම්බන්ධව ගත් කළ, යුදමය ඉලක්ක ඒවායේ ස්වභාවය, පිහිටීම, අරමුණ හෝ භාවිතය මඟින් හමුදා ක්‍රියාවක් සඳහා යම් ප්‍රතිඵලදායී දායකත්වයක් දක්වන්නේ නම් සහ ඒවා අර්ධ හෝ සම්පූර්ණ ලෙස විනාශ කිරීම, අත්පත් කරගැනීම හෝ අඩපණ කිරීම මඟින් පවතින අවස්ථානුගත තත්වයන් තුළදී නිශ්චිත යුදමය වාසියක් අත් කර දෙන ඉලක්ක වලට පමණක් සීමා වේ. සාමාන්‍ය යුදමය ඉලක්ක වනුයේ සතුරු යුද හටයින්, සහ ඔවුනගේ උපකරණ සහ අවි ආයුධ පිහිටුවා ඇති ඒකක, ගොඩනැගිලි හා ස්ථාන සහ යුදමය ප්‍රවාහන මාධ්‍ය සහ සන්නිවේදන ආකාරයි. සිවිල් ඉලක්ක යුදමය අරමුණු සඳහා උපයෝගී කරගන්නා විටකදී, (නිද. ආයුධ සහ යුද හටයින් ප්‍රවාහනය කිරීමට යොදා ගත් සිවිල් දුම්රියක්) ඒවා යුදමය ඉලක්ක ලෙස සැලකිය හැකිය.

වෙන්කොට හඳුනා නොගත් ප්‍රහාරයන්ට එරෙහි තහනම පැන නඟිනුයේ වෙන්කොට හඳුනා ගැනීම පිළිබඳ මූලධර්මය තුළිනි. වෙන්කොට හඳුනා නොගත් ප්‍රහාර වනුයේ:

- නිශ්චිත යුදමය ඉලක්කයකට එල්ල කරනු නොලැබූ ප්‍රහාර (නිද. යම් නිශ්චිත යුදමය ඉලක්කයක් ඉලක්ක කර නොගනිමින් යුද සෙබළෙකු විසින් සිවිල් වැසියන් උපද්‍රවයට පමුණුවමින් සියලු දිසා වෙත සිදු කරනු ලබන වෙඩි තැබීමක්)
- නිශ්චිත යුදමය ඉලක්කයකට එල්ල කිරීමට නොහැකි යුදමය විධික්‍රමයක් හෝ ආකාරයක් ක්‍රියාවට නංවන ප්‍රහාර (නිද. සිය ඉලක්ක වෙත පැහැදිලිව ප්‍රහාරය එල්ල කළ නොහැකි දීර්ඝ පරාසයේ මිසයිල)
- ප්‍රතිවිපාක සීමා කිරීමට නොහැකි යුදමය විධික්‍රමයක් හෝ ආකාරයක් ක්‍රියාවට නංවන ප්‍රහාර (නිද. තනි ගොඩනැගිල්ලක් විනාශ කිරීම සඳහා ටොන් 10 බෝම්බයක් යොදා ගැනීම)

## සමානුපාතිකභාවය

සටන්කරුවකු හෝ යුදමය ඉලක්කයක් ඉලක්ක කරගනිමින් සිදු කරන ප්‍රහාර සමානුපාතිකත්ව නීතිය හා අනුකූල විය යුතුය. මෙමඟින් අදහස් වනුයේ අපේක්ෂිත ස්ථිර සහ ඍජු යුදමය වාසියේ ප්‍රමාණය ඉක්මවන්නා වූ, සිවිල් වැසියන්ගේ ජීවිතවලට ආනුෂංගික හානි සලසන, සිවිල් වැසියන්ට හානි පමුණුවන, සහ/හෝ සිවිල් වස්තූන් වලට හානි පමුණුවන ප්‍රහාර දියත් කිරීම තහනම් බවයි. වෙනත් ලෙසකින් දක්වන්නේ නම්, යුදමය ඉලක්කයක් සඳහා ප්‍රහාර එල්ල කළ යුත්තේ පුරෝකතනය කරන ලද යුදමය වාසිය ඉක්මවා යන සිවිල් හානි අපේක්ෂා කළ නොහැකි බවට නිගමනය දක්වන ඇගයුමකින් පසුව පමණක් වන බවයි.

## පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග

ගැටුමට සම්බන්ධ පාර්ශවයක් විසින් යුද මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ දී සිවිල් වැසියන් හෝ සිවිල් වස්තූන් ආරක්‍ෂා කිරීම සඳහා නිරන්තරයෙන් සැලකිලිමත් විය යුතුය. ඉලක්කයන් යුදමය ඉලක්ක බව තහවුරු කර ගැනීම පිණිස ප්‍රහාරය දියත් කරන පාර්ශවය විසින් කළ හැකි සෑම දෙයක්ම කළ යුතුය. සිවිල් වැසියන්ට සහ සිවිල් වැසියන්ගේ දේපල වලට එරෙහිව සිදු වන අනුෂාංගික හානි වැළැක්විය හැකි හෝ අවම වශයෙන් එම හානි අවම කරගත හැකි විධික්‍රම සහ ආකාර යුද ප්‍රහාර සඳහා එම පාර්ශවය විසින් තෝරා ගත යුතුය. අපේක්ෂිත ස්ථිර සහ සෘජු යුදමය වාසියේ ප්‍රමාණය ඉක්මවන්නා වූ හානි හෝ අලාභ ඇති විය හැකි බව පැහැදිලි වන විට එවැනි ප්‍රහාර දියත් කිරීමෙන් ගැටුමට සම්බන්ධ පාර්ශවය වැළකී සිටිය යුතුය. පවතින තත්වයන් යටතේ අවසර නොලැබෙන්නේ නම් මිස, සිවිල් ජනතාවට බලපෑම් ඇති විය හැකි ප්‍රහාර සම්බන්ධයෙන් ඵලදායී පූර්ව අනතුරු ඇඟවීම් ලබා දිය යුතුය. ප්‍රහාරවල ප්‍රතිවිපාකවලට එරෙහිවද පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය. නිදසුනක් ලෙස, හැකිතාක් දුරට, සිවිල් ජනගහනය සහ සිවිල් වස්තූන් ආසන්නයේ යුදමය ඉලක්ක ස්ථානගත නොකළ යුතුවේ; අනෙකුත් අවශ්‍ය පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග සියල්ලමද ගත යුතුය.

## අත්‍යධික හානි හෝ අනවශ්‍ය දුක් පීඩා පමුණුවීමට එරෙහි තහනම

අත්‍යධික හානි හෝ අනවශ්‍ය දුක් පීඩා පමුණුවිය හැකි ස්වභාවයේ ආයුධ, ප්‍රක්ෂේපන සහ යුද උපකරණ සහ විධික්‍රම යොදා ගැනීම තහනම් වේ. මෙම තහනම විශේෂයෙන්ම යුද භටයින් අරමුණු කරගනී: පිළිගත නොහැකි ආකාරයන්ගෙන් යුද භටයින්හට හානි පමුණුවන ඇතැම් ආයුධ වර්ග තහනම් බව මෙමඟින් දක්වයි. මෙම නීතිය පොදුවේ පිළිගත්තද, යම් ආයුධයක් මඟින් අත්‍යධික හානි හෝ අනවශ්‍ය දුක් පීඩා පමුණුවන්නේද යන්න තීරණය කිරීමට අදාළ නිසි ක්‍රමවේදය පිළිබඳව නොඑකඟතාවයක් පවතී. ජාත්‍යන්තර යුක්ති අධිකරණය විසින් අනවශ්‍ය දුක් පීඩා යන්න "සුජාත යුදමය අරමුණු අත්පත් කරගැනීමෙහිලා නොවැළැක්විය හැකි හානිය ඉක්ම වූ හානිය" ලෙස නිර්වචනය කරන ලදි (න්‍යෂ්ටික අවි තර්ජනය හෝ භාවිතයට අදාළ නීත්‍යානුකූලභාවය, උපදේශාත්මක මතය, 1996). නිදසුනක් ලෙස, චේතාන්විතව සිදු කරන ස්ථිර අන්ධභාවයට පත් කිරීම වනාහි අත්‍යධික හානි හෝ අනවශ්‍ය දුක් පීඩා යටතේලා ගැනෙන්නක් බවට වූ විශ්වාසය මත සාම්ප්‍රදායික අවි පිළිබඳ සම්මුතියේ (12 වන ප්‍රශ්නය බලන්න) සිව්වන සන්ධානයේ දැක්වෙන, ලේසර් අවි මඟින් යුද සෙබළුන්ගේ දෙනෙත් ඉලක්ක කිරීමට එරෙහි තහනම පැන නැඟුණි.

## සෘජුව එදිරිවාදිකම්වලට සම්බන්ධවීම

සෘජුව එදිරිවාදිකම් සඳහා සහභාගි නොවන විට සහ නොවනතාක් කල්, ප්‍රහාරයන්ගෙන් සිවිල් වැසියන් ආරක්ෂිත වේ. ප්‍රායෝගිකව මින් අදහස් වන්නේ කුමක්ද යන්න පැහැදිලි කරගැනීමට, මෙම ප්‍රස්තුතය සාකච්ඡාවට බඳුන් කළ විශේෂඥයින්ගේ රැස්වීම් කිහිපයක්ම ICRC විසින් පවත්වන ලදි. 2009 වර්ෂයේ දී මෙම සාකච්ඡා මත පදනම්ව ICRC විසින් ලේඛනයක් ප්‍රකාශයට පත් කරන ලදි: අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ සෘජුව එදිරිවාදිකම් සඳහා සම්බන්ධවීම පිළිබඳ අර්ථකථනමය මාර්ගෝපදේශය (*Interpretive Guidance on the Notion of Direct Participation in Hostilities under International Humanitarian Law*). සන්නද්ධ ගැටුම් පාර්ශව අතර පවතින එදිරිවාදි ක්‍රියාකලාපයේ කොටසක් ලෙස සිවිල් වැසියන් විසින් යම් නිශ්චිත කාර්යයන් සිදු කරනු ලබන විට, එය සිවිල් වැසියන් විසින් එදිරිවාදිකම් සඳහා සෘජුව සහභාගි වීමක් ලෙස සලකන බව මෙම අර්ථකථනමය මාර්ගෝපදේශය මගින් දක්වයි. සෘජුව එදිරිවාදිකම් සඳහා සම්බන්ධවීම යටතේලා ගැනීමට එකී නිශ්චිත ක්‍රියාව විසින් පහත සඳහන් නිර්ණායක එකින් එක තෘප්ත කිරීම සිදු කළ යුතුය.

1. එම ක්‍රියාව හානියේ යම් **නිශ්චිත එළිපත්තකට** ළඟා විය යුතුය. යුද්ධයක යෙදී සිටින පාර්ශවයක යුද මෙහෙයුම් හෝ යුද ධාරිතාව සඳහා එම ක්‍රියාව හානිකර ලෙස බලපායි නම් සහ තවද, ක්‍රියාව මඟින් සිවිල් වැසියන්ට තුවාල කිරීම හෝ ඝාතනය කිරීම හෝ යුද භටයින් hors de combat තත්වයට පත් කිරීම හෝ සිවිල් ඉලක්ක විනාශ කිරීම සිදු කරන විට.

2. එම ක්‍රියාවේ ප්‍රතිඵලය හෝ එම ක්‍රියාව යුද මෙහෙයුමක අත්‍යවශ්‍ය කොටසක් වීම මත එහි ප්‍රතිඵලය ලෙස හටගත හැකි හානිය සහ එම ක්‍රියාව අතර **සෘජු කාරක** සම්බන්ධයක් පැවතින විට.

3. **යුදමය සම්බන්ධතාවයක්** පැවතිය යුතුමය. මෙමගින් අදහස් වනුයේ යුද්ධයක නිරත වී සිටින පාර්ශවයකට සහයෝගයක් ලෙස අවශ්‍ය හානිය සෘජුව ඇති කිරීම පිණිස එම ක්‍රියාව විශේෂයෙන් නිර්මිත විය යුතු අතර අනෙකාට හානිදායක විය යුතුය.

මෙකී ක්‍රියා පවත්වා ගෙන යාම මත සහ යනතාක් කල්, සිවිල් වැසියන් විසින් සෘජුව එදිරිවාදිකම් සඳහා සහභාගි වීමක් ලෙස සලකන අතර ප්‍රහාරයන්ට එරෙහි ආරක්ෂණය අහිමි කරගනි. තවදුරටත් පවසන්නේ නම්, සෘජුව එදිරිවාදිකම් සඳහා සම්බන්ධවීම ස්ථාපනය කෙරෙන යම් නිශ්චිත ක්‍රියාවක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සූදානම් වීමට අදාළ පියවරත්, ක්‍රියාත්මක කරන ස්ථානය වෙත පිවිසීමත් සහ එම ස්ථානයෙන් නැවත පැමිණීමත් යනාදිය ද සෘජුව එදිරිවාදිකම් සඳහා සම්බන්ධවීම සංකල්පය තුළ ඇතුළත් වේ.

# 12. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් යුද විධික්‍රම සහ ආකාර නියාමනය කරන්නේ කෙසේද?

ගැටුමක පාර්ශවයන්හට යුද විධික්‍රම සහ ආකාර තෝරා ගැනීමට ඇති අයිතිය සීමා රහිත එකක් නොවේ. ඉවක් බවක් නොමැති ප්‍රතිවිපාක සහිත හෝ අත්‍යධික හානි හෝ අනවශ්‍ය පීඩා පමුණුවිය හැකි යුද විධික්‍රම සහ ආකාර භාවිතා කිරීම අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් තහනම් කරයි. (11 වන ප්‍රශ්නය බලන්න) මෙම මූලධර්ම මත පදනම්ව යුද ආකාර (ආයුධ) සම්බන්ධ යම් නිශ්චිත සීමා/තහනම් සහ යුද විධික්‍රම වලට එරෙහි තහනම් නිර්මාණය වී තිබේ.

### යුද ආකාර

සන්නද්ධ ගැටුමකදී යම් නිශ්චිත ආයුධයක භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් කළ හැකි අතර එම ආයුධයම නීති විරෝධී ලෙස සැලකිය හැකිය (නිද. පුද්ගල නාශක බිම් බෝම්බ, පොකුරු බෝම්බ, රසායනික අවි). එසේ නැතහොත්, ඇතැම් අවස්ථාවන්හීදී එහි භාවිතය සීමා කළ හැකිය (නිද. සිවිල් වැසියන් සංකේන්ද්‍රණය වී ඇති ප්‍රදේශයක පිහිටි හමුදා ඉලක්කයකට එරෙහිව ගුවනින් හෙළන ගිනි අවුලුවන ආයුධ භාවිතයට එරෙහි තහනම).

### පුද්ගල නාශක බිම් බෝම්බ

පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය, ගබඩා කිරීම, නිෂ්පාදනය සහ හුවමාරු කිරීම තහනම් කිරීමේ හා විනාශ කිරීමේ සම්මුතිය (1997) යටතේ, රාජ්‍යයන් කිසිදු අවස්ථාවක පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය, සංවර්ධනය, නිෂ්පාදනය, ගබඩා කිරීම හෝ හුවමාරු කිරීම හෝ වෙනත් ඕනෑම කෙනෙකුට එසේ කිරීමට ආධාර නොකළ යුතුය. එසේම, ඔවුන් විසින් දැනට පවතින සියළුම පුද්ගල නාශක බිම් බෝම්බ සංචිත විනාශ කළ යුතු අතර නිශ්චිත කාලයක් තුළදී මෙම උපාංග වල දමා ඇති ඉඩම් වලින් ඒවා ඉවත් කළ යුතුය.

### පොකුරු බෝම්බ

පොකුරු බෝම්බ පිළිබඳ සම්මුතිය මඟින් (2008) පොකුරු බෝම්බ (කුඩා පුපුරන සුලු උණ්ඩ විශාල ප්‍රමාණයක් නිකුත් කරන බෝම්බ, ෂෙල්වෙඩි, රොකට්, හෝ මිසයිල) භාවිතය, නිෂ්පාදනය, ගබඩා කිරීම හා හුවමාරු කිරීම තහනම් කරයි. මෙම තහනම්වලට අමතරව, පොකුරු බෝම්බ සතු රාජ්‍යයන් ඔවුන්ගේ මෙම ආයුධ සංචිත විනාශ කිරීම සහ පොකුරු බෝම්බ අවශේෂ මඟින් දූෂිත වූ ඉඩම් වලින් ඒවා ඉවත් කිරීම (අතීත ගැටුමකින් ශේෂ වූ පුපුරා නොගිය පොකුරු බෝම්බ සහ කුඩා උණ්ඩ) අවශ්‍යවේ. පොකුරු බෝම්බ ප්‍රහාරවල වින්දිතයින්ට ආධාර සැපයීම සඳහා විශේෂිත බැඳීම් ද පවතී.




U. Meissner/ICRC

## අනෙකුත් සාම්ප්‍රදායික අවි

1980 අධික ලෙස හානිදායක හෝ ඉවක් බවක් නොමැති ප්‍රතිවිපාක සහිත යම් නිශ්චිත සාම්ප්‍රදායික අවි භාවිතය තහනම් හෝ සීමා කිරීම් පිළිබඳ සම්මුතිය (CCW) තුළද යම් නිශ්චිත වර්ගයේ ආයුධ පිළිබඳ තහනම් සහ සීමා කිරීම් ඇතුළත් වේ:

- (CCW) හි පළමු සන්ධානය විසින් එක්ස් කිරණ මඟින් අනාවරණය කරගත නොහැකි කැබලි මඟින් මනුෂ්‍ය ශරීරයට තුවාල සිදු කිරීම මූලික පරමාර්ථය කරගත් ඕනෑම ආයුධයක් භාවිතය තහනම් කරයි.
- II වන සන්ධානය මඟින් බිම් බෝම්බ භාවිතය (පුද්ගල නාශක සහ වාහන නාශක යන දෙකම), මර උගුල් සහ වෙනත් සමාන උපාංග භාවිතය තහනම් හෝ සීමා කරයි. මෙම සන්ධානය 1996 දී සංශෝධනය කර නව රෙගුලාසි එකතු කරන ලදි.
- III වන සන්ධානය මඟින් ගිනි අවුලුවන සුළු ආයුධ හෝ නාපාම් බෝම්බ (napalm bombs) සහ ගිනි දැල් විසි කරනයන් වැනි ගින්නෙන් හෝ තාපයේ ක්‍රියාකාරීත්වය තුළින් වස්තූන් ගිනි තැබීම සඳහා හෝ පුද්ගලයින් පුළුස්සා දැමීම සඳහා මූලික වශයෙන් නිර්මාණය කර ඇති ආයුධ භාවිතය පාලනය කරයි.
- IV වන සන්ධානය මඟින් ස්ථිර අන්ධභාවය ඇති කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද ලේසර් ආයුධ භාවිතය සහ විකිණීම තහනම් කරයි.
- V වන සන්ධානය මඟින් ගැටුමකට සම්බන්ධ පාර්ශව විසින් යුද්ධයේ පිපිරුම් ශේෂ (පුපුරා නොගිය සහ අතහැර දැමූ අවි) නිසා ඇති විය හැකි අනතුරු අවම කිරීමට පියවර ගැනීම අනිවාර්ය කරයි.

ආරම්භයේදී CCW සහ එහි සන්ධාන අදාළ වූයේ අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා පමණක් වුවද (1996 දී සංශෝධනය කරන ලද II වන සන්ධානය හැර), 2001 දෙසැම්බර් 21 වන දින සිදු කළ සම්මුතියේ 1 වන වගන්තිය සංශෝධනය මඟින් මෙම ගිවිසුම්වල අදාළත්වය අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් දක්වා පුළුල් කෙරිණි.

## රසායනික හා ජීව විද්‍යාත්මක අවි

පළමු ලෝක යුද්ධයෙන් පසු රසායනික හා ජීව විද්‍යාත්මක අවි භාවිතය අන්තර්ජාතික ප්‍රජාව විසින් තහනම් කරන ලදී (1925 හුස්ම හිරවීම, විෂ හෝ වෙනත් වායූන් සහ බැක්ටීරියා විද්‍යාත්මක යුද විධික්‍රම භාවිතය තහනම් කිරීම සඳහා වූ සන්ධානය). මෙම ආයුධ භාවිතය, සංවර්ධනය, සංචිත තබා ගැනීම සහ විකිණීම තහනම් කිරීම සහ සංචිත විනාශ කිරීම අනිවාර්ය කිරීම මඟින් 1972 (ජීව විද්‍යාත්මක අවි පිළිබඳ සම්මුතිය) සහ 1993 (රසායනික අවි පිළිබඳ සම්මුතිය) දී මෙම තහනම බලාත්මක කරන ලදි. රසායනික අවි පිළිබඳ සම්මුතිය මඟින් යුද විධික්‍රමයක් ලෙස කැරලි මර්දන කාරක (නිද. කඳුළු ගෑස්) භාවිතය ද තහනම් කර ඇත.

## න්‍යෂ්ටික අවි

න්‍යෂ්ටික අවි භාවිතය සම්බන්ධයෙන් විස්තරාත්මක හෝ විශ්වීය තහනමක් නොමැත. 1968 න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය වැළැක්වීමේ ගිවිසුම මඟින් න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය වැළැක්වීම සහ න්‍යෂ්ටික නිරායුධකරණයේ ඉලක්කය ඉදිරියට ගෙන යාම මූලිකව අරමුණු කරයි.

කෙසේ වුවද, 1996 දී, අන්තර්ජාතික යුක්ති අධිකරණය, උපදේශාත්මක මතයේදී, විශේෂයෙන්ම වෙන්කොට හඳුනාගැනීමේ අන්තර්ජාතික මානුෂවාදී නීති මූලධර්මය සහ අනවශ්‍ය පීඩා පමුණුවීමට එරෙහි තහනම වැනි අන්තර්ජාතික මානුෂවාදී නීතීන් න්‍යෂ්ටික අවි සඳහා අදාළ වන බව තහවුරු කළේය. මෙම රීති සහ සම්බන්ධිත අනෙකුත් රීති න්‍යෂ්ටික අවිවලට අදාළ කරමින් අධිකරණය එළැඹි නිගමනය වූයේ "න්‍යෂ්ටික අවි තර්ජනය හෝ භාවිතය පොදුවේ සන්නද්ධ ගැටුම් සඳහා බලපාන අන්තර්ජාතික නීතියේ රීතීන්ට පටහැනි විය හැකි බවයි". කෙසේ නමුදු, රාජ්‍යයේ පැවැත්මට තර්ජනයක් වන අතිශය දරුණු වාතාවරණයකදී පවා, න්‍යෂ්ටික අවි භාවිතා කිරීම නීත්‍යානුකූලද යන්න තීරණය කිරීමට අධිකරණයට නොහැකි විය.

2011 දී අන්තර්ජාතික රතු කුරුස හා රතු අඩසඳ ව්‍යාපාරයේ නියෝජිතයින්ගේ කවුන්සලය විසින් (ICRC, රතු කුරුස හා රතු අඩසඳ සමාජයන්ගේ ජාත්‍යන්තර සම්මේලනය සහ සියලුම ජාතික රතු කුරුස හා රතු අඩසඳ සමාජයන්ගෙන් සමන්විත) න්‍යෂ්ටික අවි සම්බන්ධයෙන් ව්‍යාපාරය දරන ස්ථාවරය දැක්වෙන "න්‍යෂ්ටික අවි මුළුමනින්ම තුරන් කිරීම උදෙසා කටයුතු කිරීම" යන අතිශය වැදගත් යෝජනාව සම්මත කරන ලදී. න්‍යෂ්ටික අවිවල කිනම් හෝ භාවිතයක් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීති සමඟ විශේෂයෙන්ම වෙන් කොට හඳුනා ගැනීම, පූර්වාරක්ෂාව සහ සමානුපාතිකත්වය යන රීතීන් සමඟ කෙසේ අනුකූල වන්නේද සලකා බැලීම කවුන්සලයට දුෂ්කර වූ බව යෝජනා සම්මතය දැක්විය. නැවත කිසිදු දිනෙක න්‍යෂ්ටික අවි භාවිතා නොකිරීම තහවුරු කිරීමටත් අන්තර්ජාතික ගිවිසුමක් මඟින් න්‍යෂ්ටික අවි තහනම් කිරීම හා තුරන් කිරීමට යුහුසුලු සහ අධිෂ්ඨානශීලී සාකච්ඡා පැවැත්වීම සඳහාත් එමඟින් සියලු රාජ්‍යයන්ගෙන් ආයචනා කරන ලදි.

## නව ආයුධ අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූල වන බවට සහතික කිරීම

ආයුධ තාක්ෂණයේ වර්ධනයන් සහ රාජ්‍යයන් විසින් නව ආයුධ අත්කර ගැනීම නියාමනය කිරීමට ද අන්තර්ජාතික මානුෂවාදී නීතිය උත්සාහ කරයි. 1 වන අතිරේක සන්ධානයේ 36 වන වගන්තිය අනුව, සෑම රාජ්‍ය පාර්ශවයක්ම, අධ්‍යයනය කරන, සංවර්ධනය කරන, අත්පත් කර ගන්නා හෝ සම්මත කරන ඕනෑම නව ආයුධයක්, යුද විධික්‍රම හෝ ආකාර භාවිතයක් එම රාජ්‍යය බැඳී ඇති අන්තර්ජාතික නීතියේ රීති වලට අනුකූල වන බවට සහතික කළ යුතුය. මේ සඳහා සිදු කරන ලද ඇගයීම්වලින් එම රාජ්‍යයේ අන්තර්ජාතික බැඳීම්වලට අනුකූලව

## යුද විධික්‍රම

ගිවිසුම් සහ චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ යුද විධික්‍රම ගණනාවක් විශේෂයෙන් තහනම් කර ඇත. නිදසුන් කිහිපයක් පහතින් දක්වා ඇත.

## සමාව දීම ප්‍රතික්ෂේප කිරීම

කිසිදු සමාවක් නොදිය යුතු බවට නියෝග කිරීම සහ ඒ බවට විරුද්ධවාදියෙකුට තර්ජනය කිරීම හෝ මෙම පදනම මත පිහිටා එදිරිවාදිකම්හි නිරත වීම තහනම් වේ. සතුරු හමුදාවන්ට යටත් වීමට සහ සිරකරුවෙකු ලෙස භාරයට නතු වීමට අවස්ථාවක් ලබා දිය යුතුය. තුවාල ලැබූ සෙබළුනට ගෞරවය හා ආරක්ෂාව ලබා දිය යුතුය.

## කොල්ලකෑම

කොල්ලකෑම - ආක්‍රමණික හෝ ජයග්‍රාහි හමුදාවක් විසින් සතුරාගේ යටත් වැසියන්ගේ පෞද්ගලික දේපළ බලහත්කාරයෙන් අල්ලා ගැනීම තහනම් වේ.

## නිරාහාරව තැබීම

යුද විධික්‍රමයක් ලෙස සිවිල් ජනතාව නිරාහාරව තැබීම තහනම්ය. සිවිල් ජනතාවගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය දෑ වලට ප්‍රහාර එල්ල කිරීම, විනාශ කිරීම, ඉවත් කිරීම හෝ නිෂ්ප්‍රයෝජන බවට පත්කිරීමද තහනම් වේ.

## විශ්වාස භංග කිරීම

විශ්වාසභංග වන ක්‍රියාවලට යොමුවීම මඟින් සතුරෙකු ඝාතනය කිරීම, තුවාල සිදු කිරීම හෝ අල්ලා ගැනීම තහනම් වේ. 1 වන අතිරේක සන්ධානයේ 37 වන වගන්තිය විශ්වාසභංග කිරීම් යන්න අර්ථ දක්වන්නේ, “සන්නද්ධ ගැටුමක දී අදාළ වන අන්තර්ජාතික නීතියේ රීති යටතේ සැලසෙන ආරක්ෂණයක් ලෙස හෝ අනුමැතිය ලබාදීමට බැදී ඇති බව හඟවමින් සතුරාගේ විශ්වාසය ඇති කිරීමට ආමන්ත්‍රණය කරනු ලබන සහ සතුරාට ඒ පිළිබඳව විශ්වාසයක් ගොඩ නගමින් එකී විශ්වාසය කඩ කිරීමේ චේතනාවෙන් කරනු ලබන ක්‍රියා” ලෙසය. නිදසුනක් වශයෙන්, සතුරු යුද භටයෙකුට පහර දීම සඳහා වංක ලෙස තුවාල හෝ අසනීප ඇති බව මවා පෑම මෙයට ඇතුළත් ය. යුද ප්‍රයෝග, එනම් ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය නොකරන සතුරා ව්‍යාකූල කිරීමට අදහස් කරන ක්‍රියාවන් සහ විශ්වාසභංග කිරීමට එරෙහි තහනමට ගරු කරන ක්‍රියාවන් තහනම් නොවේ. නිදසුනක් වශයෙන්, වෙස් මාරු කිරීම, උපාය දූතයන් යෙදවීම, ව්‍යාජ මෙහෙයුම් සහ වැරදි තොරතුරු ලබාදීම මෙයට ඇතුළත් වේ.






# 13. ලාංඡන භාවිතය සහ ඒවායේ ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විධිවිධාන මොනවාද?

රතු කුරුසය, රතු අඩසඳ, රතු සිංහයා හා සූර්යයා, සහ රතු පළිඟුව යන ලාංඡන අන්තර්ජාතික වශයෙන් පිළිගත් ලාංඡන වන අතර, අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ සන්නද්ධ ගැටුමකදී තුවාල වූ සහ රෝගී වූ පුද්ගලයින්ට හිමි මධ්‍යස්ථ සහ අපක්ෂපාතී සහය සහ ආරක්ෂණය දක්වන දෘෂ්‍යමාන ප්‍රකාශනයයි. මෙම ලාංඡන මඟින් එකිනෙකට වෙනස් කාර්යයන් ද්විත්වයක් ඉටු කරයි. ඉන් එකක් වනුයේ සන්නද්ධ ගැටුමක් අතරතුරදී සන්නද්ධ බලකා වල වෛද්‍ය නිලධාරීන්, ඒකක සහ ප්‍රවාහන මාධ්‍ය මෙන්ම ආගමික කාර්ය මණ්ඩල වෙත ලබා දී ඇති ආරක්ෂණය පෙන්වන සංඥාවක් ලෙස ක්‍රියා කිරීමයි (ආරක්ෂකයක් ලෙස භාවිතය). අනෙක් කාර්යය නම්, යම් පුද්ගලයෙක් හෝ දේපලක් ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරයට සම්බන්ධ බව මෙම ලාංඡන මඟින් දැක්වීමයි (දර්ශකයක් ලෙස භාවිතය).

මෙම ව්‍යාපාරයට, ඉහතින් දැක්වූ පරිදි, ICRC, රතු කුරුස සහ රතු අඩසඳ සමාජයන්හි ජාත්‍යන්තර සම්මේලනය, සහ සියලුම ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සමාජ ඇතුළත් වේ.

## ආරක්ෂක උපාංගයක් ලෙස භාවිතය

ගොඩබිමේදී, මුහුදේදී සහ ගුවනේදී ආරක්ෂක උපාංගයක් ලෙස සන්නද්ධ බලකා වෛද්‍ය සේවාවන් විසින් යොදා ගැනීම ලාංඡනයෙන් මූලිකවම අදහස් කෙරිණි. මීට අමතරව, නිසි මහජන අධිකාරීන්ගේ ප්‍රකාශිත අනුමැතිය සහිතව සහ ඔවුනගේ පාලනය යටතේ, සන්නද්ධ ගැටුම් අතරතුරදී තුවාල වූ, රෝගී වූ, සහ මුහුදුබත් වූ පුද්ගලයන්ට සැලකීමට සහ ඔවුනගේ රැකවරණය සඳහා අනුයුක්ත කර ඇති සිවිල් වෛද්‍ය නිලධාරීන්, රෝහල් සහ අනෙකුත් සිවිල් වෛද්‍ය ඒකක, සහ ප්‍රවාහන ද මෙම ආරක්ෂක ලාංඡන භාවිතා කරයි. සන්නද්ධ ගැටුම් කාලවලදී යම් නිශ්චිත පුද්ගලයින් සහ වස්තූන් වෙත හිමි ආරක්ෂණය නියෝජනය කිරීම ලාංඡන මඟින් මූලිකව අපේක්ෂා කිරීම මත, එම ලාංඡන බොහෝ දුරකට වුවද දෘශ්‍යමාන වන ලෙස ප්‍රමාණයෙන් විශාල විය යුතුය. ලාංඡන, එනයින්ම ආරක්ෂණය ප්‍රදානය නොකරයි. සරලව ගත් කළ, ලාංඡන වනාහි ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන විසින් සලසනු ලබන ආරක්ෂණයේ දෘශ්‍යමාන සලකුණයි.

## දර්ශක උපාංගයක් ලෙස භාවිතය

යුද්ධය අතරතුරදී හෝ සාම කාල තුළදී යම් පුද්ගලයෙකු හෝ වස්තුවක් ව්‍යාපාරයට හෝ ඊට අනුබද්ධ ආයතනයකට සම්බන්ධ බව දැක්වීමේ දර්ශක පරමාර්ථ සඳහා ද ලාංඡන භාවිතා කරයි. මෙහිදී, දර්ශක සහ ආරක්ෂක භාවිතය සම්බන්ධව ඇති විය හැකි ව්‍යාකුල තත්ව මඟහැරීම සඳහා ලාංඡනය ප්‍රමාණයෙන් කුඩා ස්වරූපයක් ගත යුතුය.

දර්ශක සහ ආරක්ෂක යන පරමාර්ථ ද්විත්වය වෙනුවෙන්ම සෑම කාලයකදීම ලාංඡන භාවිතා කිරීමට ICRC සහ ජාත්‍යන්තර සම්මේලනයට අයිතිය පවතී.

## ලාංඡන අවභාවිතා කිරීම

අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ප්‍රකාශිතව අනුමත කර නොමැති විටදී, සාම කාලය තුළ හෝ සන්නද්ධ ගැටුමක් අතරතුර ලාංඡන කුමන පරමාර්ථයකින් හෝ භාවිතා කිරීම තහනම් අතර එය ලාංඡන අවභාවිතා කිරීමකි. අවභාවිතය ආකාර තුනකි:

- ව්‍යාජ අනුකරණය, මින් අදහස් වනුයේ, හැඩයෙන් සහ/හෝ වර්ණයෙන් පිළිගත් ලාංඡනයක් හා ව්‍යාකුල තත්වයක් ගොඩ නැඟිය හැකි ආකාරයේ සලකුණක් භාවිතා කිරීමයි;
- පැහැර ගැන්ම, හෝ භාවිතා කිරීමට හිමිකමක් නැති ඕනෑම පුද්ගලයෙකු හෝ සංවිධානයක් විසින් ලාංඡන භාවිතය (වාණිජ ව්‍යාපාර, වෛද්‍ය ආයතන හෝ ඖෂධසැල්, රාජ්‍ය නොවන සංවිධාන හෝ පුද්ගලයින් යනාදී). පැහැර ගැන්ම යන්නට ලාංඡන භාවිතා කිරීමට අනුමැතිය ලත් පුද්ගලයින් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීති ප්‍රකාරව ක්‍රියා කිරීමට අසමත්වීම් ද ඇතුළත් වේ;
- විශ්වාසය භංග කිරීම, හෝ සතුරෙකුව ඝාතනය කිරීම, තුවාල කිරීම හෝ අල්ලා ගැනීමේ අරමුණින් ආරක්ෂිත තත්වය ව්‍යාජව ඇඟවීම සඳහා ලාංඡන භාවිතා කිරීම (12 වන ප්‍රශ්නය බලන්න). අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් තත්වයන්හිදී විශ්වාසය භංග කිරීමේ අරමුණින් ලාංඡන භාවිතය යුද අපරාධයක් වේ

යුද කාලය අතරතුරදී හෝ සාම කාලය තුළදී ලාංඡන අවභාවිතා කිරීම, අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ගොඩ නඟා ඇති ආරක්ෂණය පිළිබඳ සමස්ත යාන්ත්‍රණයම අවදානමේ හෙළීමක් විය හැක්කේ එමඟින් යුද්ධයක නිරතව සිටින පාර්ශවයන් විසින් ලාංඡන වල ආරක්ෂක කාර්යය පිළිබඳව තබා ඇති විශ්වාසය නැතිවී යා හැකි බැවිනි. අවභාවිතය මඟින්, ලාංඡන සතු පොදු වටිනාකම යටපත් කිරීම හේතුවෙන් මානුෂීය අර්බුදකාරී තත්වයන් මඟින් පීඩාවට පත් පුද්ගලයින්ට සහ ප්‍රජාවන්ට ව්‍යාපාරය වෙත ආරක්ෂිත ප්‍රවේශයට ඇති ඉඩකඩ අවහිර කරන අතර සහන සහ ආරක්ෂණ සේවා සැපයීමට ඇති සිය හැකියාව යටපත් කරයි.

යුද කාලය සහ සාම කාලය තුළදී ලාංඡන අවභාවිතා කිරීම වැළැක්වීමට සහ ඊට එරෙහිව දඬුවම් ලබා දීමට මෙන්ම ප්‍රමාණවත් දඩ සහ දඬුවම් ඇතුළත් කරමින් ලාංඡන භාවිතා කිරීම සහ ඒවා ආරක්ෂා කිරීම පිළිබඳ නීති පැනවීම සඳහා රාජ්‍යයන් විසින් පියවර ගත යුතුය.

**අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් විශේෂයෙන් හඳුනාගත් ලාංඡන සඳහා කිසිදු ආගමික, වාර්ගික, ජාතිකත්ව හෝ දේශපාලන වටිනාකමක් හෝ සම්බන්ධතාවයක් නොමැත්තේය.**

## ලාංඡන

ජිනීවා සම්මුති මඟින් ලාංඡන තුනක් සඳහා අවකාශ ලබා දේ: රතු කුරුසය, රතු අඩසඳ සහ දැනට භාවිතා නොවන රතු සිංහයා සහ රතු සූර්යයා.







### 1. රතු කුරුසය, රතු අඩසඳ සහ රතු සිංහයා සහ රතු සූර්යයා

2005 දී තෙවන අතිරේක සන්ධානය විසින් අතිරේක විශේෂිත ලාංඡනයක් හඳුන්වා දෙන ලදී: රතු පළිඟුව (දෙවන රූපය බලන්න). රතු පළිඟුව ලාංඡනය ජිනීවා සම්මුති මඟින් දක්වා ඇති ලාංඡන තුළින් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් යොදා ගැනීමටත් ඉන් දක්වා ඇති තත්වයන් යටතේ භාවිතා කිරීමටත් නිර්මිත වූවකි. එමඟින් රතු කුරුසය හෝ රතු අඩසඳ ප්‍රදර්ශනය කිරීමට අදහස් නොකරන රාජ්‍යයන් සඳහා විකල්පයක් සපයයි.



## 2. රතු පළිඟුව

රතු පළිඟුව භාවිතා කිරීමට තීරණය කළ රාජ්‍යයන්ගේ ජාතික සමාජයන් විසින් දර්ශක පරමාර්ථ සඳහා දැනට භාවිතා වන ලාංඡන එකක් හෝ කිහිපයක් ඊට ඇතුලත් කර යොදා ගනියි. (3 වන රූපය බලන්න.) ප්‍රධාන විකල්ප වනුයේ රතු පළිඟුව ලාංඡනය තුළ රතු කුරුසය, රතු අඩසඳ ඇතුළත් කිරීම හෝ රතු කුරුසය සහ රතු අඩසඳ ඒ තුළ එක්ව භාවිතා කිරීමයි.



## 3. රතු කුරුසය, රතු අඩසඳ, සහ රතු කුරුසය සහ රතු අඩසඳ එක්ව යෙදීම

තෙවන අතිරේක සන්ධානය විසින් රතු පළිඟුව භාවිතා කිරීමට තීරණය කළ රාජ්‍යයන්ගේ ජාතික සමාජ සඳහා කොන්දේසි දෙකක් සම්පූර්ණ කිරීම මත වෙනත් ලාංඡනයක් හෝ සලකුණක් රතු පළිඟුව තුළ ඇතුළත් කිරීමට ඉඩ ලබා දේ. පළමුව, අනෙක් ලාංඡනය හෝ සලකුණ දැනටමත් සක්‍රිය ලෙස භාවිතා වන්නක් විය යුතුය. දෙවනුව, එය තෙවන අතිරේක සන්ධානය සම්මත කිරීමට පෙර සන්ධාපනලාභියා ඔස්සේ (ස්විස්ටර්ලන්ත ෆෙඩරල් කවුන්සලය) අනෙකුත් ගිවිසුම්කාර පාර්ශවයන්ටත් (ජිනීවා සම්මුති සඳහා පාර්ශව වන අනෙකුත් රාජ්‍යයන්) ICRC වෙතත් පැවති සන්නිවේදනය තුළ වූ වස්තුවක් විය යුතුය. මේ වන විට, මෙකී කොන්දේසි දෙක සපුරන එකම අනෙකුත් ලාංඡනය වනුයේ ඊශ්‍රාලයේ ඊශ්‍රාලයීය ජාතික සමාජය විසින් 1930 ගණන් වල සිට භාවිතා කරන ඩේවිඩ්ගේ රතු පළිහයි (Magen David Adom) (4 වන රූපය බලන්න).



## 4. රතු පළිඟුව තුළ ඩේවිඩ්ගේ රතු පළිහ






# 14. අතුරුදන් වූ පුද්ගලයින් සහ පවුල් සබඳතා යථාවත් කිරීම සම්බන්ධව අන්තර්ජාතික මානුෂවාදී නීතිය කියන්නේ කුමක්ද?

ගැටුම් සහ ව්‍යසනයන් භෞතික තුවාල වලට වඩා යමක් ශේෂ කරයි: දරුවන්ගේ, කලත්‍රයාගේ හෝ දෙමව්පියන්ගේ ඉරණම පිළිබඳ අවිනිශ්චිතතාවෙන් යුතු අවුරුදු ගණනාවක් පුරා දිවෙන කටුක වේදනාවක් උරුම කරදෙමින් මිනිත්තු කිහිපයකදී පවුලේ සාමාජිකයින් එකිනෙකාගෙන් වෙන් කිරීමට කලබලය, සංත්‍රාසය සහ භීතිය තුළ හැකියාව පවතී. ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන විසින් විශේෂයෙන්ම, නිදහස අහිමි කරන ලද පුද්ගලයින්ගේ තොරතුරු වාර්තා තැබීමට අදාළ බැඳීම්, මියගිය තැනැත්තන්ට අදාළ බැඳීම්, සහ සිය ඥාතීන්ගේ ඉරණම පිළිබඳ දැනගැනීමට පවුල් වෙත ඇති අයිතියට අදාළ බැඳීම් සපයමින් පුද්ගලයින් අතුරුදහන් වීම වැළැක්වීම තහවුරු කිරීමට ප්‍රයත්න දරයි.

## නිදහස අහිමි කරන ලද පුද්ගලයින්

සන්නද්ධ ගැටුමට සම්බන්ධ සෑම පාර්ශවයක් විසින්ම නිදහස අහිමි කරන ලද සියලු පුද්ගලයින්ගේ, යුද සිරකරුවන්ගේ, නිදසුනක් ලෙස, පරිපාලනමය ලෙස නිදහස අහිමි කළ සිවිල් වැසියකුගේ පුද්ගලික තොරතුරු වාර්තා තැබිය යුතුය (10 වන ප්‍රශ්නය බලන්න). මෙම තොරතුරු අල්ලා ගැනීමට අදාළ ආකෘති පත්‍රයක් හෝ පරිපාලනමය වශයෙන් නිදහස අහිමි කිරීමට අදාළ පත්‍රයක් ලෙස යුද සිරකරුවාට හෝ පරිපාලනමය ලෙස නිදහස අහිමි කළ පුද්ගලයාට සැපයිය යුතුය. මෙම සියලු තොරතුරු ආරක්ෂක බලයන් මාර්ගයෙන්, එනම්, ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ගේ ලැදියාවන් ආරක්ෂා කිරීමට පත් කර ඇති මධ්‍යස්ථ රාජ්‍යයන්, සහ සතුරු රාජ්‍යයේ සිටින ඔවුනගේ ජාතිකයින් (19 වන ප්‍රශ්නය බලන්න) හෝ ICRC මාර්ගයෙන් ඥාතීන් වෙතද යැවිය යුතුය. නිදහස අහිමි කළ පුද්ගලයින්ට තම පවුල් සමග පණිවුඩ හුවමාරු කරගැනීමටද අයිතිය තිබේ (කෙසේ වෙතත් පරම හමුදා අවශ්‍යතාවයක් මත, සන්නිවේදනයට ඇති අයිතිය සීමා කළ හැකිය).

## මිය ගිය තැනැත්තන්

ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශව විසින් මිය ගිය තැනැත්තන් සෙවීමට, එකතු කිරීමට සහ ඉවත් කිරීමට මෙන්ම මෘත ශරීර පැහැර ගැනීම වැළැක්වීමට ගත හැකි සියලු ම ක්‍රියාමාර්ග ගත යුතුය. මිය ගිය තැනැත්තාගේ පාර්ශවය හෝ ඔහුගේ/ඇයගේ ඥාතීන් විසින් මිය ගිය තැනැත්තාගේ ශේෂයන් ඉල්ලා සිටින විට, ගැටුමට සම්බන්ධ පාර්ශව විසින් එකී ශේෂයන් ආපසු භාරදීම සඳහා පහසුකම් සැපයීමට ප්‍රයත්න දැරිය යුතුය. මිය ගිය තැනැත්තන්ව ගෞරව සම්ප්‍රයුක්තව බැහැර කළ යුතු අතර ඔවුන්ගේ සොහොන්වලට ගරු කිරීම සහ ඒවා නිසි අයුරින් නඩත්තු කිරීම කළ යුතුය. මිය ගිය තැනැත්තාව හඳුනාගැනීම පිණිස ඔවුන්ගේ අවසන් කටයුතු කිරීමට පෙරාතුව පවතින සියලුම තොරතුරු වාර්තාගත කළ යුතු අතර ඔවුන්ගේ සොහොන් පිහිටි ස්ථානය සලකුණු කළ යුතුය.

## දැන ගැනීමට ඇති අයිතිය

අන්තර්ජාතික සන්නද්ධ ගැටුමක පාර්ශවයන් විසින් අතුරුදහන් වූ පුද්ගලයින්ගේ ඉරණම පිළිබඳව පැහැදිලි කිරීමට අවශ්‍ය ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතු බව අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් දක්වයි (කොටුව බලන්න); තවද, සිය ඥාතීන්ගේ ඉරණම සම්බන්ධයෙන් දැන ගැනීමට පවුලේ සාමාජිකයින්ට අයිතියක් ඇති බව එමගින් සඳහන් කරයි. මූලධර්මයානුකූලව ගත් කළ, 'අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ පවුලේ සාමාජිකයෙකු' යන්නට සුදුසුකම් ලබන්නේ කවුරුන්ද යන්න දේශීය නීතිය මඟින් අර්ථකථනය කරයි. එසේ වුවද, සෑම නිර්වචනයක්ම අවම වශයෙන් ආසන්නතම ඥාතීන් ඇතුළත් කළ යුතු බව දැක්වීම සඳහන් කිරීමෙහිලා වටී. නිදසුන් ලෙස:

- වලංගු විවාහයකින් හෝ ඉන් පරිබාහිරව උපන් දරුවන්, දරුකමට හදාගත් දරුවන් සහ සුළු දරුවන්
- ජීවිත සහකරුවන්, නීත්‍යානුකූලව විවාහ වූ හෝ විවාහ නොවූ
- දෙමව්පියන් (නැන්දණියන්, මාමණ්ඩියන් සහ දරුකමට හදාගැනීම කළ දෙමව්පියන්)
- එකම දෙමව්පියන්ගෙන් හෝ වෙනස් දෙමව්පියන්ගෙන්, උපත ලද සහෝදරයින් සහ සහෝදරියන් හෝ හදාගත් සහෝදරයින් සහ සහෝදරියන්

ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවය විසින් සතුරු පාර්ශවය විසින් අතුරුදහන් බව වාර්තා කළ පුද්ගලයින් සෙවිය යුතුය.

අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ ගිවිසුම් රීති එතරම් වර්ධනය වූ ඒවා නොවේ. කෙසේ වුවද, ඉහත විස්තර කළ බොහෝ රීති, චාරිත්‍රානුකූල නීතිය ලෙස අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් ද්විත්වයටම අදාළ වේ.

**අතුරුදහන්වූ පුද්ගලයින්** යනු තම පවුල් විසින් කිසිදු තොරතුරක් නොදන්නා පුද්ගලයින් සහ/හෝ අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක හෝ වෙනත් යම් ප්‍රචණ්ඩකාරී තත්වයක ප්‍රතිඵලයක් ලෙස, විශ්වාස කළ හැකි තොරතුරු මත අතුරුදහන් වී ඇති බවට වාර්තා වන පුද්ගලයින් වේ.

මිනිසුන් අතුරුදහන් විය හැකි වාතාවරණයන් විවිධාකාර වේ. පහතින් දැක්වෙන්නේ ඊට නිදසුන් කිහිපයකි :

- සන්නද්ධ බලකා හෝ සන්නද්ධ කණ්ඩායම් වෙත බැඳුණු සිය ඥාතීන් හා සම්බන්ධතා පැවැත්වීම සඳහා ක්‍රමයක් නොමැති වීම මත බොහෝ විට පවුල් වලින් එම තැනැත්තන් හා සම්බන්ධතාවය ගිලිහේ. සන්නද්ධ බලකා හෝ සන්නද්ධ කණ්ඩායම්වල සාමාජිකයින් ක්‍රියාන්විතය අතරතුරදී මිය යන විට දී ඔවුන් සතුව අනන්‍යතා සංකේත වැනි අනන්‍යතාවය පිළිබිඹු කිරීමෙහිලා අවශ්‍ය ආකාරයකින් සමන්විත නොවෙන්නේ නම් එම පුද්ගලයින් අතුරුදහන් වූවන් ලෙස ප්‍රකාශ කරයි.

- අල්ලා ගන්නා ලද, අත්අඩංගුවට ගන්නා ලද හෝ පැහැර ගන්නා ලද තැනැත්තන් රහසිගතව සිර අඩස්සියේ හෝ නොදන්නා ස්ථානයක හෝ රඳවා තබා ගත හැකි අතර රඳවා තබා ගැනීමේදීම මිය යා හැකිය. මෙවැනි බොහෝ අවස්ථා වලදී, ඔවුන් කොහේ සිටිත් දැයි ඔවුනගේ පවුල් නොදන්නා අතර, එම තැනැත්තන්ව බැලීමට හෝ ඔවුන් සමග පණිවුඩ හුවමාරු කරගැනීමට අවසර නොලැබේ. බොහෝ විටදී, නිදහස අහිමි කරන ලද පුද්ගලයින් පිළිබඳ තොරතුරු (අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, මරණය හෝ භූමදානයට අදාළ දිනය හා ස්ථානය) වාර්තා නොකරයි; නැතහොත් එවැනි තොරතුරු ඇතුළත් වාර්තා සඟවා තැබීම හෝ විනාශ කිරීම සිදු කරයි.

- සමූහ ඝාතන වලින් පසුවද බොහෝ පුද්ගලයින් අතුරුදහන්වූවන් ලෙස වාර්තා වේ. බොහෝ අවස්ථා වල, වින්දිතයින්ගේ මෘත ශරීර ඔවුන් මිය ගිය ස්ථාන වලම අත්හැරදැමීම, කඩිමුඩියේ වළදැමීම, වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කර තිබීම හෝ විනාශ කිරීම පවා දැකිය හැකි වේ.

- අවතැන් වූ පුද්ගලයින් සහ සරණාගතයින්, ගැටුම හේතුවෙන් හුදෙකලා වූ පුද්ගල කණ්ඩායම් සහ අත්පත් කරගත් ප්‍රදේශ වල ජීවත් වන පුද්ගලයින්හට සිය ප්‍රියාදරයන් වෙත පණිවිඩ ලබා දී ගත නොහැකි විය හැකිය. මෙම වාතාවරණයන් මඟින් දීර්ඝ වෙන්වීම් නිර්මාණය කළ හැකිය.

- ගැටුම් පවතින ප්‍රදේශයන්ගෙන් පලා යෑමට කරන බලපෑමට හසුවූ සිය පවුල් වලින් වෙන් වීම, සන්නද්ධ බලකා හෝ සන්නද්ධ කණ්ඩායම් සඳහා බලහත්කාරයෙන් සිදු කරන බඳවා ගැනීම්, සිරගත කිරීම් හෝ කඩිනමින් සිදු කරන කුලවද්දා ගැනීම් මත ළමුන් ද අතුරුදහන් විය හැකිය.
- අවසාන වශයෙන්, මෘත ශරීර ගොඩ ගෙන පශ්චාත් මරණ පරීක්ෂණ පවත්වන විටදී මිය ගිය පුද්ගලයෙකුගේ අනන්‍යතාවය හඳුනා ගැනීමට මඟ පෙන්විය හැකි තොරතුරු සෑම විටම නිසි ලෙස ගබඩා කිරීම හෝ කළමණාකරණය නොකරයි.

## බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය ගනුදෙනු කරන්නේ කෙසේද?

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (2006) මඟින් 'බලහත්කාර' හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම යන්න පහත පරිදි නිර්වචනය කරයි:

"රාජ්‍යයේ නියෝජිතයින් හෝ රාජ්‍යයේ අනුමැතිය, සහයෝගය හෝ එකඟත්වය මත ක්‍රියා කරන පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් විසින් සිදු කරන අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, පැහැර ගැනීම හෝ වෙනත් ආකාරයකින් නිදහස අහිමි කිරීම මඟින් සහ පසුව එකී නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ අතුරුදහන් වූ තැනැත්තාගේ ඉරණම හෝ කොහේ සිටිත් දැයි පිළිබඳ සැඟවීම මඟින් යම් පුද්ගලයෙකුව නීතියේ ආරක්ෂණයට පරිබාහිර තැනැත්තෙකු බවට පත් කිරීමයි."

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීති පරාසයක් උල්ලංඝනය කරන අතර විශේෂයෙන්ම, අත්තනෝමතික ලෙස නිදහස අහිමි කිරීමට එරෙහි තහනම, වධහිංසා පමුණුවීම සහ වෙනත් කෲර හෝ අමානුෂික සැලකීම්වලට එරෙහි තහනම සහ මිනී මැරීමට එරෙහි තහනම වැනි තහනම් උල්ලංඝනය කරයි. මීට අමතරව, අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් වලදී, නිදහස අහිමි කරන ලද පුද්ගලයින්ට අදාළව ලියාපදිංචි කිරීම, සංචාර, තොරතුරු හුවමාරු කිරීම වැනි පුළුල් අවශ්‍යතා මඟින් විශේෂයෙන්ම, බලහත්කරයෙන් අතුරුදහන් කිරීම් වැළැක්වීම අරමුණු කර ගෙන ඇත. නිදහස අහිමි කරන ලද පුද්ගලයින්ව ලියාපදිංචි කිරීම ඇතුළු ක්‍රමවේද ඔස්සේ අතුරුදහන් වීම් වැළැක්වීම සඳහා අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක දී ද පියවර ගත යුතුය. සන්නද්ධ ගැටුමක ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූ බව වාර්තා වන පුද්ගලයින්ට අදාළව ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගැනීමටත් ඔවුනගේ ඉරණම සම්බන්ධව පාර්ශව සතු ඕනෑම තොරතුරක් පවුලේ සාමාජිකයින්ට ලබා දීමටත් ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවය වෙත බල කෙරෙන, පවුල් ජීවිතය සඳහා වන ගරුත්වයට අදාළ රීතියේ ආලෝකයෙන්ද බලහත්කරයෙන් අතුරුදහන් කිරීමට එරෙහි තහනම විවරණය කළ යුතුය. මෙම රීතීන්හි සමුච්චිත බලපෑම මඟින් කියාපානුයේ බලහත්කරයෙන් අතුරුදහන් කිරීමේ පරිචය අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් තහනම් කර ඇති බවයි.

## ජාතික තොරතුරු කාර්යාංශය

ගැටුමක ව්‍යාප්තිය සහ සියලු අල්ලා ගැනීම් මත සිය බලය යටතේ රඳවා සිටින යුද සිරකරුවන් සහ පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීමට ලක් වූවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමටත් ලබා දීමටත් අදාළව නිළ තොරතුරු කාර්යාංශයක් ගැටුමට සම්බන්ධ පාර්ශව විසින් ස්ථාපිත කළ යුතු බව ජිනීවා සම්මුති (තෙවන ජිනීවා සම්මුතියේ 122 වගන්තිය හා සිව්වන ජිනීවා සම්මුතියේ 136 වන වගන්තිය බලන්න) මඟින් දක්වයි. සෑම සටන්කාමී පාර්ශවයක් විසින්ම සිය බලය යටතේ රඳවා සිටින සියලු යුද සිරකරුවන් සහ පරිපාලනමය ලෙස නිදහස අහිමි කිරීමට ලක් වූ සිවිල් වැසියන් පිළිබඳව සිය තොරතුරු කාර්යාංශය දැනුවත් කළ යුතු අතර මෙම පුද්ගලයින්ගේ ඥාතීන්ට හැකි ඉක්මනින් දැනුවත් කළ හැකි වන පරිදි ඔවුන්ගේ අනන්‍යතාවය සම්බන්ධ දැනට පවතින සෑම දත්තයක්ම පාහේ ලබා දිය යුතුය. ජිනීවා සම්මුති සඳහා පාර්ශව වන රාජ්‍යයන්ගේ මෙම කාර්යාංශ බොහෝ විට ජාතික රතු කුරුස හෝ රතු අඩ සඳ සමාජ යටතේ ක්‍රියාත්මක වේ.

## මධ්‍යම තොරතුරු ගවේෂණ ඒජන්සිය

"මධ්‍යස්ථ රාජ්‍යයක් තුළ යුද සිරකරුවන් පිළිබඳ මධ්‍යම තොරතුරු ඒජන්සියක් (A Central Prisoners of War Information Agency) පිහිටුවිය යුතුය. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින්, අවශ්‍ය බව පෙනී යන්නේ නම්, එවැනි ඒජන්සියක සංවිධානය පිළිබඳව අදාළ පාර්ශවයන්ට යෝජනා කළ හැකිය. මෙම ඒජන්සියේ කාර්ය වනුයේ නිළ හෝ පුද්ගලික මාර්ග ඔස්සේ යුද සිරකරුවන් සම්බන්ධයෙන් තමන් වෙත ලැබෙන සියලු තොරතුරු එකතු කිරීමත් හැකි ඉක්මනින් ඒවා යුද සිරකරුවන්ගේ රාජ්‍ය වෙත හෝ යුද සිරකරුවන් යැපෙන බලය වෙත සම්ප්‍රේෂණය කිරීමත්ය." (තෙවන ජිනීවා සම්මුතියේ 123 වන වගන්තිය; පරිපාලනමය ලෙස නිදහස අහිමි කළ සිවිල් වැසියන්ට අදාළව සිව්වන ජිනීවා සම්මුතියේ 140 වන වගන්තිය වැඩිදුරටත් බලන්න). ICRC භාරයේ ක්‍රියාත්මක වන මෙම ඒජන්සිය මඟින් සිරකරුවන් නොවන පුද්ගලයින්, සිවිල් වැසියන් සහ සරණාගතයින් වැනි අනෙකුත් පුද්ගල කාණ්ඩ සම්බන්ධයෙන් සිදු කරන සියලුම ක්‍රියාකාරකම් ඉස්මතු කිරීමේ අරමුණෙන් 1960 දී එහි නාමය මධ්‍යම තොරතුරු ගවේෂණ ඒජන්සිය (Central Tracing Agency) ලෙස වෙනස් කරන ලදි.




# 15. මානුෂවාදී ප්‍රවේශය සහ සහය සැපයීම සම්බන්ධයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි දැක්වෙන්නේ මොනවාද?

අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් මානුෂවාදී සහය සැපයීම සඳහා සැලකිය යුතු අවශ්‍යතා ඇති කරයි. සිවිල් වැසියන්ට බොහෝ විට යුද්ධය නිසා මූලික අවශ්‍යතාවයන් වන ආහාර, ජලය සහ නවාතැන් ආදිය අහිමි වන අතර සෞඛ්‍ය සේවා සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශයන්ද අහිමිවේ. ඒ සදහා බලපාන හේතූන් විවිධය. යුද මෙහෙයුම් හේතුවෙන් දේපළ විනාශ විය හැකි අතර බිම් බෝම්බ, පොකුරු බෝම්බ හෝ යුද්ධයේ වෙනත් පිපිරුම් ශේෂ විසරණය හේතුවෙන් ගොවි බිම් භාවිතා කළ නොහැකි තත්වයට පත් විය හැක.




සමස්ත ජනගහනයටම සිය සම්ප්‍රදායික ආදායම් මාර්ග අතහැර, ඔවුනගේ නිවෙස්වලින් පිටව යාමට සිදු විය හැකිය. මීට අමතරව, සමස්ත රටවල හෝ කලාපයන්ගේ ස්ථාවරභාවයට දීර්ඝ කාලීන බලපෑම් එල්ල කරමින්, ආර්ථික හා අනෙකුත් යටිතල පහසුකම්වලට අලාභ හෝ බාධාකිරීම් සිදු විය හැකිය.

අන්තර්ජාතික නීතියට අනුව, සිය පාලනය යටතේ සිටින සිවිල් වැසියන්ගේ සහ සිවිල් ජනගහනයේ මූලික අවශ්‍යතා සපුරාලීම සහතික කිරීමේ මූලික වගකීම රාජ්‍යයන් දරයි. කෙසේ වෙතත්, රාජ්‍යයන්ට තම වගකීම් ඉටු කළ නොහැකි නම් හෝ සිය වගකීම් ඉටු කිරීමට අකමැති නම්, අදාළ රාජ්‍යයේ අනුමැතියට යටත්ව මානුෂවාදී සංවිධාන වැනි සෙසු පිරිස විසින් සහන ක්‍රියාමාර්ග සැලසීම සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතිය ඉඩ සලස්වයි. ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීම සඳහා මානුෂවාදී සංවිධානවලට පීඩාවට පත්වූ ජනතාව වෙත ළඟාවීමට කඩිනම් හා බාධාවකින් තොර ප්‍රවේශය ලබා දිය යුතුය.

මානුෂවාදී සහය සඳහා අදාළ නෛතික රාමුව ජිනීවා සම්මුති සහ ඒවායේ (1977) අතිරේක සන්ධානයන්හි මෙන්ම චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදි නීතියෙහි ද දක්නට ඇත. මානුෂවාදී ප්‍රවේශය සහ සහය පිළිබඳ අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීති මඟින්, පළමුවෙන්ම, සහන ක්‍රියාමාර්ග සඳහා අවසර දිය හැකි බවත්, ආක්‍රමණයක් සිදුව ඇති තත්වයක සිවිල් ජනගහනයට ප්‍රමාණවත් සැපයුම් නොමැති විට දී සහන ක්‍රියාමාර්ග සඳහා අනුමැතිය අනිවාර්යෙන්ම දිය යුතු බවයි. දෙවනුව, පීඩාවට පත්වූ ජනතාවට මානුෂවාදී සහන සැලසීම පහසු කිරීමේ අරමුණින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය එම මෙහෙයුම් සඳහා අදාළ කොන්දේසි විස්තරාත්මකව දක්වයි.

## සහන ක්‍රියාමාර්ග සැලසීමට බැඳී සිටීම

I සහ II වන අතිරේක සන්ධාන වල අදාළ විධිවිධාන මඟින් ජනගහනයට එහි පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සැපයුම් හිඟ වූ විට සහන ක්‍රියාකාරකම් “සිදු කළයුතු” බව නියම කර ඇති අතර එමගින් නීත්‍යානුකූල බැඳීමක් පැහැදිලිව තහවුරු කෙරේ. කෙසේ වෙතත්, ඔවුන් තවදුරටත් පවසන්නේ එවැනි බැඳීමක් අදාළ රාජ්‍යයේ අනුමතියට යටත් වන බවයි (ආක්‍රමණයක දී හැර). මේ අනුව පෙනෙන පරිදි, පරස්පර විරෝධී අවශ්‍යතා දෙකක් අතර තුලනයක් සොයා ගත යුතුය: එක් අතකින් සහන ක්‍රියාමාර්ග ගත යුතු අතර අනෙක් අතින් අදාළ රජයේ අනුමතිය ලබා ගත යුතුය.

අනුමැතිය ලබා දීම සඳහා වූ කොන්දේසි සන්දර්භය අනුව වෙනස් වේ:

- අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලදී - ආක්‍රමණය කර ඇති භූමි ප්‍රදේශයන්හි ඔවුන් යුද නොවදින විට - අත්තනෝමතික හේතු මත අදාළ පාර්ශවයන් විසින් අනුමතිය ලබා නොදී නොසිටිය යුතුය: සහන ක්‍රියාමාර්ග ගැනීම සඳහා යම් අවහිරතාවක් (අවහිරතා) ඇත්නම් ඒවා වලංගු හේතු මත පදනම් විය යුතුය. විශේෂයෙන්ම, සිවිල් ජනතාවට සාගින්න තර්ජනයක්ව ඇති බව තහවුරු වන්නේ නම් සහ අපක්ෂපාතී සහ කිසිදු වෙනස්කොට සැලකීමකින් තොරව සහන සලසන මානුෂවාදී සංවිධානයකට එම තත්වයට පිළියම් යෙදිය හැකි නම්, ඊට අනුමතිය ලබා දීමට පාර්ශවය බැඳී සිටී.
- අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වල දී ඉහත දක්වා ඇති නීතිම අදාළ වේ. කෙසේ වෙතත්, සහන සපයනුයේ රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායමක් විසින් පාලනය කරනු ලබන භූමි ප්‍රදේශයන්හි සිටින සිවිල් වැසියන් සඳහා නම්, භෞමික රාජ්‍යයේ අනුමතිය අවශ්‍යද යන්න තවමත් විවාදාත්මක කරුණක් ලෙස පවතී.
- ආක්‍රමණය කර ඇති ප්‍රදේශවල ජනගහනය වෙත ආහාර හා වෛද්‍ය සැපයුම් ලැබීම තහවුරු කිරීම සඳහා ආක්‍රමණකාරි පාර්ශවයට වගකීමක් තිබේ. විශේෂයෙන්ම, අල්ලා ගෙන සිටින භූමියේ සම්පත් ප්‍රමාණවත් නොවන්නේ නම්, අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, වෛද්‍ය උපකරණ සහ අනෙකුත් දෑ එම රාජ්‍ය විසින් රැගෙන ආ යුතු ය. අල්ලා ගෙන සිටින භූමියක ජනගහනයෙන් සියලු දෙනාට හෝ ඉන් කොටසකට අවශ්‍ය සැපයුම් ප්‍රමාණවත් ලෙස සපයා නොමැති නම්, ජනගහනයට ආධාර කිරීම සඳහා වූ සහන යෝජනා ක්‍රම සඳහා අනුමතිය ලබා දීම සඳහා ආක්‍රමණකාරි පාර්ශවය සතුව බැඳීමක් පවතී.

## මානුෂීය ආධාර ලබා දිය යුත්තේ කුමන කොන්දේසි යටතේ ද?

දෙවන නීති මාලාව මානුෂීය සහන ලබා දිය යුතු කොන්දේසි පිළිබඳව දක්වයි. ඒවා පහත පරිදි වේ:

- මනුෂ්‍යත්වය, අපක්ෂපාතීත්වය සහ වෙනස්කොට නොසැලකීම: අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විධිවිධාන අදාළ වන්නේ කිසිදු වෙනස්කොට සැලකීමකින් තොරව අපක්ෂපාතී හා මානුෂීය ස්වභාවයෙන් යුතුව සිදුකරන ආධාර සඳහා පමණි. මෙයින් අදහස් කරන්නේ, විශේෂයෙන්ම, ඔවුන්ගේ පාර්ශවය කුමක් වුවත්, ඔවුන්ගේ ආගම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනාදිය කුමක් වුවත් අවශ්‍යතා ඇති සියලුම පුද්ගලයින්ට සහන ලබාදිය යුතු බවයි.

- පාලනය: විශේෂයෙන්ම, සහන සැපයුම් මාර්ගය පාලනය කිරීමට සහ එය අධීක්ෂණය සඳහා අවශ්‍ය විධිවිධාන ඇතුළු තාක්ෂණික සැකැස්මක් සකස් කිරීම මඟින් සහන සැපයුම් මාර්ගය සඳහා ඉඩ ලබා දෙන පාර්ශවයන්ට එහි බෙදා හැරීම පාලනය කළ හැකිය.

## අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ 'මානුෂවාදී හේතූන් මත මැදිහත්වීමට ඇති අයිතිය'

'මැදිහත්වීමේ අයිතිය - නැතහොත් යුතුකම' යන්න මානුෂවාදී හේතූන් මත සන්නද්ධ මැදිහත්වීම සාධාරණීකරණය කිරීම හා සමාන වේ. මෙය අන්තර්ජාතික මානුෂවාදී නීතිය සම්බන්ධව නොව ජාත්‍යන්තර සබඳතා තුළ සන්නද්ධ බලය යෙදවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ රීති වලට අදාළ කාරණයකි: වෙනත් වචන වලින් කිවහොත් එය jus ad bellum 'යුද වැදීමේ අයිතිය' සම්බන්ධ කාරණයකි. 'ආරක්ෂා කිරීමට ඇති වගකීම' යන සංකල්පය, මානුෂවාදී හේතූන් මත මැදිහත්වීම සඳහාවූ 'අයිතියක්' හෝ 'යුතුකමක්' යන සංකල්පය මගින් ක්‍රමිකව ප්‍රතිස්ථාපනය කරමින් තිබේ. (2 වන ප්‍රශ්නය බලන්න).

2005 දී ප්‍රකාශයට පත් කරන ලද ICRC විසින් සිදු කරන ලද චාරිත්‍රානුකූල නීතිය පිළිබඳ අධ්‍යයනය මඟින් මානුෂීය සහය සැපයීම පිළිබඳ පහත සඳහන් රීති හඳුනාගෙන ඇත. අන්තර්ජාතික හා අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් යන අවස්ථා දෙකේදීම මෙම රීති අදාළ වේ:

- මානුෂවාදී සහන: මානුෂවාදී සහන සේවා සලසන පිරිස් සහ ඊට යොදා ගන්නා දේපළ වලට ගරු කළ යුතු අතර ඔවුන්/ඒවා ආරක්ෂා කළ යුතුය.

- සහන සැපයීම අපක්ෂපාතී ස්වභාවයකින් යුතු හා වෙනස්කොට සැලකීමකින් තොර නම්, ගැටුමට සම්බන්ධ පාර්ශව විසින් අවශ්‍යතා ඇති සිවිල් වැසියන් වෙත කඩිනමින් හා බාධාවකින් තොරව මානුෂවාදී සහන සැපයුම් මාර්ගය සඳහා සිය පාලන අයිතියට යටත්ව අවසර දීම සහ පහසුකම් සැලසීම සිදු කළ යුතුය.

- ගැටුමට සම්බන්ධ පාර්ශවයන් විසින් අවසරලත් මානුෂවාදී සහන සපයන පුද්ගලයින්ට තම කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය යාමේ සහ ඒමේ නිදහස තහවුරු කළ යුතුය. අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවයක දී පමණක් ඔවුන්ගේ යාම්ඒම් තාවකාලිකව සීමා කළ හැකිය.

- යුද විධික්‍රමයක් ලෙස සිවිල් ජනතාව නිරාහාරව තැබීම තහනම්ය.



# 16. අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් සරණාගතයින් සහ අභ්‍යන්තරව අවතැන් වූවන් ආරක්ෂා කරනුයේ කෙසේද?

සරණාගතයින් යනු සිය මව්රටේ පීඩා නිසා ජාත්‍යන්තර සීමාව පසුකර පැමිණ සිටින අවදානමක පසුවන හෝ වින්දිතයින් බවට පත්ව සිටින පුද්ගලයින් වේ. අනෙක් අතට, අභ්‍යන්තරව අවතැන්වූවන් යනු ජාත්‍යන්තර සීමාව පසු කිරීමක් නොකළ නමුත් සිය නිවෙස් වලින් පලා යෑමට සිදු වූ තැනැත්තන් ය. (පහත කොටුව බලන්න.)

ප්‍රධාන වශයෙන්, සරණාගත තත්වය පිළිබඳ සම්මුතිය (1951) සහ අප්‍රිකාවේ සරණාගත ගැටළු වල සුවිශේෂී අංග පාලනය කරන සම්මුතිය (1969) සහ මානව අයිතිවාසිකම් නීතිය මෙන්ම, විශේෂයෙන්ම, තම පීඩකයා වෙත නැවත නොයැවීමේ මූලධර්මය ((Non-refoulment) ඇතුළු සරණාගත නීතිය මඟින් සරණාගතයින් ආරක්ෂා කෙරේ.




සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ වරය යටතට ඔවුන් ගැනේ. සරණාගතයින්, සන්නද්ධ ගැටුමකට සම්බන්ධ වී ඇති රාජ්‍යයක සිටින විට ද ඔවුන්ට අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ආරක්ෂණය හිමි වේ. සිවිල් වැසියන් සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් සපයා ඇති පොදු ආරක්ෂණය හැරුණු කොට, සරණාගතයින් විසින් සිව්වන ජිනීවා සම්මුතිය සහ පළමු අතිරේක සන්ධානය යටතේ විශේෂ ආරක්ෂණයකට හිමිකම් ලබයි. නිදසුනක් ලෙස, සිව්වන ජිනීවා සම්මුතියේ 44 වන වගන්තිය පැහැදිලිව දක්වනුයේ සැබෑ ලෙසම, කිසිදු රජයක ආරක්ෂණයක් භුක්ති නොවිඳින, සරණාගතයින්හට රඳවා තබා ගන්නා අධිකාරීන් විසින් සතුරෙකු ලෙසට සැලකීම් නොකළ යුතු බවයි. පළමු අතිරේක සන්ධානයේ 73 වන වගන්තිය මඟින් එක් කරනුයේ කිසිදු වෙනස්කොට සැලකීමකින් තොරව, සෑම අවස්ථානුගත අවස්ථාවකදීම සරණාගතයින් ආරක්ෂිත පුද්ගලයින් ලෙස සැලකිය යුතු බවයි.

කෙසේ නමුදු, අභ්‍යන්තරව අවතැන්වූවන්ට අවශ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂයෙන් ආමන්ත්‍රණය කෙරෙන විශ්වීය ගිවිසුමක් නැත. 2012 වර්ෂයේ දී බලාත්මක වූ අප්‍රිකාවේ අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ ආරක්ෂාව සහ සහය සඳහා වන සම්මුතිය (කම්පාලා සම්මුතිය), අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ ආරක්ෂණය සහ සහය පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කළ පළමු අන්තර්ජාතික ගිවිසුමයි.

දේශීය නීතිය, මානව අයිතිවාසිකම් නීතිය වැනි විවිධ නීති පද්ධති මඟින් අභ්‍යන්තරව අවතැන්වූවන් ආරක්ෂා කරන අතර, සන්නද්ධ ගැටුමකට සම්බන්ධ රාජ්‍යයක් තුළ ඔවුන් සිටින්නේ නම්, අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ආරක්ෂණයද හිමි වේ. අභ්‍යන්තරව අවතැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශන මූලධර්ම (1998) යනු අභ්‍යන්තරව අවතැන්වූවන් සම්බන්ධව වටිනා, බැඳීමක් ඇති නොකරන නෛතික ලේඛනයකි. මෙම මූලධර්ම මඟින් පවතින අන්තර්ජාතික නීතිය පිළිබිඹු කරන අතර නැවත පැමිණීම, නැවත පදිංචි කරවීම සහ යළි එකතු කිරීම ඇතුළු අවතැන්වීමට අදාළ සෑම අදියරකදී ම අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ ආරක්ෂණය සඳහා අන්තර්ජාතික රාමුවක් මේ තුළින් සපයන බව පුළුල්ව පිළිගත්තකි.

සිවිල් වැසියන්ගේ ආරක්ෂණයට අදාළව අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් දක්වන රීතීන්ට ගරු කරන්නේ නම්, අවතැන්වීම වැළැක්විය හැකිය. පහත සඳහන් තහනම් දක්වන රීති විශේෂයෙන් සඳහන් කළ යුතුය:

- සිවිල් වැසියන් සහ සිවිල් වස්තූන් වෙත ඍජුව ප්‍රහාර එල්ල කිරීම හෝ ඉවක් බවක් නැති ප්‍රතිවිපාක සහිත ප්‍රහාර එල්ල කිරීම
- සිවිල් ජනතාව නිරාහාරව තැබීම සහ ඔවුනගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය දේවල් විනාශ කිරීම
- සාමූහික දඬුවම් - වාසස්ථාන විනාශ කිරීම වැනි

තවද, ආරක්ෂක සහ අත්‍යවශ්‍ය යුදමය හේතු මඟින් කියාපාන්නේ නම් මිස, සිවිල් වැසියන්ට සිය පදිංචි ස්ථාන හැරදා යාමට බලකිරීම අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් ප්‍රකාශිතවම තහනම් කරයි.

අවතැන් වූ සිවිල් වැසියන්හට ඉඳුම් හිටුම්, සනීපාරක්ෂාව, සෞඛ්‍ය, ආරක්ෂාව සහ ආහාරපාන ප්‍රමාණවත් පරිදි ලැබෙන බවත් එකම පවුලේ සාමාජිකයින් වෙන් නොකිරීමත් තහවුරු කිරීම සඳහා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතුය. ආධාර අවශ්‍ය සිවිල් වැසියන් වෙත සහනාධාර ළඟාවීමට ගැටුමක පාර්ශවකරුවන් ඉඩ ලබා දිය යුතු යැයි දක්වන රීති මඟින් අභ්‍යන්තරව අවතැන් වූවන්ට ද ආරක්ෂණය සලසයි.

මෙම සියලු රීතීන් චාරිත්‍රානුකූල මානුෂවාදී නීතිය මඟින් හඳුනාගන්නා අතර, අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් දෙක සඳහාම අදාළ වේ.

## සරණාගතයෙක් යනු කවුද?

1967 සන්ධානය විසින් නවීකරණය කළ සරණාගත තත්වය පිළිබඳ සම්මුතියේ 1 වන වගන්තිය මඟින් සරණාගතයා නිර්වචනය කරනුයේ, “ජාතිය, ආගම, ජාතිකත්වය, යම් සමාජ කණ්ඩායමක සාමාජිකත්වය දැරීම හෝ දේශපාලන මතය වැනි හේතු මත පීඩාවට ලක්විය හැකි බවට ඇති පදනම් සහගත බිය හේතුවෙන් සිය මව්රටෙන් පිටව සිටින එකී භීතිය මත එම රටෙහි ආරක්ෂාව ලැබීමට නොහැකි හෝ ආරක්ෂාව ලබා ගැනීමට අකැමැති, හෝ ජාතිකත්වයක් නොමැති අදාළ තත්ව මත සිය පුරුදු වාසස්ථානය වූ රටින් පිටව සිටින, නැවත එම රට වෙත යාමට නොහැකි හෝ එකී බිය නිසා නැවතත් ඒ වෙත යාමට අකැමැති ඕනෑම පුද්ගලයෙක් වේ.”

අප්‍රිකාවේ සරණාගත ගැටළු වල සුවිශේෂී අංග පාලනය කරන සම්මුතිය (1969) සහ සරණාගතයින් පිළිබඳ කාර්ටජෙනා සම්මුතිය (1984) මඟින් සන්නද්ධ ගැටුම් සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී තත්ව වැනි මහජන සාමය බරපතළ ලෙස බිඳ දමන සිද්ධීන් වලින් පලායන පුද්ගලයින් ද ඇතුළත් කරන, පුළුල් නිර්වචනයක් ඉදිරිපත් කරයි.

## අභ්‍යන්තරව අවතැන්වූවෙක් යනු කවුද?

අභ්‍යන්තරව අවතැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශන මූලධර්ම (1998) වලට අනුව, අභ්‍යන්තරව අවතැන්වූවෙක් යනු “ජාත්‍යන්තරව පිළිගත් දේශ සීමාවක් පසු කර නැති, සන්නද්ධ ගැටුමක, සාමාන්‍යකරණය වූ ප්‍රචණ්ඩකාරී තත්වක, මානව අයිතිවාසිකම් උල්ලංඝනයක හෝ ස්වභාවික හෝ මිනිසා විසින් ඇති කළ ආපදාවක ප්‍රතිඵලයක් ලෙස හෝ එකී තත්වයක බලපෑමෙන් මිදීමට සිය නිවෙස් හෝ සුපුරුදු වාසස්ථානයෙන් හැරයෑමේ බලපෑමලත් හෝ පලා යාමට හෝ අතහැර දැමීමට සිදු වන පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම්” වේ.

## සන්නද්ධ ගැටුමකට මැදි වූ සංක්‍රමණිකයින්

සංක්‍රමණිකයා යන්නට විශ්වීයව පිළිගත් නිර්වචනයක් නොමැති අතර, සංක්‍රමණය කිරීමට ගන්නා තීරණය ‘ස්වේච්ඡා සහගත’ හෝ ‘බලහත්කාර’ වූවක් විය හැකි නමුදු, අතීතය හා ගත් කළ එකී ලේබල අවම පැහැදිලිකමකින් යුක්ත වේ. හදිසියේ හට ගන්නා සන්නද්ධ ගැටුම් හෝ ආපදා වැනි තත්ව, සිය නිවෙස් හැරදා යාමට පුද්ගලයින්ට බල කෙරෙන අත්‍යාසන්න හේතුව විය හැකිය. සංක්‍රමණිකයින් විසින් නිශ්චිතව කෙතරම් කාලයකට සහ කුමන ස්ථානයකට සංක්‍රමණය වන්නේද යන්න වඩා හොඳ ආර්ථික අවස්ථා සෙවීම, ක්‍රමිකව විකාශනය වන ව්‍යසනකාරී තත්ව, ක්‍රමයෙන් ඉහළ යන පාරිසරික හායනය, අයිතීන් යටපත් කිරීමේ ඉහළ යෑම් (විශේෂයෙන්ම සුළුතර ජනතාවගේ) සහ වඩා ස්ථාවර ස්ථාන තුළ ජීවත් වන පවුලේ සාමාජික සබඳතා වැනි හේතු මත තීරණය විය හැකිය. ‘මිශ්‍ර සංක්‍රමණය’ යන යෙදුම කම්කරු සංක්‍රමිකයින් හා රාජ්‍යයක් නොමැති පුද්ගලයින් සහ සරණාගතයින්, සන්නද්ධ ගැටුමකින් පලා එන දේශපාලන රැකවරණය පතන්නන් විස්තර කිරීම සඳහා වර්තමානයේදී භාවිතා කෙරේ; ‘මිශ්‍ර සංක්‍රමණය’ මඟින් ජනගහනයන්ගේ එවැනි විතැන්වීම් සඳහා හේතුපාදක වූ කරුණු වල සංයෝගය සහ සිදුවීම යන ද්විත්වයම විස්තර කරයි.

බොහෝ සංක්‍රමණිකයින් සරණාගතයින් ලෙස හැඳින්වීම සඳහා සුදුසුකම් නොලබන අතර, ඔවුන් ජාත්‍යන්තර දේශ සීමාවකින් එතෙර වූ විට, අභ්‍යන්තරව අවතැන්වූවන් යන නිර්වචනය යටතේලා නොගැනේ. ඔවුනගේ අවතැන්වීමට (හෝ සංක්‍රමණයට) පාදක වූ ආරම්භක හේතුව කුමක් වුවද, මෙම මිනිසුන් මුහුණ දෙන අසරණතාවයත් ඔවුනට අවශ්‍ය ආරක්ෂාවත් මෙන්ම මිනිස් ජාවාරම ද ඇතුළු ගමන් මඟ පුරාවට ඔවුනට මුහුණ දීමට සිදු වන සිය මානව අයිතිවාසිකම්වලට එරෙහි තර්ජන ද කිසිසේත් සුළු කොට තැකිය නොහැක.

සියලු සංක්‍රමණිකයින්ට අදාළ ආරක්ෂණය පිළිබඳව විශේෂයෙන් ආමන්ත්‍රණය කෙරෙන විශ්වීය ගිවිසුමක් නැත. දේශීය නීතිය, මානව අයිතිවාසිකම් නීතිය සහ සන්නද්ධ ගැටුමකට සම්බන්ධ රාජ්‍යයක ඔවුන් සිටින්නේ නම්, අන්තර්ජාතික මානුෂවාදී නීතිය ඇතුළු නොයෙකුත් නීති පද්ධති තුළ සම්බන්ධිත විධිවිධාන දැකිය හැකිය.

සන්නද්ධ ගැටුමකට සම්බන්ධ රාජ්‍යයක දේශසීමාව තුළ සිටින සංක්‍රමණිකයින් සිවිල් වැසියන් ලෙස හැඳින්වේ.




# 17. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ කිනම් වස්තූන් විශේෂයෙන් ආරක්ෂිතද?

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සාමාන්‍ය විධිවිධාන යටතේ සිවිල් වස්තූන් ප්‍රහාර වලින් ආරක්ෂිත වේ. සන්නද්ධ ගැටුමක වින්දිතයින්, සිවිල් ජනගහනය හෝ පොදුවේ මනුෂ්‍ය වර්ගයා ආරක්ෂා කිරීමෙහිලා ඊට අදාළ සුවිශේෂී වටිනාකම මත හෝ සන්නද්ධ ගැටුම්කාල වලදී හානියට ලක්වීමටත් විනාශවීමටත් ඇති ඊට අදාළ නිශ්චිත අසරණභාවය මත අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විශේෂ ආරක්ෂණය ද සමහර වස්තූන් වෙත සලසා තිබේ. ඊට නිදසුන කිහිපයක් පහත දැක්වේ.




## වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන

**'වෛද්‍ය ඒකක'** යන යෙදුම මගින් වෛද්‍ය අරමුණු සඳහා නිර්මිත යුද හෝ සිවිල්, නිශ්චල හෝ චංචල, ස්ථිර හෝ තාවකාලික කාර්යමණ්ඩල සහ අනෙකුත් ඒකක අදහස් කරයි. මෙම යෙදුමට, නිදසුන් ලෙස, රෝහල් සහ අනෙකුත් ඒ හා සමාන ඒකක, රුධිර පාරවිලයන මධ්‍යස්ථාන, නිවාරක වෛද්‍ය මධ්‍යස්ථාන හා ආයතන, වෛද්‍ය ගබඩා සහ එවැනි ඒකකයන්ගේ වෛද්‍ය හා ඖෂධ ගබඩා ද ඇතුළත් ය.

**'වෛද්‍ය ප්‍රවාහන'** යන යෙදුම මගින් ගැටුමට සම්බන්ධ පාර්ශවයක නිසි අධිකාරියක පාලනය යටතේ වෛද්‍ය ප්‍රවාහනය සඳහා පමණක් අනුයුක්ත කර ඇති යුද හෝ සිවිල්, ස්ථිර හෝ තාවකාලික වැනි ඕනෑම ප්‍රවාහන ආකාරයක් අදහස් කෙරේ. ගිලන් රථ, රෝහල් නෞකා සහ වෛද්‍ය ගුවන් යානා වැනි ගොඩබිම, ජලය හෝ ගුවන ආවරණය කෙරෙන ඕනෑම ආකාරයක ප්‍රවාහනයක් මීට ඇතුළත් වේ.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන වෙත හිමිවන විශේෂ ආරක්ෂණය වනාහි තුවාල වූවන් සහ රෝගී වූවන් විසින් වෛද්‍ය රැකවරණය ලබන බව තහවුරු කිරීමට සපයා ඇති ආරක්ෂණයේ අනු විධියකි. වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන වෙත හිමිවන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ආරක්ෂණය පැරණි එකකි. 1864 ජිනීවා සම්මුතිය තුළ හෝ 1899 සහ 1907 හේග් රෙගුලාසි තුළ එය සොයා ගත හැකිය. එය, පළමු සහ සිව්වන ජිනීවා සම්මුති මගින් හමුදා වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන, සිවිල් වැසියන් සඳහා වෙන්වුණු රෝහල් සහ යම් නිශ්චිත වෛද්‍ය ප්‍රවාහන ආකාර ද දක්වමින් වැඩිදුර පුළුල් කරන ලදි. 1977 දී විශේෂයෙන්ම සිවිල් වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන සෑම අවස්ථානුගත අවස්ථාවකදී ම ආරක්ෂා කිරීම ආවරණය කිරීම පිණිස පුළුල් කරන ලදි. අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක දී වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන සඳහා ආරක්ෂණය, තුවාල වූවන් සහ රෝගී වූවන් එකතු කළ යුතු බව සහ ඔවුනට රැකවරණය ලබා දිය යුතු බව දක්වන පොදු 3 වන වගන්තිය මගින් ගම්‍යමාන වේ.

දෙවන අතිරේක සන්ධානය තුළ ද මෙම ආරක්ෂණය ප්‍රකාශිතව දක්වා තිබේ. අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් දෙක සඳහාම අදාළ වන චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ නියමයක් ලෙස, සිවිල් හෝ හමුදා වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන ආරක්ෂා කිරීමටත් ගරු කිරීමටත් රාජ්‍ය පරිචය විසින් වර්තමානයේදී බැඳීමක් තහවුරු කර තිබේ.

සෑම අවස්ථානුගත අවස්ථාවකදී ම, වෛද්‍ය අරමුණු සඳහා පමණක් අනුයුක්ත කර ඇති වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන ආරක්ෂා කිරීමටත් ගරු කිරීමටත් ඇති බැඳීමෙහි:

- **ගරු කිරීම** යන්නෙන් අදහස් වන්නේ, විශේෂයෙන්ම, වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන වෙත ප්‍රහාර එල්ල නොකළ යුතු බවත් ඔවුනගේ ක්‍රියාකාරිත්වයට අනිසි ලෙස බාධා නොකළ යුතු බවයි;
- **ආරක්ෂා කිරීම** යන්නෙන් අදහස් වන්නේ, තෙවන පාර්ශවයන්ගේ ප්‍රහාරයන්ගෙන් සහ අනිසි මැදිහත්වීම් වලින් වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන මාධ්‍ය ආරක්ෂා කළ යුතු සේම, ඔවුනට සිය කාර්යයන් කිරීම සඳහා සක්‍රීයව සහය ලබා දිය යුතු බවයි. විශේෂයෙන්ම, හැකි තරමින්, වෛද්‍ය ඒකක, යුදමය ඉලක්ක පිහිටා ඇති ප්‍රදේශ සමීපයේ පිහිටුවනු නොලැබිය යුතුය. තවදුරටත් ප්‍රකාශ කරන්නේ නම්, කිසිදු වාතාවරණයක් යටතේ ප්‍රහාරයන්ගෙන් යුදමය අරමුණු ඉලක්ක කරගැනීම සඳහා වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන මාධ්‍ය පළිහක් ලෙස උපයෝගී කර නොගත යුතුය.

වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන මාධ්‍ය විසින් සිය මානුෂවාදී කාර්යයෙන් පරිබාහිරව සතුරාට හානිකර ආකාරයේ ක්‍රියා සිදු කරන්නේ නම්, ඔවුනට හිමි ආරක්ෂාව ඔවුනට අහිමි වන අතර ප්‍රහාර සඳහා ඉලක්ක ද විය හැකිය. කෙසේ වුවද, සුදුසු අවස්ථාවකදී, සාධාරණ කාල සීමාවක් දක්වමින් ඔවුන් වෙත ප්‍රහාර එල්ල කිරීමට පෙර, අනතුරු ඇඟවීමක් සිදු කළ යුතුය; අනතුරු ඇඟවීම සඳහා ප්‍රතිචාරයක් නොලැබුණ කල පමණක් ප්‍රහාරය ක්‍රියාත්මක කළ හැකිය. සතුරාට හානිකර ආකාරයේ ක්‍රියා යන්නට, යුධ වැදීමට හැකි යුද භටයින්ට නවාතැන් දෙන්නට හෝ අවි හෝ යුද්ධෝපකරණ ගබඩා කිරීමට, හෝ යුද ගවේෂණ මුරපළක් ලෙස හෝ යුද ක්‍රියාකාරකමක් සඳහා ආවරණයක් ලෙෂ වෛද්‍ය ඒකක භාවිතා කිරීම ඇතුළත් වේ. කෙසේ නමුදු, සතුරාට හානිකර ආකාරයේ ක්‍රියා සිදු කළ වෛද්‍ය ඒකක හෝ ප්‍රවාහන මාධ්‍ය තුළ සිටින තුවාල වූවන්, රෝගී වූවන් හෝ වෛද්‍ය නිලධාරීන්ගේ සුබසිද්ධිය පිණිස, යුදමය ඉලක්කයක් වෙත ප්‍රහාර එල්ල කිරීමේ දී අනුගමනය කළ යුතු සාමානුපාතිකත්ව සහ පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග වලට අදාළ රීති එවිට දී වුවද, අදාළ කරගත යුතුය.

අවසාන වශයෙන් දක්වන්නේ නම්, බලයලත් වෛද්‍ය ඒකකහට විශේෂිත ලාංඡන ප්‍රදර්ශනය කිරීම සඳහා අයිතිය තිබේ (13 වන ප්‍රශ්නය බලන්න). වෛද්‍ය ඒකක සහ ප්‍රවාහන විසින් විශේෂිත ලාංඡන ප්‍රදර්ශනය කරනවාද නැද්ද යන්න නොසලකා, ඔවුන්ව විශේෂයෙන්ම ආරක්ෂා කිරීමත් ඔවුනට ගරු කිරීමත් සිදු කළ යුතු නමුදු, විශේෂිත ලාංඡන ප්‍රදර්ශනය කිරීම මඟින් හඳුනා ගැනීම පහසු කරයි.

## සංස්කෘතික දේපළ

සිවිල් වස්තුවක් ලෙස සංස්කෘතික දේපළ සාමාන්‍යයෙන් ආරක්ෂිත වේ. මීට අමතරව, ඉතා වටිනා සිවිල් ඉලක්කයක් වීම මත, සංස්කෘතික දේපළකට විය හැකි ඕනෑම ආකාරයක හානියක් වැළැක්වීම පිණිස සුවිශේෂී රැකවරණයක් ඊට ලබා දිය යුතුය; ප්‍රශ්නගත සංස්කෘතික දේපළ, සම්බන්ධිත පුද්ගලයින්ගේ උරුමයට අදාළ වටිනා අංගයක් වන විට, මෙම විශේෂ අවධානය සඳහා ඇති අවශ්‍යතාව වඩා වැඩි වැදගත්කමක් ගනියි.

**'සංස්කෘතික දේපළ'** යන යෙදුම මගින් ආගමික, කලා, විද්‍යා, අධ්‍යාපනික හෝ පුණ්‍යමය කටයුතු සඳහා, හෝ ඓතිහාසික ස්මාරක සඳහා වෙන්කොට තිබෙන ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් අදහස් වේ. වාස්තු විද්‍යාත්මක හෝ ඓතිහාසික ස්මාරක, පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු භූමි, කලා කෘති, ග්‍රන්ථ හෝ සංස්කෘතික දේපළ දරා සිටීම ප්‍රධාන සහ සක්‍රීය පරමාර්ථය කරගත් ඕනෑම ගොඩනැගිල්ලක්, සහ සංස්කෘතික දේපළ විශාල ප්‍රමාණයක් දරන මධ්‍යස්ථාන වැනි සියලු පුද්ගලයින්ගේ සංස්කෘතික උරුමයක් වශයෙන් වැදගත් වටිනාකමක් දරන දේපළ, නිල් සහ සුදු පළිහ ඇතුළත් ලාංඡනය ප්‍රදර්ශනය කිරීම මගින් හඳුනාගත හැකිය (ඊළඟ පිටුවේ දැක්වෙන රූපය බලන්න).

**සංස්කෘතික දේපළ** සඳහා අදාළ විශේෂ ආරක්ෂණයට නෛතික පදනම 1907 හේග් රෙගුලාසි, 1954 සන්නද්ධ ගැටුමක දී සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීමට අදාළ හේග් සම්මුතිය සහ එහි සන්ධාන මෙන්ම 1977 අතිරේක සන්ධාන තුළ දක්නට ලැබේ. අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා බලපවතින චාරිත්‍රානුකූල නීතිය තුළ ද සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීමට සහ ඒවාට ගරු කිරීමට ඇති බැඳීම දක්වයි.

සංස්කෘතික දේපළවලට ගරු කිරීමට සහ ඒවා ආරක්ෂා කිරීමට ඇති බැඳීම තුළ දැක්වෙන:

- **ගරු කිරීම** යන්නෙන් අදහස් වන්නේ යුදමය ඉලක්කයක් බවට සංස්කෘතික දේපළ පත්වන්නේ නම් මිස, සංස්කෘතික දේපළට හානි වීම වැළැක්වීම සඳහා යුද මෙහෙයුම් වලදී විශේෂ අවධානයක් දැරිය යුතු බවයි.
- **ආරක්ෂා කිරීම** යන්නෙන් අදහස් වන්නේ සංස්කෘතික දේපළට කරන සියලුම ආකාරයේ බලහත්කාර අත්පත් කර ගැනීම්, විනාශ කිරීම් හා චේතනාන්විත හානි කිරීම් තහනම් බවයි. තවද, අත්පත් කරගත් දේශ භූමියෙහි පිහිටි සංස්කෘතිකමය දේපළ නීති විරෝධි ලෙස ඉන් බැහැරට ගෙන යාම බලය අත්පත් කරගෙන සිටින පාර්ශවය විසින් වැළැක්විය යුතු අතර එලෙස නීති විරෝධි ලෙස බැහැරට ගෙන යන ලද දේපළ අදාළ අත්පත් කරගත් දේශ භූමියෙහි නිසි බලධාරීන් වෙත නැවත භාරදිය යුතුය.

**මීට අමතරව, සියලු පුද්ගලයින්ගේ සංස්කෘතික උරුමයක් වශයෙන් වැදගත් වටිනාකමකින් යුතු දේපළ** ආරක්ෂා කිරීමටත් ඒවාට ගරු කිරීමටත් වැඩිදුර බැඳීම් පවතී.

- 1954 සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම පිළිබඳ හේග් සම්මුතිය මඟින් සියලු පුද්ගලයින්ගේ සංස්කෘතික උරුමයක් වශයෙන් විශේෂිත වැදගත්කමකින් යුතු දේපළ පළමුව, නිල් සහ සුදු පළිහ යොදා සලකුණු කිරීමට දිරිමත් කිරීම මඟින් එම දේපළට අදාළ ආරක්ෂණය යළි බලාත්මක කිරීමට උත්සහ දරයි. (ආසන්න රූපය බලන්න.)
- යුදමය අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය නොවන විට, එවැනි දේපළ ප්‍රහාරයන්ට ඉලක්ක නොවිය යුතුය. 1954 හේග් සම්මුතිය සඳහා වන දෙවන සන්ධානය මඟින් පැහැදිලි කරනුයේ, අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවය අත්හැරීමේ අයිතිය අයැදිය හැක්කේ, (1) ප්‍රශ්නගත සංස්කෘතික දේපළේ ක්‍රියාකාරිත්වය මඟින් එය යුදමය ඉලක්කයක් බවට පත්ව ඇති විට; සහ (2) එම අරමුණට ප්‍රහාර එල්ල කිරීම මඟින් අත්පත් කරගත හැකි යුද වාසියට සමාන වෙනත් කිසිදු සිදු කළ හැකි විකල්පයක් නොමැති තාක් පමණි. දෙවන සන්ධානය මඟින් තවදුරටත් දක්වනුයේ, එවැනි අවශ්‍යතාවයක පැවැත්ම යම් නිශ්චිත අණ දීමේ අදියරක දී ස්ථාපනය කළ යුතු බවත් ප්‍රහාරයක් එල්ල කරන්නේ නම්, අවස්ථානුගත තත්ව මගින් අවකාශ සලසන ඕනෑම අවස්ථාවක දි ඵලදායී පූර්ව අනතුරු ඇඟවීමක් සිදු කළ යුතු බවයි. පළමු අතිරේක සන්ධානයේ 1 ඡේදයේ 53 වන වගන්තිය සහ දෙවන අතිරේක සන්ධානයේ 16 වන වගන්තිය මීට අදාළව දැක්විය යුතුමය: මෙමඟින් අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාව සඳහා අයිතිය අතහැරීමක් නොසපයයි. මෙම වගන්ති මඟින්, නාමිකව, මිනිසුන්ගේ (එනම්, මනුෂ්‍ය වර්ගයාගේ) සංස්කෘතික හෝ ආගමික උරුමයේ කොටසක් වන ඉතා වැදගත් සංස්කෘතික දේපළ සීමිත ප්‍රමාණයක් පමණක් ආවරණය කරයි. අතිරේක සන්ධාන මඟින් ආවරණය කෙරෙන දේපළ සඳහා සලකුණු කිරීමකින් තොරවම ඕනෑම පුද්ගලයෙකු විසින් හඳුනාගන්නා බව ස්ථිර වන තරමේ වටිනාකමක් පැවතිය යුතුය.
- යුදමය අවශ්‍යතාව මඟින් අත්‍යවශ්‍ය වන්නේ නම් මිස, විනාශවීමට සහ හානිවීමට නිරාවරණය විය හැකි එවැනි දේපළ යුදමය භාවිතය සඳහා යොදා ගැනීම තහනම් වේ. නැවත වරක් 1954 හේග් සම්මුතියේ දෙවන සන්ධානය මඟින් පැහැදිලි කරනුයේ විනාශයට හා හානියට නිරාවරණය වීමට ඉඩ ඇති අරමුණු සඳහා සංස්කෘතික දේපළ භාවිතයට අදාළව අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවය අත්හැරීමේ අයිතිය අයැදිය හැක්කේ "සංස්කෘතික දේපළ වල එවැනි භාවිතය සහ සමාන යුදමය වාසියක් අත් කරගැනීමට යොදා ගත හැකි වෙනත් ක්‍රමවේදයක් අතර තෝරාගැනීමක් නොපවතින සහ නොපවතින තාක්" පමණක් බවයි. එවැනි අවශ්‍යතාවයක පැවැත්ම යම් නිශ්චිත අණ දීමේ අදියරක දී ස්ථාපනය කළ යුතු බව දෙවන සන්ධානය තවදුරටත් දක්වයි. පළමු අතිරේක සන්ධානයේ 1 ඡේදයේ 53 වන වගන්තිය සහ දෙවන අතිරේක සන්ධානයේ 16 වන වගන්තිය මෙලෙස ද සඳහන් කරයි: මෙමඟින් අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවකදී අයිතිය අතහැරීම සඳහා අවකාශ නොසපයයි.

• එවැනි දේපළකට එරෙහිව කරන ඕනෑම ආකාරයක සොරකම් කිරීමක්, කොල්ලකෑමක් හෝ අයුතු අත්පත් කරගැනීමක් සහ දේපළ කෙලසීමේ සෑම ක්‍රියාවක්ම තහනම් වේ.



සියලු පුද්ගලයින්ගේ සංස්කෘතික උරුමයක් වශයෙන් වැදගත් වටිනාකමකින් යුතු දේපළ ආරක්ෂා කිරීම දක්වන නිල් සහ සුදු පළිහ ලාංඡනය

## ස්වාභාවික පරිසරය

**ස්වාභාවික පරිසරය** යන යෙදුම මඟින් ජෛවගෝලය, ශිලාගෝලය, ජලගෝලය සහ වායුගෝලය සහ බාහිරගෝලය ඇතුළු පෘථිවියේ ගතිකය, සංයුතිය හෝ ව්‍යුහය අදහස් කරයි. සියලු වෘක්ෂලතාදිය (ශාක, වනාන්තර ආදිය), වන ජීවීන්, ක්ෂුද්‍ර ජීවීන්, පස, පාෂාණ, වායු, ජලය සහ අනෙකුත් ස්වභාවික සම්පත්, සහ දේශගුණය මීට ඇතුළත් වේ.

ස්වභාවික පරිසරයට දීර්ඝ කාලයක් පුරාවට පවතින හානි ඇති කිරීමට සන්නද්ධ ගැටුමට හැකිය. ඇතැම් විශේෂ ආයුධ භාවිතය, විශේෂයෙන්ම රසායන හෝ න්‍යෂ්ටික අවි භාවිතය මඟින් පරිසරයට දීර්ඝ කාලීන හානිකර බලපෑමක් ඇති විය හැකිය. එම බලපෑම, සතුරාගේ හැකියාවන් දුර්වල කිරීමේ අරමුණින් ගැටුමට සම්බන්ධ පාර්ශව විසින් පරිසරයේ යම් කොටස් ඉලක්ක කරමින් සිදු කරන යුද උපායමාර්ගයේ අංගයක් විය හැකිය. නමුත් එය ගැටුමේ අනපේක්ෂිත ප්‍රතිවිපාකයක් ලෙස ද හටගත හැකිය. ඇළ මාර්ග සහ කාණු පද්ධති, විදුලි බලාගාර, සහ රසායන බලාගාර සහ අනෙකුත් කර්මාන්ත විනාශ කිරීම සහ හුදෙක් සුන්බුන් පමණක් ඉතිරි කිරීම මඟින් සමස්ත ජනගහනයේම සෞඛ්‍ය තර්ජනයට ලක් කරමින් ජල මූලාශ්‍ර, වගා කළ හැකි භූමි සහ වාතය දූෂණය විය හැකිය. යම් නිශ්චිත ප්‍රමාණයක පාරිසරික හානියක් සන්නද්ධ ගැටුමක නිසග ප්‍රතිඵලයක් ලෙස පිළිගත හැකි වුවද, එකී හානිය අසමානුපාතික නොවිය යුතුය.

එම නිසා, අන්තර්ජාතික මානුෂවාදී නීතිය පාරිසරික හානිය සඳහා යම් සීමාවක් හඳුනාගනියි. පළමුව, පරිසරය සිවිල් වස්තුවක් ලෙස පොදුවේ ආරක්ෂිත බැවින් ඍජු ප්‍රහාරයන්ගෙන් සහ ප්‍රමාණය ඉක්ම වූ අනුෂාංගික හානි වලට එරෙහිව ද ආරක්ෂිත වේ; තවද අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් දක්වනුයේ පරිසරයට සිදුවිය හැකි අනුෂාංගික හානි ඕනෑම අවස්ථාවක දී වැළැක්වීමට සහ අවම කිරීමට ගත හැකි සියලුම පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග ගත යුතු බවයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ ස්වභාවික පරිසරයට විශේෂ ආරක්ෂණය ද හිමි වේ. සැබෑ ලෙසම, අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් “පුළුල්, දීර්ඝ කාලීන සහ උග්‍ර හානි” වලින් ස්වභාවික පරිසරය ආරක්ෂා කරයි. විශේෂයෙන්ම, ස්වභාවික පරිසරයට එවැනි හානි කිරීම අදහස් කරන හෝ අපේක්ෂිත යුද විධික්‍රම සහ ආකාර අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් වලදී යොදා ගැනීම ගිවිසුම් සහ චාරිත්‍රානුකූල නීති මඟින් තහනම් කර තිබේ.



රාජ්‍ය පරිචය විසින් මෙම රීතිය චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ නියමයක් ලෙස අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සන්දර්භය තුළ ද යොදා ගනියි.

අවසානාත්මක වශයෙන්, 1976 යුද හෝ වෙනත් අහිතකර පරමාර්ථ සඳහා පාරිසරික විකරණ තාක්ෂණික ක්‍රම භාවිතයට එරෙහි තහනම පිළිබඳ සම්මුතිය (ENMOD) මඟින් සන්නද්ධ ගැටුම්හි දී පරිසරය සඳහා අතිරේක ආරක්ෂණයක් සපයයි. ENMOD මඟින් වෙනත් රාජ්‍ය පාර්ශවයක් විනාශ කිරීමේ, හානි කිරීමේ හෝ තුවාල කිරීමේ ආකාරයක් ලෙස සුළි කුණාටු, උදම් රළ හෝ දේශගුණික විපර්යාස වැනි සංසිද්ධීන් උත්පාදනය කරමින් “පුළුල්, දීර්ඝ කාලීන සහ උග්‍ර ප්‍රතිවිපාක” පමුණුවන පරිසරයට සිදු කරන චේතාන්විත විකරණයන් තහනම් කරයි. සරලවම දක්වන්නේ නම්, ආයුධයක් ලෙස ස්වභාවික පරිසරය චේතාන්විතව විනාශ කිරීම තහනම් වේ.


T. Ohsumi/Pool/REUTERS

# අන්තරාදායක බලයන් අන්තර්ගත නිමැවුම් සහ ඉදිකිරීම්

අන්තරාදායක බලයන් අන්තර්ගත නිමැවුම් සහ ඉදිකිරීම් යන යෙදුම මඟින් වේලි, බැමි සහ න්‍යෂ්ටික විදුලි උත්පාදක බලාගාර අදහස් වේ.

අන්තරාදායක බලයන් අන්තර්ගත නිමැවුම් සහ ඉදිකිරීම් යුදමය අරමුණු බවට පත් වුවද ඒවාට ප්‍රහාර එල්ල නොකළ යුත්තේ එවැනි ප්‍රහාර මඟින් අන්තරාදායක බලයන් මුදා යාමට හැකිවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස, සිවිල් වැසියන්ට බරපතළ හානි සිදුවිය හැකි බැවිනි. මේ සමානම බරපතළ හානි සිවිල් වැසියන්ට සිදුවිය හැකි බැවින් අන්තරාදායක බලයන් අන්තර්ගත නිමැවුම් සහ ඉදිකිරීම් තුළ හෝ ඒ ආසන්නයේ වන යුදමය අරමුණුවලට ද ප්‍රහාර එල්ල නොකළ යුතුය. මෙම රීති පළමු අතිරේක සන්ධානය තුළ පැහැදිලිව සඳහන් වන අතර අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ චාරිත්‍රානුකූල නීතිය තුළ ද දක්නට ලැබේ. මෙම ඉලක්ක හඳුනා ගැනීම පහසු කිරීම පිණිස, සන්නද්ධ ගැටුමට සම්බන්ධ පාර්ශවයන් විසින් ඒවා එකම අක්ෂය මත දිවෙන දීප්තිමත් තැඹිලි පැහැති වෘත්ත තුනකින් සමන්විත විශේෂ ලකුණකින් සලකුණු කළ හැකිය (පහත බලන්න).



# 18. ත්‍රස්තවාදය සම්බන්ධයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය කුමක් කියන්නේද?

## ත්‍රස්තවාදය සම්බන්ධව ICRC දරන මතය කුමක්ද?

ඉවක් බවක් නොමැති සිවිල් ජනගහනය අතර භීතිය වපුරන ප්‍රචණ්ඩ ක්‍රියා ICRC විසින් තරයේ හෙළා දකියි. එය බොහෝ අවස්ථා වල එලෙස කර තිබේ.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් 'ත්‍රස්තවාදය' සඳහා නිර්වචනයක් ලබා නොදුන්නද, 'ත්‍රස්ත' ක්‍රියා ලෙස පොදුවේ සැලකිය හැකි සන්නද්ධ ගැටුමක දී සිදු කරන බොහෝ ක්‍රියා එමගින් තහනම් කරයි. සන්නද්ධ ගැටුමක නියැලෙන පුද්ගලයින් විසින් සියලු අවස්ථාවල දී සිවිල් වැසියන් සහ යුද භටයින් මෙන්ම සිවිල් ඉලක්ක සහ යුදමය අරමුණු පැහැදිලිව වෙන්කොට හඳුනාගත යුතු බව අන්තර්ජාතික මානුෂවාදී නීතියේ එන මූලික මූලධර්මයකි. මෙම 'වෙන්කොට හඳුනාගැනීම' පිළිබඳ මූලධර්මය අන්තර්ජාතික මානුෂවාදී නීතියේ මුල්ගලයි (11 වන ප්‍රශ්නය බලන්න). සිවිල් වැසියන් සහ සිවිල් වස්තූන් වෙත සෘජු සහ චේතාන්විතව ප්‍රහාර එල්ල කිරීමට එරෙහි තහනම, ඉවක් බවක් නොමැති ප්‍රහාර එල්ල කිරීමට එරෙහි තහනම හෝ 'මිනිස් පළිහක්' ලෙස භාවිතයට එරෙහි තහනම වැනි සිවිල් වැසියන් ආරක්ෂා කිරීම විශේෂයෙන් අරමුණු කරගත් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ බොහෝ රීති මෙමගින් පැන නැගුණකි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ප්‍රාණ ඇපකරුවන් තබා ගැනීම ද තහනම් කරයි. සන්නද්ධ ගැටුම් අවස්ථාවල දී සිවිල් වැසියන් සහ සිවිල් වස්තූන් වලට එරෙහිව හිතාමතා සිදු කරන ප්‍රචණ්ඩ ක්‍රියා 'ත්‍රස්තවාදී' ලෙස විස්තර කිරීමෙහිලා නෛතික වටිනාකමක් නොමැත්තේ එවැනි ක්‍රියා දැනටමත් බරපතළ අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් වන බැවිනි.

තවදුරටත් දක්වන්නේ නම්, අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ත්‍රස්තවාදී "වැඩපිළිවෙල" සහ "ත්‍රස්තවාදී ක්‍රියා" විශේෂයෙන්ම තහනම් කරයි. සිව්වන ජිනීවා සම්මුතියේ 33 වන වගන්තිය දක්වනුයේ "සාමූහික දඬුවම් සහ එවැනි බිය ගැන්වීමේ හෝ ත්‍රස්තවාදයේ සියලු ක්‍රියාමාර්ග තහනම්" බවයි. දෙවන අතිරේක සන්ධානයේ 4 වන වගන්තිය මඟින් එදිරිවාදිකම් සඳහා සහභාගි නොවන හෝ තවදුරටත් සටන් නොවදින පුද්ගලයින්ට එරෙහි "ත්‍රස්ත ක්‍රියා" තහනම් බව දක්වයි. මෙම විධිවිධානවල ප්‍රධාන අරමුණ වනුයේ අනෙකුත් කරුණු අතර, නිසැකවම භීතිය පතුරන, සාමූහික දඬුවම් වලට තනි පුද්ගලයින් හෝ සිවිල් ප්‍රජාව ලක් නොවිය යුතු බව අවධාරණය කිරීමයි. පළමු සහ දෙවන අතිරේක සන්ධාන ද සිවිල් ජනගහනය අතර භීතිය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් ක්‍රියා තහනමට ලක් කරයි: "සිවිල් ජනගහනය අතර භීතිය ව්‍යාප්ත කිරීම මූලික පරමාර්ථය කරගත් ප්‍රචණ්ඩකාරී ක්‍රියා හෝ තර්ජන තහනම් වේ" (පළමු අතිරේක සන්ධානය, 2 ඡේදය, 51 වන වගන්තිය සහ දෙවන අතිරේක සන්ධානය, 2 ඡේදය, 13 වන වගන්තිය බලන්න). සිවිල් වැසියන් අතර භීතිය පැතිරිය හැකි, යුද අරමුණු වෙත කෙරෙන නීත්‍යානුකූල ප්‍රහාර මෙම විධිවිධාන විසින් තහනම් නොකරන නමුදු, නාගරික ප්‍රදේශ වල ජීවත් වන සිවිල් වැසියන්ට එරෙහිව සිදු කරන ෂෙල්වෙඩි සහ ස්නයිපර් ප්‍රහාර වැනි සිවිල් වැසියන් භීතියට පත් කිරීම අරමුණු කරගත් ප්‍රහාර විශේෂයෙන්ම නීතියෙන් බැහැර කරයි.


S. Adair

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සන්නද්ධ ගැටුම් සඳහා පමණක් අදාළ වන බැවින් සාම කාලය තුළ දී සිදු කරන ත්‍රස්ත ක්‍රියා නියාමනය නොකරයි. කෙසේ වුවද, එම ක්‍රියා, දේශීය නීතිය, අන්තර්ජාතික නීතිය, විශේෂයෙන්ම මානව අයිතිවාසිකම් නීතිය වැනි නීති මඟින් පාලනය කෙරේ. අපරාධකරුවන්ගේ අභිප්‍රායන් කුමක් වුවද, සන්නද්ධ ගැටුමකට පරිබාහිරව සිදු කරන ත්‍රස්ත ක්‍රියා දේශීය හෝ අන්තර්ජාතික නීති බලාත්මක කරන ආයතනවල ක්‍රමවේද ඔස්සේ ආමන්ත්‍රණය කළ යුතුමය. බුද්ධි තොරතුරු එක්රැස් කිරීම, පොලිස් හා අධිකරණ සහයෝගීතාවය, උදර්පණය, අපරාධ දඬුවම්, මූල්‍ය විමර්ශන, වත්කම් තහනම් කිරීම හෝ ත්‍රස්තවාදීන් වෙත ආධාර සපයන බවට සැකකාර රාජ්‍යයන් මත රාජ්‍යතාන්ත්‍රික හා ආර්ථික පීඩන එල්ල කිරීම වැනි ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීමට හෝ මැඩපැවැත්වීමට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් රාජ්‍යයන් විසින් ගත හැකිය.

## ඊනියා 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' යනු කුමක්ද?

ත්‍රස්ත ප්‍රහාර වැළැක්වීම සහ ඊට එරෙහිව සටන් කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග සහ මෙහෙයුම් මාලාවක් විස්තර කිරීම සඳහා මෙම යෙදුම භාවිතා වේ. මෙම ක්‍රියාමාර්ග සඳහා බුද්ධි තොරතුරු එක්රැස් කිරීම, මූල්‍ය සම්බාධක, සහ අධිකරණ සහයෝගීතාවය ඇතුළත් සේම, ඊට සන්නද්ධ ගැටුම ද සම්බන්ධ විය හැකිය. බොහෝ විට 'ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධය' යනුවෙන් හඳුන්වන තත්වයේ නෛතික වර්ගීකරණය සැලකිය යුතු තරමේ මතභේදයකට තුඩු දුන්නකි. යම් යම් රාජ්‍ය තුළ එදිනෙදා ව්‍යවහාරයේ යෙදෙන කොටසක් බවට මෙම යෙදුම පත්ව ඇතද, එය හුදෙක් භාෂාමය අලංකාරයක්ද නැතහොත් එමගින් නෛතික අර්ථයකින් ගෝලීය සන්නද්ධ ගැටුමක් අදහස්වන්නේ ද යන්න අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ආලෝකයෙන් පරීක්ෂා කරබැලීමේ අවශ්‍යතාවය පවතී. පවතින දත්ත මත කළ විග්‍රහයකට අනුව, ගෝලීය යුද්ධයක් නිර්මාණය වී ඇත යන මතය ICRC විසින් නොදරයි; 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයෙහි කොටසක් ලෙස ව්‍යවහාරය තුළ හඳුන්වන ප්‍රචණ්ඩකාරී තත්ව පිළිබඳ නෛතික වර්ගීකරණය දැක්වීමට එක් එක් සිද්ධිය වෙන්ව අධ්‍යයනය කිරීම අවශ්‍යවේ. සරලවම දක්වතොත්, ප්‍රචණ්ඩත්වය අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක එළිපත්තට ළඟා වන්නේ නම්, එවිට අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ වේ (5 වන ප්‍රශ්නය බලන්න). එය එසේ නොවන විට, අනෙකුත් නීති පද්ධතීන් බලපවතී.

නිදසුනක් ලෙස, අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් දක්වන සන්නද්ධ ගැටුම් නිර්වචනය යටතේ ගැනෙන 2001 සැප්තැම්බර් 11 දින දී එක්සත් ජනපදයට එරෙහිව එල්ල කළ ප්‍රහාරයෙන් පසුව ත්‍රස්තවාදයට එරෙහි අරගලයේ සුවිශේෂී අංග දියත් කරන ලදි. 2001 වර්ෂයේ දී ඇෆ්ගනිස්ථානය තුළ එක්සත් ජනපදය ප්‍රමුඛ හමුදාව විසින් ආරම්භ කළ යුද්ධය නිදසුනකි. එක් පැත්තකින් එක්සත් ජනපදය ප්‍රමුඛ හමුදාවත් අනෙක් පැත්තෙන් ඇෆ්ගනිස්ථානයත් සම්බන්ධ වූ එම අන්තර්ජාතික සන්නද්ධ ගැටුමට ජිනීවා සම්මුති සහ චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ රීතීන් සම්පූර්ණයෙන්ම අදාළ විණි. කෙසේ වුවද, 'ත්‍රස්තවාදය' ලෙස සාමාන්‍යයෙන් විස්තර කෙරෙන ලෝකයේ අනෙක් කොටස් තුළ සිදු වන ප්‍රචණ්ඩත්වය ඇති කරනුයේ බොහෝ විට පොදු මතවාදයක් දරන ලිහිල්ව සංවිධානය වී ඇති කණ්ඩායම් (ජාල) හෝ පුද්ගලයින් විසිනි. කිනම් සන්නද්ධ ගැටුම් වර්ගයකට සම්බන්ධ පාර්ශවයක් ලෙස මෙම කණ්ඩායම් හෝ ජාල විස්තර කළ හැකිද යන්න සැක සහිත වේ.

'ත්‍රස්තවාදය' යනු සංසිද්ධියකි. ප්‍රායෝගිකව සහ නෛතිකව, සංසිද්ධියකට එරෙහිව යුද වැදිය නොහැකි අතර, එසේ කළ හැක්කේ හඳුනාගත හැකි සන්නද්ධ ගැටුමක පාර්ශවයකට එරෙහිව පමණි. මෙම හේතු මත, බහු ආංශික 'ත්‍රස්තවාදයට එරෙහි අරගලය' පිළිබඳව කතා කිරීම 'ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය' ගැන කතා කිරීමට වඩා අර්ථාන්විත වේ.

## ත්‍රස්වාදයට එරෙහි අරගලයක දී රඳවා ගත් පුද්ගලයින් සඳහා බලපාන නීතිය කුමක්ද?

1. ත්‍රස්වාදයට එරෙහි අරගලයක කොටසක් ලෙස දිවෙන **අන්තර්ජාතික සන්නද්ධ ගැටුමකට** අදාළව රඳවා තබාගන්නා පුද්ගලයින් - 2002 ජුනි මස දී නව ආණ්ඩුවක් පිහිටුවන තෙක් ඇෆ්ගනිස්ථානය තුළ පැවති තත්වය - අන්තර්ජාතික සන්නද්ධ ගැටුමට අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීතිය මඟින් ආරක්ෂා කරයි.

අ) **අල්ලා ගත් යුද භටයින්** වෙත යුද සිරකාර තත්වය පිරිනැමිය යුතු අතර එම අන්තර්ජාතික සන්නද්ධ ගැටුමේ සක්‍රීය එදිරිවාදිකම් අවසාන වන තෙක් රඳවා තැබිය යුතුය. හුදෙක් එදිරිවාදිකම් සඳහා සහභාගි වීම මත පමණක් ඔවුනට එරෙහිව නඩු පැවරිය යුතු නොවන නමුත් ඔවුන් විසින් සිදු කර ඇති යුද අපරාධ සම්බන්ධව නඩු පැවරීමට හැකි වේ. මෙහි දී, ඔවුන් වෙත නියම කරනු ලැබූ දඬුවම ක්‍රියාත්මක කරන තෙක් ඔවුන්ව රඳවා තැබිය හැකිය. යම් සිරකරුවෙකුගේ යුද සිරකාර තත්වය ගැටලු සහගත වන්නේ නම්, එකී ගැටලුව පිළිබඳව තීරණය කිරීමට නිසි අධිකරණයක් පිහිටුවිය යුතුය.

ආ) **අත්‍යවශ්‍ය ආරක්ෂක හේතු මත රඳවා සිටින සිවිල් වැසියන්** වෙත සිව්වන ජිනීවා සම්මුතිය මඟින් සපයා ඇති ආරක්ෂණය ප්‍රදානය කළ යුතුය. යුද සිරකාර තත්වයට අදාළ නිර්ණායක සම්පූර්ණ නොකරන යුද භටයින් (නිදසුන් ලෙස, විවෘතව ආයුධ රැගෙන නොයන) හෝ අන්තර්ජාතික සන්නද්ධ ගැටුමක දී එදිරිවාදිකම් සඳහා ඍජුව සහභාගි වූ සිවිල් වැසියන් (ඊනියා 'වරප්‍රසාද නොලත්' හෝ 'නීතිවිරෝධී' සටන්කරුවන්) සතුරු රාජ්‍යයේ ජාතිකයින් වන්නේ නම්, සිව්වන ජිනීවා සම්මුතිය යටතේ ඔවුන් ආරක්ෂිත වේ. යුද සිරකරුවන් මෙන් නොව, එවැනි පුද්ගලයින්ට එරෙහිව ආයුධ අතට ගැනීම මෙන්ම ඔවුන් විසින් සිදු කර තිබිය හැකි ඕනෑම අපරාධ ක්‍රියාවක් සඳහා රඳවා තබා ගන්නා රාජ්‍ය විසින් දේශීය නීතිය යටතේ ඔවුනට එරෙහිව නඩු පැවරිය හැකිය. ඔවුනට නියම කර ඇති දඬුවම් කාලය අවසන් වන තෙක් ඔවුන්ව සිරභාරයේ තැබිය හැක්කේය. ඔවුන්ට විරුද්ධව නඩු පවරා නැත්නම්, පරිපාලනමය ලෙස ඔවුනගේ නිදහස අහිමි කිරීමට තුඩු දුන් අත්‍යවශ්‍ය ආරක්ෂක හේතූන් නැති වූ වහාම ඔවුන්ව නිදහස් කළ යුතුය.

2. ත්‍රස්වාදයට එරෙහි අරගලයක කොටසක් ලෙස දිවෙන **අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමකට** අදාළව රඳවා තබාගන්නා පුද්ගලයින්, පොදු 3 වන වගන්තිය, දෙවන අතිරේක සන්ධානය සහ චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළ රීති මඟින් ආරක්ෂිත වේ. මානව අයිතිවාසිකම් නීතියේ රීති සහ දේශීය නීතිය ද ඔවුනට අදාළ වේ. ඔවුන් විසින් සිදු කර තිබිය හැකි අපරාධවලට එරෙහිව නඩු පවරන්නේ නම්, අන්තර්ජාතික මානුෂවාදී නීතිය හා මානව අයිතිවාසිකම් නීතිය මඟින් සපයන සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති සුරක්ෂාවන් සඳහා ඔවුන් විසින් හිමිකම් කියයි.

3. ත්‍රස්තවාදයට එරෙහි අරගලයක දී **සන්නද්ධ ගැටුමකට පරිබාහිරව** රඳවා සිටින සියලු පුද්ගලයින් රඳවා තබා ගන්නා රාජ්‍යයේ දේශීය නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය යටතේ ආරක්ෂිත වේ. ඔවුන් විසින් සිදු කර තිබිය හැකි අපරාධවලට එරෙහිව නඩු පවරන්නේ නම්, මෙම නීති පද්ධති වල දක්වන සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති සුරක්ෂාවන් වල ආරක්ෂණය ඔවුනට හිමි වේ.

**ත්‍රස්තවාදයට එරෙහි අරගලයේ දී අල්ලා ගන්නා ලද කිසිදු පුද්ගලයෙකු නීතියට පරිබාහිර ලෙස සැලකිය හැකි නොවේ. නීතිමය ආරක්ෂාව යන අර්ථයෙන් ගත් කළ 'කළු කුහරය' ලෙස කිසිවක් නොපවතී.**



# 19. අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාවට නැංවෙන්නේ කෙසේද?

ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන සඳහා පාර්ශව වන රාජ්‍යයන්ගේ පළමු සහ ප්‍රධාන වගකීම වනුයේ රීති ක්‍රියාවට පෙරළීම හෙවත් අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාවට නැංවීමයි. සෑම අවස්ථානුගත තත්වයකදීම, රාජ්‍යයන් විසින් සම්මුතිවලට ගරු කිරීම සහ ගරු කිරීම තහවුරු කිරීම සඳහා ඇති අවශ්‍යතාවය දක්වන ජිනීවා සම්මුති හතර සඳහාම පොදු 1 වන වගන්තිය තුළ මෙම වගකීම පැහැදිලිව දක්වා තිබේ.



A.Synenko/ICRC

ඇතැම් ක්‍රියාවට නැංවීමේ ක්‍රියාමාර්ග මඟින් නීති හෝ රෙගුලාසි සම්මත කිරීමේ අවශ්‍යතාවයක් දක්වයි. අනෙක් ක්‍රියාමාර්ග මඟින් සන්නද්ධ බලකා මෙන්ම සාමාන්‍ය ජනතාව සඳහා අධ්‍යාපනික වැඩසටහන් වල වර්ධනය, නිලධාරීන් බඳවා ගැනීම සහ/හෝ ඔවුන්ව පුහුණුකිරීම, හැඳුනුම්පත් සහ අනෙකුත් ලේඛන සකස් කිරීම, විශේෂ ව්‍යුහගත කිරීම් සිදු කිරීම, සහ සැලසුම් සහ පරිපාලන ක්‍රියාපටිපාටි හඳුන්වාදීම වැනි අවශ්‍යතා දක්වයි. රාජ්‍යයන් විසින් උල්ලංඝනය කිරීම් වැළැක්විය යුතු අතර ඒවා සිදුවන්නේ නම්, අදාළ වගකිව යුතු තැනැත්තන්ට දඬුවම් කළ යුතුය.

## වැළැක්වීම, අධීක්ෂණය සහ මර්දනය

අන්තර්ජාතික මානුෂවාදී නීතියට පූර්ණ වශයෙන් අනුකූල වීම තහවුරු කිරීම පිණිස සාම කාලය සහ සන්නද්ධ ගැටුම් අතරතුර දී යම් නිශ්චිත නෛතික සහ ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගැනීම සඳහා වගකීමක් රාජ්‍යයන්ට තිබේ. අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම් මඟින් ද නීතිය හා අනුකූල වීම තහවුරු කිරීමට අදාළව යාන්ත්‍රණ කිහිපයක් දක්වයි.

මෙම රීති හා යාන්ත්‍රණ පුළුල් වශයෙන් කාණ්ඩ තුනකට බෙදා දැක්විය හැකිය.

**1. වැළැක්වීමේ ක්‍රියාමාර්ග**

- අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම (අන්තර්ජාතික මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය)
- අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම් දේශීය භාෂාවට/භාෂාවන්ට පරිවර්තනය කිරීම
- අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූල වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය පරිදි ව්‍යවස්ථාදායක සහ ව්‍යවස්ථාපිත විධිවිධාන සම්මත කරමින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය දේශීය නීතියට ඇතුළත් කිරීම
- අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාවට නැංවීම පහසු කිරීම පිණිස නිලධාරීන් පුහුණු කිරීම සහ සන්නද්ධ බලකා සඳහා නීති උපදේශකවරුන් පත් කිරීම
- යුද අපරාධ වැළැක්වීම සහ යුද අපරාධ සිදු කරන්නන්ට දඬුවම් දීම
- රතු කුරුසය, රතු අඩසඳ සහ රතු පළිඟුව ලාංඡන සඳහා ගරු කිරීම තහවුරු කිරීම

**2. ගැටුමක් පවතින කාලපරිච්ඡේදය තුළ දී අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූල වීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාමාර්ග සහ යාන්ත්‍රණ**

- **ආරක්ෂණ බලවතුන් හෝ ඔවුනගේ ආදේශකයින්.** ආරක්ෂණ බලවතුන් යනු සතුරු රාජ්‍ය තුළ සිටින ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ගේ, සහ ඔවුනගේ ජාතිකයින්ගේ ලැදියාවන් ආරක්ෂා කිරීමට පත් කර ඇති මධ්‍යස්ථ රාජ්‍යයන් වේ. වින්දිතයින්ට උපකාර කිරීමේ අරමුණින් සහන සහ ආරක්ෂණ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ නිදසුනක් ලෙස, යුද සිරකරුවන් හෝ පරිපාලනමය ලෙස නිදහස අහිමි කරන ලද සිවිල් වැසියන් නිරීක්ෂණය වැනි ක්‍රියා මඟින් අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූලව කටයුතු කරන බව අධීක්ෂණය කිරීම ආරක්ෂක බලයන්ගේ කාර්යභාර්යවේ. 'අපක්ෂපාතීත්වය සහ කාර්යක්ෂමතාව පිළිබඳ සියලු සුරක්ෂාවන් පිරිනමන' අන්තර්ජාතික සංවිධානයකට ආරක්ෂණ බලවතෙකුගේ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කිරීමට හැකිය.
- **පරීක්ෂණ ක්‍රියාවලිය**. ගැටුමට සම්බන්ධ පාර්ශවයක් විසින් ඉල්ලා සිටින විට සහ අදාළ පාර්ශව විසින් අනුගමනය කිරීමට නියමිත ක්‍රියාපටිපාටිය සඳහා එකඟ වන්නේ නම්, සිදු කළා යැයි කියන උල්ලංඝනයන් පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය හැකිය.
- **කරුණු සෙවීමේ ජාත්‍යන්තර මානුෂවාදී කොමිසම.** පළමු අතිරේක සන්ධානයේ 90 වන වගන්තිය මඟින් ස්ථාපනය කර ඇති මෙම කොමිසම මඟින් ජිනීවා සම්මුති හෝ පළමු අතිරේක සන්ධානයට සිදු කළා යැයි කියන බරපතළ උල්ලංඝනයන් සහ අනෙකුත් වැදගත් උල්ලංඝනයන් පිළිබඳව පරීක්ෂණ පවත්වන අතර සිය මධ්‍යස්ථ කාර්යාල ඔස්සේ ජිනීවා සම්මුති සඳහා ගරුත්වය යථාවත් කිරීමට පහසුකම් සලසයි. එහි නිල හැකියාව අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් කෙරෙහි පමණක් පැතිර තිබුණද, පාර්ශව විසින් අනුමතිය දෙන්නේ නම්, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළව

විමර්ශන පැවැත්වීම සඳහා කොමිසම විසින් සිය කැමැත්ත ප්‍රකාශිතව දක්වා තිබේ.

- **එක්සත් ජාතීන් සමග සහයෝගීතාවය.** අන්තර්ජාතික මානුෂවාදී නීතියට සිදු කළ බරපතළ උල්ලංඝනයන්හි දී, ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන සඳහා පාර්ශව වන රාජ්‍යයන් විසින් එක්සත් ජාතීන් හා සහයෝගීතාවයෙන් මෙන්ම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය හා අනුකූලව ක්‍රියා කළ යුතුය.
- **ICRC.** ජිනීවා සම්මුති, ඒවායේ අතිරේක සන්ධාන සහ ජාත්‍යන්තර රතු කුරුස හා රතු අඩසඳ ව්‍යාපාරයේ ව්‍යවස්ථා යටතේ තමා වෙත පවරා ඇති වරය මත ක්‍රියාකරන ICRC, අධීක්ෂණ ක්‍රියාවලියේ මූලික අංගයක් වේ. (20 වන ප්‍රශ්නය බලන්න).

### 3. මැඩ පැවැත්වීමේ ක්‍රියාමාර්ග

සියලු උල්ලංඝනයන් වැළැක්වීමට සහ මැඩ පැවැත්වීමට ගැටුමට සම්බන්ධ පාර්ශවයන් වෙත ඇති වගකීම් මත මෙම ක්‍රියාමාර්ග පදනම් වේ. අදාළ වගකීම් යන්නට පහත වගකීම් විශේෂයෙන්ම ඇතුළත්ය:

- යුද අපරාධ ලෙස සලකන උල්ලංඝනය කිරීම් දේශීය නඩු පැවරීම් මඟින් මැඩ පැවැත්වීමට රාජ්‍යයන්ට ඇති වගකීම
- ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන උල්ලංඝනය කළ පුද්ගලයින්ට එරෙහිව විනය හෝ දණ්ඩන ක්‍රියාමාර්ග ගැනීමට හමුදා අණ දෙන නිලධාරීන්ට ඇති වගකීම
- අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් වැළැක්වීමට හෝ මැඩ පැවැත්වීමට සිය බලය යටතේ ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වන ප්‍රධානීන්ගේ අපරාධ සහ විනය පිළිබඳ වගකීම තහවුරු කිරීමට රාජ්‍යයන්ට ඇති වගකීම
- අපරාධ සම්බන්ධව රාජ්‍යයන් අතර අන්‍යෝන්‍ය සහය සැපයීමට රාජ්‍යයන්ට ඇති බැඳීම්.

උල්ලංඝනයන්ට එරෙහි ඉතා වැදගත් නිවර්තකයක් ලෙස මෙම ක්‍රියාමාර්ග ක්‍රියා කරයි. (21 වන ප්‍රශ්නය බලන්න).

සන්නද්ධ ගැටුම් වලින් පීඩා විඳීමට සිදු වන ප්‍රධාන හේතුව වනුයේ, නීති වල නොපැවැත්ම හෝ ඒවායේ පවතින අඩුපාඩුවලට වඩා, ක්‍රමවේදයන්හි දුලබත්වය හෝ දේශපාලන අධිෂ්ඨානය මත හෝ, බලාත්මකව පවතින නීතියට ගරු කිරීමට ඇති නොහැකියාවයි. මෑතකාලීනව, අවධානය, බරපතළ අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් සිදු කළ පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීමට සහ දඬුවම් ලබා දීමට හැකි පරිදි අපරාධ නීති ක්‍රියාපටිපාටි දියුණු කිරීම අරමුණු කරගත්ත ද, උල්ලංඝනයන් සිදු වන විට දී ඒවා නැවැත්වීමටත් මැඩ පැවැත්වීමටත් අවැසි නිසි ක්‍රමවේද තවමත් ප්‍රමාණවත් නොවේ. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ දක්වා ඇති බොහෝ ක්‍රියාපටිපාටීන් පරිචය තුළ කිසිදු දිනක භාවිතයට ගෙන නැති හෝ භාවිතයට ගෙන නැති තරම්ය. තවද, මෙම ක්‍රියාපටිපාටීන් අදාළ වන්නේ අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් අවස්ථා සඳහා පමණි. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ විෂය සීමාවෙන් පරිබාහිරව සමහර අධීක්ෂණ සහ ක්‍රියාවට නැංවීමේ යාන්ත්‍රණ වර්ධනය වූ බව සත්‍යයක් වුවද, ඒවා තුළ එයටම ආවේණිකවූ සීමාවන් පවති. මෙම සෑම හේතුවක් නිසාම, ICRC විශ්වාස කරනුයේ අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූල වීම තහවුරු කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණ වඩා ශක්තිමත් විය යුතු බවයි (20 වන ප්‍රශ්නය බලන්න).




# 20. අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ගරුත්වය වර්ධනය කිරීම සහ සුරක්ෂිත කිරීමට අදාළව ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ කාර්යභාර්ය කුමක්ද?

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ භාරකරු සහ ප්‍රවර්ධකයා ලෙස, ICRC විසින් සන්නද්ධ ගැටුම්වල හා අනෙකුත් ප්‍රචණ්ඩකාරී වාතාවරණයන්හි වින්දිතයින් ආරක්ෂා කිරීම, ඔවුනට අවැසි සහය සැපයීම මෙන්ම නීතිය සඳහා වන ගරුත්වය වඩා වර්ධනය කිරීම සඳහා ක්‍රියා කරයි. (කොටුව බලන්න). එමගින්, විශේෂයෙන්ම, අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම, දේශීය මට්ටමින් නීතිය ක්‍රියාවට නැංවීමට සහය වීම, නීතිය සඳහා වන ගරුත්වය අධීක්ෂණය කිරීම සහ ගැටුම්වලට සම්බන්ධ පාර්ශව වෙත තම බැඳීම් මතක් කරදීම වැනි කාර්යයන් ඔස්සේ නීතිය සඳහා වන ගරුත්වය වඩා වර්ධනය කිරීම සඳහා ක්‍රියා කරයි.




## ICRC මෙහෙවර ප්‍රකාශය

"ජාත්‍යන්තර රතු කුරුස කමිටුව යනු සන්නද්ධ ගැටුම් සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී වාතාවරණයන්හි වින්දිතයින්ගේ ජීවිත හා ගරුත්වය ආරක්ෂා කිරීම මෙන්ම ඔවුනට සහය සැපයීම සිය පරම මානුෂීය මෙහෙවර කරගත් අපක්ෂපාතී, මධ්‍යස්ථ සහ ස්වාධීන සංවිධානයකි.

මානුෂවාදී නීතිය සහ විශ්වීය මානුෂවාදී මූලධර්ම ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම මඟින් වද වේදනා විඳීම වැළැක්වීම සඳහා ද ICRC ප්‍රයත්න දරයි.

1863 වර්ෂයේ දී පිහිටුවන ලද ICRC ජිනීවා සම්මුති සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරයේ මූලාරම්භයයි. එමඟින්, සන්නද්ධ ගැටුම් සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී වාතාවරණයන් තුළ ව්‍යාපාරය විසින් සිදු කරන අන්තර්ජාතික ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය සිදු කරයි."

## ආරක්ෂණ ක්‍රියාකාරකම්

සන්නද්ධ ගැටුම් සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී වාතාවරණයන් තුළ පුද්ගලයින් ආරක්ෂා කිරීමට ICRC සිදු කරන ක්‍රියාකාරකම්, පවතින නීතිය සඳහා පූර්ණ ගරුත්වය අත්පත් කරගැනීම අරමුණු කරගත්තකි. භෞතිකව පුද්ගලයින් ආරක්ෂා කිරීමට ICRC ට නොහැකිය. ඒ වෙනුවට, පුද්ගලයින් මුහුණ දෙන අනතුරු අවම කිරීම, වැළැක්වීම සහ ඔවුන්ට සිදු කරන අපචාර මැඩලීම, ඔවුනගේ අයිතිවාසිකම් වෙත අවධානය දිනා දීම, සහ ඔවුනගේ හඬට කන් දීමට සැලැස්වීම වැනි ක්‍රියා එමඟින් සිදු කරයි. වෙනත් ලෙසකින් කියන්නේ නම්, ICRC විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය සඳහා වන ගරුත්වය අධීක්ෂණය කරන අතර උල්ලංඝනයන් සම්බන්ධව අදාළ අධිකාරීන් වෙත වාර්තා කරයි. ආරක්ෂණ ක්‍රියාකාරකම් යන්නට, රඳවා තබා ගැනීමට අදාළ කාර්යයන් (බන්ධනාගාර නිරීක්ෂණ සංචාර, රඳවා තබා ගැනීමේ තත්වයන් ඇගයීම ආදී), සිවිල් ජනගහනය ආරක්ෂණය සහ පවුල් සබඳතා යථාවත් කිරීම ඇතුළත් වේ.

## සහය ක්‍රියාකාරකම්

සන්නද්ධ ගැටුම් සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී වාතාවරණයන්ගේ හානිකර බලපෑම්වලට ලත් ජීවිත ආරක්ෂා කිරීම සහ/හෝ පුද්ගලයින්ගේ හෝ ප්‍රජාවන්ගේ ගරුත්වය යථාවත් කිරීම ICRC පිරිනමන සහයේ අරමුණයි. සහය ක්‍රියාකාරකම් මඟින් අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් ආමන්ත්‍රණය කිරීම මූලිකව සිදු කරයි. අවදානමට ඇති ඉඩකඩ අවම කිරීම මඟින් මෙකී උල්ලංඝනයන්ගේ හේතු සහ ප්‍රතිවිපාක හැසිරවීම ද ඔවුන් විසින් සිදු කරයි. සහය ක්‍රියාකාරකම්, අදාළ අවස්ථාව අනුව වෙනස් වේ. ඒ මඟින් පුළුල් පරාසයක් ආවරණය කරයි: ආහාර හෝ ඖෂධ සැපයීමේ සිට ජල සැපයුම් හෝ වෛද්‍ය පහසුකම් ප්‍රකෘතිමත් කිරීම සහ මූලික සෞඛ්‍ය සත්කාර නිලධාරීන්, ශල්‍ය වෛද්‍යවරු, කෘතිම/ විකලාංග ශිල්පීන් සඳහා පුහුණුව ලබා දීම වැනි අත්‍යවශ්‍ය සේවා බෙදා හැරීම සඳහා ධාරිතා ගොඩනැඟීම දක්වා.

**ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරයේ ව්‍යවස්ථා** මගින් ICRC හි කාර්යභාර්ය තුළ පහත කාර්යයන් විශේෂයෙන් ඇතුළත් බව දක්වයි:

“ජිනීවා සම්මුති මගින් ඊට පවරා ඇති කර්තව්‍යයන් ඉටු කිරීම, සන්නද්ධ ගැටුම් සඳහා බලපවත්වන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සද්භාවී භාවිතය වෙනුවෙන් ක්‍රියා කිරීම, එම නීතියට සිදු කළා යැයි කියන උල්ලංඝනයන් මත පදනම් වන ඕනෑම පැමිණිල්ලක් සඳහා අවධානය ලබා දීම” (5 වන වගන්තිය, 2 ඡේදය (ජ))

“සන්නද්ධ ගැටුම් සඳහා බලපවත්වන අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය සහ අවබෝධය වෙනුවෙන් ක්‍රියා කිරීම සහ ඊට ඕනෑම වැඩි දියුණු කිරීමක් සිදු කිරීම” (5 වන වගන්තිය, 2 ඡේදය (ට)).

## නීතිය ප්‍රවර්ධනය සහ ක්‍රියාවට නැංවීම

නීතිය පිළිබඳ නොදැනුවත්භාවය යනු ඊට ගරු කිරීමට පවතින ප්‍රධාන බාධාවකි. මෙම හේතුව මත, අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳව විශාල පරාසයක දැනුවත්භාවය ව්‍යාප්ත කිරීමට රාජ්‍යයන් සතු බැඳීම පිළිබඳව ICRC මගින් ඔවුනට සිහිපත් කරයි. අධ්‍යාපනික වැඩසටහන්, හමුදා පුහුණු සහ විශ්වවිද්‍යාල විෂය මාලා තුළට අන්තර්ජාතික මානුෂවාදී නීතිය අන්තර්ගත කිරීම දිරිමත් කිරීම, මගින් එකී බාධකය ජයගැනීමට එය උත්සහ දරයි. දේශීය තලය තුළ නීතිය ක්‍රියාත්මක වීම සහ ඒවා ඵලදායී ලෙස අදාළ කරගැනීම තහවුරු කිරීම සඳහා රාජ්‍යයන් විසින් අවශ්‍ය සියලු පියවර ගත යුතු බව ICRC විසින් තවදුරටත් රාජ්‍යයන්ට සිහිපත් කරදෙයි. එකී කාර්යය ප්‍රධාන වශයෙන් රාජ්‍යයන් සඳහා තාක්ෂණික මගපෙන්වීම සහ දේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමේ නීති හා රෙගුලාසි සම්මත කිරීමට බලධාරීන්ට සහය දක්වන අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ එහි උපදේශන සේවා මගින් සිදු කරයි.

## අන්තර්ජාතික මානුෂවාදී නීතිය සඳහා වන ගරුත්වය අධීක්ෂණය කිරීම සහ යුද පාර්ශවයන්ට සිය බැඳීම් පිළිබඳ සිහිකැඳවීම

ජිනීවා සම්මුති හතර සහ ඒවායේ අතිරේක සන්ධාන මගින් සන්නද්ධ ගැටුම් අවස්ථාවක දී ක්‍රියා කිරීමට ICRC වෙත විශේෂ වරයක් ලබා දී තිබේ. යුද සිරකරුවන් සහ පරිපාලනමය ලෙස නිදහස අහිමි කරන ලද සිවිල් වැසියන්ට සිදු කරන සැලකීම සහ ඔවුන්ව රඳවා තබන ස්ථානවල තත්වයන් අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූල වන්නේද යන්න තහවුරු කිරීම සඳහා අන්තර්ජාතික සන්නද්ධ ගැටුමක් අතරතුරදී, ඔවුන්ව බැලීමට යාමට ICRC වෙත අයිතියක් පවතී. ICRC හි මධ්‍යම ගවේෂණ ඒජන්සිය වෙත රැඳවියන් පිළිබඳ තොරතුරු එවිය යුතුය, එමගින් රැඳවියන් අතුරුදහන් නොවීම තහවුරු කෙරේ.

තවද, ICRC විසින් ආහාර තොග, වෛද්‍ය සැපයුම් සහ ඇඳුම් පැළඳුම් වැනි මානුෂීය ආධාර ඒවා අවශ්‍ය පුද්ගලයින්හට සැපයීම සිදු කරයි. අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම් මඟින් ඒ වෙත පවරා ඇති කාර්යන්වලට අමතරව, ICRC හට මුල පිරීමේ පුළුල් අයිතියක් තිබේ (පළමු, දෙවන සහ තෙවන ජිනීවා සම්මුතිවල පොදු 3 වන වගන්තිය, 9 වන වගන්තිය බලන්න). එය සිය සේවාව ගැටුමට සම්බන්ධ පාර්ශව වෙත ඕනෑම විටක දී පිරිනමයි. සන්නද්ධ ගැටුමක එළිපත්තට ළඟා නොවුණු නමුදු, මානුෂීය ක්‍රියාකාරිත්වයේ අවශ්‍යතාවය කියාපාන තත්වයන්හි දී ICRC වෙත ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරයේ ව්‍යවස්ථා මඟින් පිළිගත් මුල පිරීමේ අයිතිය ද හිමිවේ. අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ නොවන තත්වයන්හි දී අදාළ රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතු සඳහා මැදිහත්වීමකින් තොරව සිය සේවාවන් ආණ්ඩු වෙත පිරිනැමීමට ICRC ට හැකියාව පවතී.

සිය ආරක්ෂණ සහ සහය කාර්යයන් තුළින් එළැඹි නිගමන පාදක කරගනිමින්, අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් පිළිබඳව ICRC විසින් අදාළ බලධාරීන් වෙත රහසිගත නියෝජනයන් සිදු කරයි. රහස්‍යගතභාවය ICRC හි එක් ප්‍රධාන කාර්ය ක්‍රමවේදයකි. එය මධ්‍යස්ථභාවය සහ අපක්ෂපාතීත්ව මූලධර්ම තුළින් ඍජුව පැන නැගුණු, දීර්ඝ කාලීන ICRC ප්‍රතිපත්තියක් හා පරිචයක් වේ. එමඟින් ගැටුම් පවතින ප්‍රදේශවලට, රඳවා තබා ගැනීම සිදු කරන ස්ථානවලට, සන්නද්ධ ගැටුම් වින්දිතයින් වෙත සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී තත්ව වෙත ප්‍රවේශ වීම සහ එහි අර්ථලාභීන්ගේ හා කාර්ය මණ්ඩලවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සන්නද්ධ ගැටුමක පාර්ශවයන් සහ අනෙකුත් කොටස්කරුවන් සමඟ විචාරශීලී සංවාදයක් ස්ථාපනය කිරීමටත් පවත්වාගෙන යාමටත් ICRC ට අවකාශ සලසයි. ද්විපාර්ශවීය රහස්‍යතා නියෝජන වනාහි අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් හෝ ප්‍රචණ්ඩකාරී තත්වවල දී පුද්ගලයින්ට ආරක්ෂාව සලසන අනෙකුත් මූලික රීති උල්ලංඝනයන් මැඩ පැවැත්වීමට හෝ එවැනි උල්ලංඝනයන් දිගින් දිගටම සිදුවීම වැළැක්වීමට ICRC බහුලව භාවිතා කරන ක්‍රමයයි. කෙසේ වුවද, මෙම ක්‍රමවේදය අනෙක් තත්වයන්ට අනුපූරක වේ. විශේෂයෙන්ම, ICRC වෙත අන්තර්ජාතික මානුෂවාදී නීතියේ යම් නිශ්චිත උල්ලංඝනයන් සම්බන්ධව හෙළා දැකීමේ මහජනප්‍රකාශයක් නිකුත් කිරීමට අයිතිය ඇති අතර, එසේ කළ හැක්කේ එම උල්ලංඝනයන්: (1) බරපතළ සහ නැවත නැවත සිදුව ඇත්නම් හෝ නැවත සිදු වීමට ඉඩ ඇත්නම්; (2) නියෝජිතයින් විසින් මෙම උල්ලංඝනයන් සිදු වීම අත්දැක ඇත්නම්, හෝ විශ්වාස කළ හැකි හා සත්‍යාපනය කළ හැකි මාර්ගයන් මඟින් එම උල්ලංඝනයන්ගේ පැවැත්ම සහ ප්‍රමාණය ස්ථාපනය කර ඇත්නම්; (3) ද්විපාර්ශවීය රහස්‍යතා නියෝජන සහ මානුෂීය සේවා කාර්ය ප්‍රයත්න (එනම්, අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් සිදු කරන ගැටුම් පාර්ශවයන්ගේ ක්‍රියාකලාපයට බලපෑම් කිරීම සඳහා තෙවන පාර්ශවයන් කැඳවීම) උල්ලංඝන මැඩ පැවැත්වීම සඳහා අසමත්ව ඇත්නම්; සහ (4) එවැනි ප්‍රසිද්ධ කිරීමක් බලපෑමටලත් හෝ තර්ජනයටලත් පුද්ගලයින්ගේ හෝ ජනයාගේ යහපත පිණිස හේතුවන්නේ නම්ය.

## අන්තර්ජාතික මානුෂවාදී නීතියේ වර්ධනය

රාජ්‍යයන් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය වර්ධනය කරන ගිවිසුම් සම්මත කරයි. ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාර ව්‍යවස්ථාව යටතේ අන්තර්ජාතික මානුෂවාදී නීතිය සඳහා "ඕනෑම ආකාරයේ වර්ධනයක් සූදානම් කිරීම" සඳහා ද ICRC ට වරයක් පවතී. මෙම වරය ක්‍රියාවෙහි යොදවමින්, ICRC විසින් සැලකිය යුතු පරිදි, රාජ්‍යතාන්ත්‍රික සමුළුවල දී ඉදිරිපත් කිරීම සඳහා කෙටුම්පත් ලේඛන සකස් කරයි. නිදසුනක් ලෙස, ජිනීවා සම්මුතිවල මුල් කෙටුම්පත් රාජ්‍යයන් සමඟ පැවති උපදේශන සාකච්ඡාවලින් අනතුරුව සකස් කළ ඒවා අතර, ඉදිරිපත් කිරීමෙන් පසු වැඩිදුරටත් සාකච්ඡා කොට, වෙනස් කොට අවසානයේ දී රාජ්‍යතාන්ත්‍රික සමුළුවල දී සම්මත කරගත්තකි. තවද, ICRC විසින් නව නීති හෝ අන්තර්ජාතික මානුෂවාදී නීතිය ශක්තිමත් කිරීම පිළිබඳව එකඟතාවයකට ළඟාවීමේ හැකියාව නිර්ණය කිරීමේ අදහසින් රාජ්‍ය සහ උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශව සමඟ උපදේශන සැසි සංවිධානය කරයි. නිදසුනක් ලෙස, 31 වෙනි රතු කුරුස සහ රතු අඩසඳ ජාත්‍යන්තර සමුළුව සහ 1 වන යෝජනා සම්මතය සම්මත කිරීමෙන්: සන්නද්ධ ගැටුම්වල වින්දිතයින් සඳහා නෛතික ආරක්ෂණය ශක්තිමත් කිරීමෙන් (බලන්න: http://www.icrc.org/eng/resources/documents/resolution/31-international-conference-resolution-1-2011.htm) පසු, ICRC විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රඳවා තබා ගැනීමට අදාළ ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සහ අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූලව කටයුතු කිරීම ශක්තිමත් කිරීම සඳහා රාජ්‍යයන් සමඟ උපදේශනයන් පවත්වා තිබේ (10 සහ 19 වන ප්‍රශ්න බලන්න).





C. Scott/ICRC

# 21. සැකකාර යුද අපරාධකරුවන්ට එරෙහිව ජාත්‍යන්තර නීතිය යටතේ නඩු පැවරීම සිදු වන්නේ කෙසේද?

යුද අපරාධ යනු අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් අතරතුර දී සිදු කරන බරපතළ අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන්ය. යුද අපරාධ නිර්වචන හෝ ලැයිස්තු, දෙවන ලෝක යුද්ධයෙන් පසුව නියුරම්බර්ග්හි දී පිහිටවනු ලැබූ ජාත්‍යන්තර යුද අධිකරණ ව්‍යවස්ථාව, ජිනීවා සම්මුති සහ ඒවායේ අතිරේක සන්ධාන, පූර්ව යුගොස්ලෝවියාව සහ රුවන්ඩාව පිළිබඳ ජාත්‍යන්තර යුද අධිකරණවල ව්‍යවස්ථා සහ නඩු නීතිය, ජාත්‍යන්තර අපරාධ අධිකරණය පිළිබඳ රෝම ව්‍යවස්ථාව, සහ අනෙකුත් ජාත්‍යන්තර සහ 'මිශ්‍ර' අධිකරණ ඇතුළු විවිධ නෛතික ලේඛන තුළින් සොයා ගත හැකිය.

රාජ්‍යයන් විසින් ගිවිසුම් ආකෘතියෙන් සකසන ලද, යුද අපරාධ ලැයිස්තුවක් ජාත්‍යන්තර අපරාධ අධිකරණ ව්‍යවස්ථාවේ 8 වන වගන්තිය තුළ ඇතුළත් වේ; එය රාජ්‍යයන් විසින් සාමාන්‍යයෙන් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය යටතේ බරපතළ අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් ලෙස සලකන ක්‍රියා සඳහා ද ප්‍රයෝජනවත් මඟපෙන්වීමක් සපයයි. විවිධ රටවල අණපනත් සහ නඩු නීති තුළද යුද අපරාධ සඳහා නිර්වචන ඇතුළත් වේ.

## යුද අපරාධ යනු මොනවාද?

යුද අපරාධ ලෙස වර්ග කළ ක්‍රියා අතර පහත දැක්වෙන ක්‍රියා වේ:

- ආරක්ෂිත පුද්ගලයෙක්ව හිතාමතා ඝාතනය කිරීම (නිද. තුවාල හෝ රෝගී වූ යුද භටයෙකු, යුද සිරකරුවෙකු, සිවිල් වැසියෙකු)
- ආරක්ෂිත පුද්ගලයෙකුට වධහිංසා පමුණුවීම හෝ අමානුෂීය සැලකීම
- ආරක්ෂිත පුද්ගලයෙකුට හිතාමතා බරපතළ පීඩා හෝ බරපතළ තුවාල සිදු කිරීම
- සිවිල් ජනයා ඉලක්ක කර ප්‍රහාර එල්ල කිරීම
- නීතිවිරෝධී ලෙස රටින් නෙරපීම හෝ මාරු කිරීම
- තහනම් කළ අවි හෝ යුද විධික්‍රම භාවිතය
- රතු කුරුසය හෝ රතු අඩසඳ ලාංඡන හෝ අනෙකුත් ආරක්ෂිත ලකුණු අවභාවිතා කිරීම
- සතුරු ජාතියකට හෝ හමුදාවකට අයත් පුද්ගලයින් විශ්වාසභංග කිරීම මඟින් තුවාල කිරීම හෝ ඝාතනය කිරීම
- පොදු හෝ පුද්ගලික දේපළ කොල්ලකෑම

අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම් තුළ බරපතළ අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් අපරාධ ලෙස නම් කිරීම සඳහා විධිවිධාන ඇතුළත් නොවුණද, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය තුළ දැක්වෙන යුද අපරාධ සංකල්පය මඟින් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ සිදු කරන බරපතළ උල්ලංඝනයන් ද ආවරණය කෙරෙන බව අද වන විට පිළිගෙන තිබේ. (චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ICRC අධ්‍යයනයේ දැක්වෙන 156 වන රීතිය සහ රෝම ව්‍යවස්ථාවේ 8 වන වගන්තිය, 2 c) d) e) හා f) ඡේදය බලන්න.)

## ජනසංහාර හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ මොනවාද?

අන්තර්ජාතික නීතිය මඟින් ජනසංහාර හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ වැනි අනෙකුත් වර්ගවල අපරාධ හඳුනාගනියි. මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ යනු ප්‍රහාරය පිළිබඳ දැනුම ඇතිව, සිවිල් ජනයා ඉලක්ක කරමින් එල්ල කරන විහිදුණු හෝ පද්ධතිගත ප්‍රහාරයක කොටසක් ලෙස සිදු කරන අත්‍යවශ්‍යයෙන්ම, සාහසික ක්‍රියා වේ. එවැනි සාහසික ක්‍රියා සඳහා නිදසුන් ලෙස, මිනී මැරීම, සමූහ ඝාතන, වහල්භාවයට පත් කිරීම, රටින් නෙරපීම, සිරගත කිරීම, වධහිංසා පමුණුවීම, ස්ත්‍රී දූෂණය සහ විවිධ හේතු මත වධ දීම දැක්විය හැකිය. ජාත්‍යන්තර අපරාධ අධිකරණය යටතේ ජනසංහාර අපරාධය මඟින් “ජනවර්ගයක්, ජාතියක්

හෝ ආගමික කණ්ඩායමක් වැනි ජන කණ්ඩායමක්, සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් විනාශ කිරීමේ චේතනාවෙන් යුතුව සිදු කළ ක්‍රියා" වැනි විවිධ ක්‍රියා ආවරණය කරයි. ප්‍රශ්නගත ක්‍රියා පහත පරිදි වේ: අ) කණ්ඩායමේ සාමාජිකයින් ඝාතනය කිරීම; ආ) කණ්ඩායමේ සාමාජිකයින්ට බරපතළ ශාරීරික හෝ මානසික හානි ඇති කිරීම; ඇ) හිතාමතා සාමූහික ජීවන කොන්දේසිවලට හානි පමුණුවීම මඟින් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් ලෙස අපේක්ෂිත භෞතික විනාශය සිදු කිරීම; ඈ) කණ්ඩායම තුළ උපත් වැළැක්වීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග පැනවීම; ඉ) කණ්ඩායමේ දරුවන් බලහත්කාරයෙන් වෙනත් කණ්ඩායමකට මාරු කිරීම.

## රාජ්‍ය බැඳීම් : සැකකාර යුද අපරාධකරුවන්ට එරෙහි නඩු පැවරීම හෝ උදර්පණය

ජිනීවා සම්මුති සහ පළමු අතිරේක සන්ධානයට පාර්ශවයක් වීම මඟින් රාජ්‍යයන් විසින් ජිනීවා සම්මුති හා අතිරේක සන්ධානයට එරෙහි 'බරපතළ උල්ලංඝනයන්' ලෙස හඳුන්වන අපරාධ සඳහා වරදකාරී පුද්ගලයින්ට දඬුවම් කිරීමට අවශ්‍ය නීති පැනවීමට එකඟ වේ. තවද, බරපතළ උල්ලංඝනයක් කළ බවට සැක කරන ඕනෑම පුද්ගලයෙකුට තම අධිකරණ මඟින් නඩු පැවරීමට හෝ වෙනත් රාජ්‍යයක පවතින නඩු විභාගයක් සඳහා එම පුද්ගලයාව බාර දීමට ද රාජ්‍යයන් බැඳේ.

සාමාන්‍යයෙන්, රාජ්‍යයක අපරාධ නීති තම දේශ සීමාව තුළ හෝ තම ජාතිකයින් විසින් සිදු කළ අපරාධ සඳහා පමණක් අදාළ වන නමුදු, රාජ්‍යයන් විසින් සිය දේශ සීමාවට පිටතින් සිදු කළ අපරාධ විභාග කිරීමට තම අධිකරණයන්ට හැකියාව ලැබෙන ආකාරයේ නීති වැඩි වශයෙන් සම්මත කිරීම සිදු කරයි. බරපතළ අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනය සිදු කළ තැනැත්තන් සෙවීමටත් අදාළ පුද්ගලයාගේ ජාතිකත්වය හෝ වරද සිදු කළ ස්ථානය නොතකා, ඔහුට දඬුවම් දීමටත් අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ රාජ්‍යයන් බැඳේ. විශ්වීය අධිකරණ බලය ලෙස සලකන මෙම මූලධර්මය, බරපතළ උල්ලංඝනයන් ඵලදායී පරිදි මැඩ පැවැත්වීම තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍යවේ. විශ්වීය අධිකරණ බලය මඟින් එක් රාජ්‍යයක අධිකරණයක් ඔස්සේ වෙනත් රාජ්‍යයක් තුළ දී අන්තර්ජාතික අපරාධ සිදු කළ පුද්ගලයින්ට එරෙහිව රාජ්‍ය නීති මඟින් නඩු පැවරීමට අවශ්‍ය පදනම අන්තර්ජාතික නීතියට ලබා දේ.

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ප්‍රධාන උල්ලංඝනයන් - එනම්, යුද අපරාධ ඇතුළත් නමුත් බරපතළ උල්ලංඝනයන් සඳහා පමණක් සීමා නොවන - සඳහා අපරාධ නඩු කටයුතු, සමහර අවස්ථානුගත අවස්ථාවල දී දේශීය අධිකාරීන් විසින් ගෙන ආ යුතුය. චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ICRC අධ්‍යයනය මඟින් තහවුරු කරනුයේ රාජ්‍යයන්හට සිය ජාතිකයින් හෝ සන්නද්ධ බලකා, හෝ සිය දේශ සීමාව තුළ අනෙකෙකු විසින් හෝ සිදු කළ යුද අපරාධ හෝ තමන් සතුව අධිකරණ බලය පවතින අනෙකුත් යුද අපරාධ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට බැඳීමක් ඇති බවයි. එමෙන්ම සුදුසුවන්නේ නම්, යුද අපරාධ සම්බන්ධව සැක කරන පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීමට ද ඔවුන්ට බැඳීමක් පවතී.

## ජාත්‍යන්තර අධිකරණවල කාර්යභාර්ය කුමක්ද?

රෝම ව්‍යවස්ථාව යටතේ රාජ්‍යයන් විසින් ස්ථාපනය කළ, ජාත්‍යන්තර අපරාධ අධිකරණය 2002 ජූලි 1 වැනිදා බලාත්මක විණි. එමගින්, යුද අපරාධවලට අදාළව දණ්ඩන මුක්තිය, ජනසංහාර, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ ආක්‍රමණයට අදාළ අපරාධ අවසන් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගේ අරගලයේ කඩඉම් ලක්ෂයක් නියෝජනය කරයි. සැකකාර යුද අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීමේ මූලික වගකීම රාජ්‍යයන් සතු වුවද, දේශීය අධිකරණ විසින් එසේ කිරීමට අකැමැති වන විට දී හෝ එසේ කිරීමට අපොහොසත් වන විට දී, සිය අධිකරණ බලය තහවුරු කිරීමට අවශ්‍ය නිර්ණායක ජාත්‍යන්තර අපරාධ අධිකරණය සපුරන්නේ නම් මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ඊට හැකිවේ.

ජාත්‍යන්තර අපරාධ අධිකරණයට පෙර, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලය විසින් 1993 දී සහ 1994 දී පූර්ව යුගොස්ලෝවියාව සහ රුවන්ඩාව සඳහා එම රටවල පැවති යුද්ධ අතරතුර දී යුද අපරාධ සඳහා සැකකරන පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීමට ජාත්‍යන්තර අපරාධ අධිකරණ ( ICTY සහ ICTR ලෙස ප්‍රසිද්ධ) පිහිටුවන ලදි. 2010 දෙසැම්බර් 22 දී ආරක්ෂක කවුන්සිලය විසින් ස්ථාපිත කළ ජාත්‍යන්තර අපරාධ අධිකරණ යාන්ත්‍රණය, ඔවුනගේ උරුමය පවත්වා ගෙන යමින් තම වරය අවසන් කළ ICTY සහ ICTR විසින් සිදු කළ සිය අත්‍යවශ්‍ය කාර්යයන් තවදුරටත් සිදු කරගෙන යාම වෙනුවෙන් බලගන්වන ලදි.

කාම්බෝජය, නැගෙනහිර ටිමෝරය, සහ සියෙරා ලියෝන් වැනි රාජ්‍ය තුළ ස්ථාපිත ප්‍රමාණයෙන් ඉහළ යන 'මිශ්‍ර' හෝ විශේෂ අධිකරණ මඟින් ද යුද අපරාධ මර්දනය සිදු කරයි. මිශ්‍ර අධිකරණ සතුව දේශීය සහ අන්තර්ජාතික යන අධිකරණ බල ද්විත්වයම පවතී.

## අන්තර්ජාතික අපරාධ සිදු කරන්නේ ඇයි?

මෙම ප්‍රශ්නය විවිධාකාරයෙන් ආමන්ත්‍රණය කළ හැකිය. ඇතමෙකු ප්‍රකාශ කරන්නේ නීතිය පිළිබඳ නොදැනුවත්භාවය ඊට ප්‍රබලම හේතුව බවයි, එය යුද්ධයේ ස්වභාවික ප්‍රතිවිපාකයක් ලෙසත් හෝ දඬුවම් පමුණුවීම සඳහා ඵලදායී කේන්ද්‍රීය පද්ධතියක් අන්තර්ජාතික නීතිය (අන්තර්ජාතික මානුෂවාදී නීතියද ඇතුළුව) තුළ නොමැති වීමත් ලෙස තවකෙකු දකියි. යථාර්තය සැලකූ කළ, බලාත්මකව පවතින්නේ දේශීය හෝ අන්තර්ජාතික අධිකරණ බලය ද යන්න නොතකා යුද සහ සාම කාලවලදී නීති උල්ලංඝනය කිරීම් මෙන්ම අපරාධ සිදු කිරීම්ද දක්නට ලැබේ. එසේ වුවද, අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන්හි යථාර්තයට යටත්වී, මෙම නීති පද්ධතිය වෙත වඩා ඉහළ ගරුත්වයක් අත්පත් කරගැනීම සඳහා වන සියලු කාර්යයන් නවතා දමා, සන්නද්ධ ගැටුම්වල වින්දිතයින්ව ඔවුනගේ ඉරණම වෙත භාරදී සිටීම විකල්පයක් නොවේ. උල්ලංඝනයන් නිරන්තරයෙන් හෙළා දකිමින්, ඒවා වැළැක්වීමට පියවර ගනිමින් උල්ලංඝනයන් සිදු කරන්නන්ට දඬුවම් ලබාදිය යුත්තේ එබැවිනි. දේශීය මට්ටමෙන් වේවා අන්තර්ජාතික මට්ටමෙන් වේවා යුද අපරාධ මර්දනය, අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාවට නැංවීමෙහිලා ඉතා වැදගත් ක්‍රමවේදයකි.

## මෙහෙවර

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) යනු සන්නද්ධ ගැටුම් සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී වාතාවරණයන්හි වින්දිතයින්ගේ ජීවිත හා ගරුත්වය ආරක්ෂා කිරීම මෙන්ම ඔවුනට සහය සැපයීම සිය පරම මානුෂීය මෙහෙවර කරගත් අපක්ෂපාතී, මධ්‍යස්ථ සහ ස්වාධීන සංවිධානයකි. මානුෂවාදී නීතිය සහ විශ්වීය මානුෂවාදී මූලධර්ම ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම මඟින් පීඩා විඳීම වැළැක්වීම සඳහා ද ICRC ප්‍රයත්න දරයි. 1863 වර්ෂයේ දී පිහිටුවන ලද ICRC, ජිනීවා සම්මුති සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරයේ මූලාරම්භයයි. එමඟින්, සන්නද්ධ ගැටුම් සහ අනෙකුත් ප්‍රචණ්ඩකාරී වාතාවරණයන් තුළ ව්‍යාපාරය විසින් සිදු කරන අන්තර්ජාතික ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය සිදු කරයි.


facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 250 33 46
ෆැක්ස්: +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ්: www.icrc.org

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්, වව්නියාව
දුරකථන: +94 (0)24 222 28 55
ෆැක්ස්: +94 (0)24 222 25 37

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර, කොතුකුලම්,
පිල්ලයාරඩි මඩකලපුව
දුරකථන: +94 (0)65 222 70 70


ICRC

© ICRC, November 2021

1732/259 11.2021 250 පිටකවර ඡායාරූපය : B.Heger/ICRC